# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2009 අංක 8 දරන මෝටර් වාහන (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2009 මාර්තු මස 11 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2009 මාර්තු මස 13 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ : රු. 96.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 22.50 යි.**

## 2009 අංක 8 දරන මෝටර් වාහන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2009 මාර්තු මස 11 වන දින]

එල්. ඩී.—ඕ. 1/2007

**(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2009 අංක 8 දරන මෝටර් වාහන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනත පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 203 වන අධිකාරය සංශෝධනය කිරීම.

(1) ප්‍රධාන ප්‍රඥප්තියේ "කොමසාරිස්වරයා" යන වචනය යෙදී ඇති කවර හෝ ස්ථානයක දී, ඒ වෙනුවට "කොමසාරිස් ජනරාල්වරයා" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ප්‍රධාන ප්‍රඥප්තියේ "අකුශලතා ලකුණු" යන වචන යෙදී ඇති කවර හෝ ස්ථානයක දී, ඒ වෙනුවට "රියදුරු අභිවෘද්ධි ලකුණු" යන වචන ආදේශ කිරීමෙන්;

(3) ප්‍රධාන ප්‍රඥප්තියේ "මහා මාර්ගය" යන වචන යෙදී ඇති කවර හෝ ස්ථානයක දී , ඒ වෙනුවට "මාර්ගය" යන වචනය ආදේශ කිරීමෙන්; සහ

(4) ප්‍රධාන ප්‍රඥප්තියේ "ලොරිය" යන වචනය යෙදී ඇති කවර හෝ ස්ථානයක දී, ඒ වෙනුවට "මෝටර් ලොරිය" යන වචන ආදේශ කිරීමෙන්.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 1 වන කොටසේ ශීර්ෂය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන ශීර්ෂය ආදේශ කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 1 වන කොටසේ ශීර්ෂය ප්‍රතියෝජන කිරීම.

"මෝටර් වාහන ලියාපදිංචි කිරීම, ඒවායේ සන්තකය දැරීම සහ පාවිච්චි කිරීම"

2—PL 003291—3,500 (2008/10)

ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එහි (2) සහ (2අ) උපවගන්ති ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උප වගන්තිය ආදේශ කිරීමෙන්:—

"(2) වෙළෙන්දකු හෝ නිෂ්පාදකයකු විසින් විකිණීමේ කාර්ය සඳහා ලියාපදිංචි නොකළ වාහනයක සන්තකය දැරීම, වාහනය නොවිකුණන තාක්කල් සහ III වන කොටස යටතේ නිකුත් කරන ලද වෙළෙන්දකුගේ හෝ නිෂ්පාදකයකුගේ බලපත්‍රයක අධිකාරය යටතේ හැර, එම වාහනය යම් මාර්ගයක පාවිච්චි කරනු නොලබන තාක් කල් (1) වන උපවගන්තිය උල්ලංඝනය කිරීමක් ලෙස සලකනු නොලැබිය යුතු ය.".

(2) එම වගන්තියේ (5) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:—

"(5) ශ්‍රී ලංකාවට ආනයන කරනු ලැබූ මෝටර් වාහනයක් රේගු පරිශ්‍රයෙන් ඉවත් කිරීමේ කාර්ය සඳහා සහ ඒ අතරතුර පමණක් මාර්ගයක පාවිච්චි කරනු ලැබීම හෝ යම් උපකරණයක් සවි කිරීමේ කාර්ය සඳහා හෝ පරීක්ෂා කිරීමේ හෝ ලියාපදිංචි කිරීමේ කාර්ය සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලබන යම් ස්ථානයකට හෝ යම් ස්ථානයක සිට ධාවනය කරනු ලබන අතරතුර, එම මෝටර් වාහනය පාවිච්චි කිරීම සිදු කරනු ලබන්නේ වෙළෙන්දකුගේ බලපත්‍රයක අධිකාරය යටතේ හෝ නිකුත් කරනු ලබන දින හතක කාලයක් සඳහා වලංගු වන තාවකාලික අවසර පත්‍රයක අධිකාරය යටතේ නම්, එම වාහනය පාවිච්චි කිරීම (1) වන උප වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කිරීමක් නොවන ලෙස සලකනු ලැබිය යුතු ය".

(3) එහි (6) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්;

(4) එහි (9) වන උපවගන්තියට ඉක්බිතිවම (10) වන උපවගන්තිය ලෙස බලාත්මක විය යුතු පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන්:—

"(10) මේ වගන්තියේ (1) වන හෝ (5) වන උපවගන්තිවල විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තෙක් වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දෙදහස් පන්

සියයකට නොඅඩු සහ රුපියල් පන් දහසකට නොවැඩි දඩයකට ද, දෙවන වරට වරදකරු කිරීමේ දී රුපියල් පන් දහසකට නොඅඩු සහ රුපියල් දස දහසකට නොවැඩි දඩයකට ද, තුන්වන වරට වරදකරු කිරීමේ දී හෝ ඊට පසු අවස්ථාවක වරදකරු කරනු ලබන විට, රුපියල් දස දහසකට නොඅඩු සහ රුපියල් පහළොස් දහසකට නොවැඩි දඩයකට හෝ ඔහු යටත් විය යුතු ය".

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 2අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:— ප්‍රධාන ප්‍රඥප්තියට අලුතින් 2අ වගන්තිය ඇතුළත් කිරීම.

"නීති විරෝධී ලෙස සකස් කරන ලද වාහන ආදිය භාවිත නොකළ යුතු බව."

2අ. (1) කිසිම තැනැත්තකු විසින්—

(අ) නීති විරෝධී ලෙස හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරනු ලැබූ මූලාකෘතියකට අනනුකූල ලෙස, නිෂ්පාදනය කරන ලද, එකලස් කරන ලද, සකස් කරන ලද, අලුතින් නිර්මාණය කරන ලද, අනුවර්තනය කරන ලද, විකරණය කරන ලද හෝ වාහනයේ නිර්මාණය වෙනස් කර ඇති මෝටර් වාහනයක්;

(ආ) අදාළ සමාගමේ නව කොටස් යොදා එකලස් කිරීම හැර අන්‍යාකාරයකින් එකලස් කර ඇති හෝ එම කොටස්වල නිෂ්පාදකයාගේ අවසරය නොමැතිව එකලස් කර ඇති මෝටර් වාහනයක්;

(ඇ) කාර්මික දෝෂ සහිත මෝටර් වාහනයක්;

(ඈ) ආරක්ෂාව පිළිබඳ නියමිත ප්‍රමිතිවලට අනුකූල නොවන මෝටර් වාහනයක්;

(ඉ) සොරකම් කරන ලද මෝටර් වාහනයක්;

(ඊ) ව්‍යාජ අනන්‍යතාවයක් සහිත මෝටර් වාහනයක්;

(ඌ) වාහනයේ චැසි අංකය අනවසරයෙන් වෙනස් කර ඇති මෝටර් වාහනයක්; හෝ

(ඌෟ) කොමසාරිස් ජනරාල්වරයාගේ පූර්ව ලිඛිත අවසරය නොමැතිව නිෂ්පාදනය කර ඇති, එකලස් කර ඇති, සකස් කර ඇති, අනුවර්තනය කර ඇති, විකරණය කර ඇති හෝ වාහනයේ නිර්මාණය යම් ආකාරයකට වෙනස් කර ඇති යම් මෝටර් වාහනයක්,

ඒ බව දැන දැනම පාවිච්චි නොකළ යුතු ය.

(2) 2අ වගන්තියේ විධිවිධාන කඩ කරන තැනැත්තෙක් වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කිරීමේ දී රුපියල් පනස් දහසකට නොඅඩු සහ රුපියල් එක් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ එක් මාසයක කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකට ම හෝ ඔහු යටත් විය යුතු අතර, දෙවන වර වරදකරු කිරීමේ දී රුපියල් එක් ලක්ෂයකට නොඅඩු සහ රුපියල් දෙලක්ෂයකට නොවැඩි දඩයකට හෝ මාස දෙකක කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ තුන්වන වර හෝ පසු වාරයක දී වරදකරු කිරීමේ දී තුන්ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ මාස හයකට වැඩි නොවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම සහ වාහනය රාජසන්තක කිරීමට ඔහු යටත් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එහි (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:—

"(1) කිසියම් මෝටර් වාහනයක් අයත් වන්නේ යම් පන්තියකට ද නැතහොත් විස්තරයකට ද, ඒ පන්තියට

හෝ විස්තරයට අයත් ඒ මෝටර් වාහනවල නිර්මාණය, බර, මාන සහ උපකරණ පිළිබඳව මේ පනතේ විධිවිධාන වලට සහ මේ පනත යටතේ සාදන ලද නියෝගවලට ඒ වාහනය අනුකූල වන්නේ නම් මිස එම මෝටර් වාහනය ලියාපදිංචි කරනු නොලැබිය යුතු ය.".

(2) එහි (2) වන උපවගන්තියේ "මෙට්‍රික් ටොන් දෙකහමාර ඉක්මවයි නම්" යන වචන වෙනුවට "කිලෝග්‍රෑම් හාර දහස් පන්සියයක් ඉක්මවයි නම්" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) එහි (1) වන උපවගන්තියට ඉක්බිතිව ම එහි (2), (3), (4) සහ (5) වන උපවගන්ති වශයෙන් බලාත්මක විය යුතු පහත දැක්වෙන උපවගන්ති එකතු කිරීමෙන්:—

"(2) (අ) යම් මෝටර් වාහනයක්—

(i) නීති විරෝධී ලෙස හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරන මූලාකෘතියකට අනනුකූලව නිෂ්පාදනය කර ඇති බවට, එකලස් කර ඇති බවට, සකස් කර ඇති බවට, අලුතින් නිර්මාණය කර ඇති බවට, අනුවර්තනය කර ඇති බවට, විකරණය කර ඇති බවට හෝ එහි නිර්මාණය වෙනස් කර ඇති බවට;

(ii) අදාළ සමාගමේ නව කොටස් යොදා එකලස් කිරීම හැර අන්‍යාකාරයකින් එකලස් කර ඇති හෝ එම කොටස්වල නිෂ්පාදකයාගේ අවසරය නොමැතිව එකලස් කර ඇති හෝ මෝටර් වාහනයක් බවට;

(iii) කාර්මික දෝෂ සහිත මෝටර් වාහනයක් බවට;

(iv) ආරක්ෂාව පිළිබඳ නියමිත ප්‍රමිතිවලට අනුකූල නොවන බවට;

(v) සොරකම් කරන ලද මෝටර් වාහනයක් බවට;

(vi) ව්‍යාජ හෝ සැක සහිත අනන්‍යතාවක් සහිත මෝටර් වාහනයක් බවට;

(vii) වැසි අංකය අනවසරයෙන් වෙනස් කර ඇති මෝටර් වාහනයක් බවට;

(viii) පූර්ව ලියාපදිංචියක් තිබුණේ නම්, ඒ පිළිබඳ විස්තර ඉදිරිපත් කිරීමට එම වාහනය ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කර ඇති ඉල්ලුම්කරු අපොහොසත් වී ඇති බවට;

(ix) එම වාහනය ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයේ, ඉල්ලුම්කරු විසින් වැරදි තොරතුරු ඉදිරිපත් කර ඇති බවට; හෝ

(x) වාහනය ව්‍යාජ ලේඛන සහිතව ආනයනය කර ඇති බවට හෝ ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයෙහි ව්‍යාජ අත්සනක් යොදා ඇති බවට හෝ එම ඉල්ලුම් පත්‍රය සමඟ ව්‍යාජ ලේඛන ඉදිරිපත් කර ඇති බවට,

විශ්වාස කිරීමට කොමසාරිස් ජනරාල්වරයාට හේතු ඇත්නම්,

(ආ) එම මෝටර් වාහනයේ ලක්ෂණ:—

(i) ඉල්ලුම් පත්‍රයේ අන්තර්ගත විස්තරවලට අනුකූල නොවන්නේ නම්;

(ii) කොමසාරිස් ජනරාල්වරයාගේ මතය අනුව, එය මාර්ගයේ ධාවනය කිරීමට නුසුදුසු නම්, හෝ එම මෝටර් වාහනයේ සැලැස්ම, නිර්මාණය හෝ එහි යම් තත්වයක් හෝ එහි ඇති යම් උපකරණයක් නිසා එය මේ පනතේ විධිවිධානවලට අනුකූල නොවන්නේ නම්;

(iii) එය ආනයනය කිරීම සඳහා කොමසාරිස් ජනරාල්වරයාගේ පූර්ව ලිඛිත අනුමතය අවශ්‍ය වන්නේ නම් සහ එම අනුමතය ලබා නොගෙන ආනයනය කරනු ලැබ ඇත්නම්;

(iv) කොමසාරිස් ජනරාල්වරයාගේ පූර්ව ලිඛිත අවසරය නොමැතිව නිෂ්පාදනය කර, එකලස් කර, සකස් කර, අනුවර්තනය කර, විකරණය කර හෝ යම් ආකාරයකින් එහි නිර්මාණය වෙනස් කර ඇත්නම්,

කොමසාරිස් ජනරාල්වරයා විසින් එම මෝටර් වාහනය ලියාපදිංචි කරනු නොලැබිය යුතු ය.

(3) (අ) හෝ (ආ) ඡේදය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් අනාවරණය කර ගන්නා ලද කරුණු හේතුවෙන් මෝටර් වාහනයක් ලියාපදිංචි නොකිරීමට කොමසාරිස් ජනරාල්වරයා විසින් ගන්නා ලද තීරණයක් අවසානාත්මක විය යුතු ය.

(4) වයස අවුරුදු දහ අටට අඩු කිසිම තැනැත්තකු මෝටර් වාහනයක අයිතිකරු ලෙස ලියාපදිංචි කරනු නොලැබිය යුතු ය:

එසේ වුව ද, වයස අවුරුදු දහ අටට අඩු තැනැත්තෙක් මෝටර් වාහනයක අර්ථලාභී අයිතිකරු ලෙස ලියාපදිංචි කරනු ලැබිය හැකි අතර, එවැනි අවස්ථාවක දී, එම තැනැත්තාගේ දෙමව්පියන්ගෙන් කෙනෙකු හෝ භාරකරු එම වාහනයේ අයිතිකරු ලෙස ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

(5) ව්‍යාජ අත්සනක් ඇතුළත් වන හෝ ව්‍යාජ ලේඛන සමඟ ඉදිරිපත් කරනු ලබන වාහනයක් ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරන යම් තැනැත්තෙක් වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කිරීමේ දී රුපියල් දසදහසකට නොඅඩු සහ රුපියල් පහළොස් දහසකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය.".

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ "මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රයක්" යන වචන වෙනුවට "මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රයක් දරන්නා හෝ" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(අ) අවස්ථාවෝචිත පරිදි මෝටර් සයිකලයක්, සැහැල්ලු මෝටර් සයිකලයක්, මෝටර් රථයක්, ද්විත්ව කාර්ය වාහනයක්, මෝටර් ට්‍රයිසිකලයක්, මෝටර් ට්‍රයිසිකල් වෑන් රථයක්, මෝටර් ලොරියක්, සැහැල්ලු මෝටර් ලොරියක්, බර මෝටර් ලොරියක්, මෝටර් කෝච් රථයක්, සැහැල්ලු මෝටර් කෝච් රථයක්, බර මෝටර් කෝච් රථයක්, ඉඩම් වාහනයක්, අත්ට්‍රැක්ටරයක්,

විශේෂ කාර්ය වාහනයක්, ගිලන් රථයක්, මෝටර් අවමංගල්‍ය රථයක්, වෙනස් හැකියාවන් ඇති පුද්ගලයන් විසින් පදවනු ලබන මෝටර් රථයක් එලෙස ලියාපදිංචි කරනු ලැබිය යුතු ය;".

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:—

"(2) මෝටර් වාහනයක ලියාපදිංචි අයිතිකරු විසින්—

(අ) මෝටර් වාහනයකට අදාළ ලේඛනවල එම මෝටර් වාහනයකට අදාළ යම් සටහනක නිරවද්‍යතාව කෙරෙහි බලපාන්නා වූ යම් කරුණක් හෝ සිද්ධියක් කොමසාරිස් ජනරාල්වරයා වෙත නිශ්චිත ආකෘති පත්‍රයකින් නොපමාව දන්වා සිටිය යුතු අතර, ඒ අවස්ථාවේ දී ම මෝටර් වාහනයේ ලියාපදිංචි කිරීමේ සහතිකය සහ නියමිත ගාස්තුව ද කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කිරීම හෝ භාර දීම කළ යුතු ය; සහ

(ආ) මෝටර් වාහනයක ලියාපදිංචි කිරීමේ සහතිකයේ නිශ්චිතව දැක්වෙන පන්තිය, සම්පූර්ණ දිග, පළල, බාහිර පෙනුම, "වීල් බේස්" ප්‍රමාණය හෝ ආසන ප්‍රමාණය, වෙනස් කරන පරිදි වූ වෙනසක් ඒ මෝටර් වාහනයේ කිරීමට ඔහු අදහස් කරන අවස්ථාවක කොමසාරිස් ජනරාල්වරයාගේ පූර්ව අවසරය ලබා ගත යුතු ය.".

(2) එම වගන්තියේ (2) වන උප වගන්තියට ඉක්බිතිව ම එහි (3) වන සහ (4) වන උපවගන්ති ලෙස බලාත්මක විය යුතු පහත දැක්වෙන උපවගන්ති එකතු කිරීමෙන්:—

"(3) මෝටර් වාහනයකට අදාළ ලේඛනවල තමාට අදාළ යම් සටහනක නිරවද්‍යතාව කෙරෙහි බලපාන්නා වූ යම් කරුණක් හෝ සිද්ධියක් කොමසාරිස් ජනරාල්වරයා වෙත නිශ්චිත ආකෘති පත්‍රයක් මඟින් නොපමාව දන්වා සිටිය යුතු අතර, ඒ අවස්ථාවේ දී ම මෝටර් වාහනයේ ලියාපදිංචි කිරීමේ සහතිකය සහ නියමිත ගාස්තුව ද කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කිරීම හෝ භාර දීම කළ යුතු ය.

(4) ඉහතින් වූ උපවගන්තිවල විධිවිධාන වලින් යම් විධිවිධානයක් උල්ලංඝනය කරන හෝ ඒවාට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින මෝටර් වාහනයක ලියාපදිංචි අයිතිකරු වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කිරීමේ දී රුපියල් දස දහසකට නොඅඩු සහ රුපියල් විසි දහසකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය."

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තියට ඉත්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රධාන ප්‍රඥප්තියේ 11අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:— ප්‍රධාන ප්‍රඥප්තියේ 11අ වගන්තිය ඇතුළත් කිරීම.

"පැවරීම නිශ්චිත ආකෘති පත්‍ර මගින් සිදු කළ යුතු බව.

11අ. මෝටර් වාහනයක ලියාපදිංචි අයිතිකරු එම වාහනය පැවරීමට අදහස් කරන අවස්ථාවක, ඔහු විසින් එම පැවරීම නියමිත ආකෘති පත්‍ර වන අ, අ1, ආ, ආ1, ඇ, සහ ඇ1 යන ආකෘති පත්‍රවලට සාරානුකූලව කළ යුතු ය.".

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය ඇතුළත් කිරීම.

(1) එම වගන්තියේ (2) සහ (3) උපවගන්ති ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන්:—

"(2) ලියාපදිංචි අයිතිකරු විසින් ස්වේච්ඡාවෙන් කරනු ලබන පැවරීමක් මත මෝටර් වාහනයක සන්තකයේ යම් වෙනස් වීමක දී —

(අ) ලියාපදිංචි අයිතිකරු විසින් සන්තකය එලෙස වෙනස් වීමෙන් පසු දින දාහතරක් ඇතුළත—

(i) නියමිත "අ" ආකෘති පත්‍රය යථා පරිදි සම්පූර්ණ කොට ලියාපදිංචි තැපෑලෙන් හෝ පෞද්ගලිකව භාර දීමෙන් හෝ කොමසාරිස් ජනරාල්වරයා වෙත කෙලින්ම යැවිය යුතු ය ; සහ

(ii) යථා පරිදි සම්පූර්ණ කරන ලද "ආ", "ආ1" "ඇ" සහ "ඇ1" යන නියමිත ආකෘති පත්‍ර ද, මෝටර් වාහනයක අදාළ ලියාපදිංචි

කිරීමේ සහතිකය නැතහොත් එහි අනු පිටපතක් සහ එම මෝටර් වාහනයේ ආදායම් බලපත්‍රය අලුත් අයිතිකරුට භාර දිය යුතු ය. තව ද සන්තකය වෙනස් වීමට සාක්ෂියක් වශයෙන් ලියාපදිංචි අයිතිකරු විසින් යථා පරිදි සම්පූර්ණ කරන ලද "අ1" දරන නියමිත ආකෘති පත්‍රය තමා වෙත තබා ගත යුතු ය.

(ආ) මෝටර් වාහනයක අලුත් අයිතිකරු එම වාහනයේ අලුත් අයිතිකරු ලෙස ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කර ඇත්නම් මිස, සන්තකය වෙනස් වීමෙන් පසු දින දාහතරකට පසුව කිසි විටක එම වාහනය පාවිච්චි කරනු නොලැබිය යුතු ය:

එසේ වුව ද, මෝටර් වාහනය සන්තකය වෙනස් වීම කුලී ගිවිසුමක කාල සීමාව මාස තුනක් නොඉක්මවන්නා වූ යම් අවස්ථාවක මේ උපවගන්තිය අදාළ නොවිය යුතු ය.

(3) (අ) අයිතිය වෙනස් වීමෙන් පසුව දින දාහතරක් ඇතුළත අයිතිය වෙනස් වීම පිළිබඳව කොමසාරිස් ජනරාල්වරයාට දැනුම් දීම පැහැර හරින ලියාපදිංචි අයිතිකරුවකු වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කිරීමේ දී රුපියල් තුන් දහසකට නොඅඩු සහ රුපියල් හය දහසකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය."

(ආ) අලුත් අයිතිකරු වශයෙන් ලියාපදිංචි වීම සඳහා, සන්තකය වෙනස් වීමෙන් පසුව දින දාහතරක් ඇතුළත ඉල්ලුම් කිරීම පැහැර හරින මෝටර් වාහනයක නව අයිතිකරු වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කිරීමේ දී, ඉහත කී දින දාහතරේ කාල සීමාවෙන් පසු එසේ පැහැර හරින හතලිස් හතර වන දිනය දක්වා එක් දිනකට රුපියල් සියය බැගින් වූ දඩයකට ඔහු යටත් විය යුතු ය;

(ඇ) අලුත් අයිතිකරු වශයෙන් ලියාපදිංචි වීම සඳහා, සන්තකය වෙනස් වීමෙන් පසුව දින හතලිස්

හතරක් ඇතුළත ඉල්ලුම් කිරීම පැහැර හරින මෝටර් වාහනයක නව අයිතිකරු වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කිරීමේ දී, රුපියල් පන් දහසකට නොඅඩු සහ රුපියල් දස දහසකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය;

(ඇ) ව්‍යාජ ලේඛනයක් හෝ ව්‍යාජ අත්සනක් අන්තර්ගත ලේඛනයක් ඉදිරිපත් කරන ලියාපදිංචි අයිතිකරු හෝ අලුත් අයිතිකරුවකු වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කිරීමේ දී රුපියල් දස දහසකට නොඅඩු සහ රුපියල් පහළොස් දහසකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය;

(ඉ) අයිතිය සොයා බැලීමේ කාර්ය සඳහා සාධාරණ ලෙස අවශ්‍ය වන කාල සීමාවක් සඳහා මාර්ගය භාවිතා කරන්නා වූ ද, සන්තකය වෙනස් වී ඇත්තා වූ ද, මෝටර් වාහනයක් පොලිස් නිලධරයකු විසින් රඳවා තබා ගත හැකි අතර,

(i) එම වාහනය එහි අලුත් අයිතිකරුගේ නමින් ලියාපදිංචි කර ඇති බවට කොමසාරිස් ජනරාල්වරයා විසින් ස්ථිර කිරීමේ දී; සහ

(ii) එම වාහනයේ ලියාපදිංචි සහතිකය ඉදිරිපත් කිරීමේ දී,

පොලිස් නිලධාරියා විසින් එම වාහනය අලුත් අයිතිකරුට මුදා හැරිය යුතු ය.

(2) එම වගන්තියේ (4) වන උපවගන්තියේ —

(අ) එහි (අ) ඡේදයේ "දින හතක් ඇතුළත " යන වචන වෙනුවට "දින දාහතරක් ඇතුළත" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) එම උපවගන්තියේ (ආ) ඡේදයෙහි "දින දාහතරක් ඇතුළත" යන වචන වෙනුවට "දින දහසයක් ඇතුළත " යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) එම උපවගන්තියේ (ඉ) ඡේදය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ;

"(ඉ) ඒ වාහනයේ ලියාපදිංචි අයිතිකරු විසින් කැමැත්තෙන්ම කරන ලද පැවරීමක හේතුවෙන් එම වාහනයේ සන්තකයේ වෙනසක් වූවාක් මෙන් (2) (ආ) උපවගන්තියේ විධිවිධාන ඒ මෝටර් වාහනයට අදාළ විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධන කිරීම.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ;

"(1) යම් මෝටර් වාහනයක සන්තකය වෙනස් වීමේ දී නව අයිතිකරුවකු ලියාපදිංචි කිරීම සඳහා වූ සෑම ඉල්ලීමක් ම-

(අ) නියමිත ආ සහ ඇ ආකෘති පත්‍රවලට සාරානුකූලව කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය;

(ආ) එම මෝටර් වාහනයට අදාළ එම ආකෘති පත්‍රයෙහි නිශ්චිතව දක්වා ඇති කාරණා සම්බන්ධයෙන් එම මෝටර් වාහනයට අදාළව සියලු තොරතුරු සඳහන් කළ යුතු ය;

තව ද, භාර ගැනීමේ ලදුපතක් කොමසාරිස් ජනරාල්වරයාගෙන් ලබා ගත යුතු ය."

(2) එම වගන්තියේ (2) වන උපවගන්තිය එහි (3) වන උපවගන්තිය ලෙස නැවත අංක යෙදීමෙන් ;

(3) එම වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම එම වගන්තියේ (2) උප වගන්තිය ලෙස බලාත්මක විය යුතු පහත දැක්වෙන උප වගන්තිය ඇතුළත් කිරීමෙන්:-

"(2) යථා පරිදි සම්පූර්ණ කරන ලද ආ1 සහ ඇ1 නියමිත ආකෘති පත්‍ර නව අයිතිකරු විසින් තබා ගත යුතු ය."

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධන කිරීම.

(1) එම වගන්තිය 6 (1) වන උපවගන්තිය ලෙස නැවත අංක යෙදීමෙන්;

(2) එම වගන්තියේ නැවත අංක යෙදූ (1) වන උපවගන්තියේ "සේවයට ගත නොහැකි තත්වයකට පත් කර ඇත්තා වූ අවස්ථාවක ඒ බව දින දාහතරක් ඇතුළත" යන වචනවල සිට එම වගන්තියේ අවසානය දක්වා වූ ඇති වචන ඉවත් කොට ඒ වෙනුවට "දින දාහතරක් ඇතුළත අයිතිකරු විසින් එම කරුණු කොමසාරිස් ජනරාල්වරයා වෙත වාර්තා කොට ලියාපදිංචි කිරීමේ සහතිකය ඔහු වෙත ඉදිරිපත් කළ යුතු අතර, කොමසාරිස් ජනරාල්වරයා විසින් එම වාහනයේ ලියාපදිංචිය අවලංගු කරනු ලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්;

(3) (1) වන උපවගන්තියේ අතුරු විධානය ඉවත් කිරීමෙන්;

(4) එම වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම එහි (2) (3), (4), (5), (6), සහ (7) වන උපවගන්ති වශයෙන් බලාත්මක විය යුතු පහත දැක්වෙන උපවගන්ති ඇතුළත් කිරීමෙන් :—

"(2) (අ) යම් මෝටර් වාහනයක් —

(i) නීති විරෝධී ලෙස කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරන ලද හෝ එහි මූලාකෘතියට අනනුකූල ලෙස නිෂ්පාදනය කර, එකලස් කර, සකස් කර, අලුතින් නිර්මාණය කර, අනුවර්තනය කර, විකරණය කර හෝ එහි නිර්මාණය වෙනස් කර ඇති බවට;

(ii) අදාළ සමාගමේ නව කොටස් යොදා එකලස් කිරීම හැර, අන්‍යාකාරයකින් හෝ එම කොටස්වල නිෂ්පාදකයාගේ අවසරය නොමැතිව එකලස් කිරීම කර ඇති මෝටර් වාහනයක් බවට;

(iii) කාර්මික දෝෂ සහිත මෝටර් වාහනයක් බවට;

(iv) ආරක්ෂාව පිළිබඳ නියමිත ප්‍රමිතිවලට අනුකූල නොවන මෝටර් වාහනයක් බවට;

(v) සොරකම් කරන ලද මෝටර් වාහනයක් බවට;

(vi) ව්‍යාජ අනන්‍යතාව සහිත මෝටර් වාහනයක් බවට;

(vii) වාහනයේ චැසි අංක වෙනස් කර ඇති මෝටර් වාහනයක් බවට;

(viii) පූර්ව ලියාපදිංචි තිබුණේ නම්, ඒ පිළිබඳ විස්තර ඉදිරිපත් කිරීමට එම වාහනය ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කර ඇති ඉල්ලුම්කරු අපොහොසත් වී ඇති බවට;

(ix) එම වාහනය ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයේ, ඉල්ලුම්කරු විසින් වැරදි තොරතුරු ඉදිරිපත් කර ඇති බවට ; හෝ

(x) ව්‍යාජ ලේඛන සහිතව ආනයනය කර ඇති බවට හෝ ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයෙහි ව්‍යාජ අත්සනක් යොදා ඇති බවට හෝ එම ඉල්ලුම් පත්‍රය සමග ව්‍යාජ ලේඛන ඉදිරිපත් කර ඇති බවට;

විශ්වාස කිරීමට කොමසාරිස් ජනරාල්වරයාට හේතු ඇත්නම් ;

(ආ) එම මෝටර් වාහනයේ ලක්ෂණ —

(i) ඉල්ලුම් පත්‍රයේ අන්තර්ගත විස්තරවලට අනුකූල නොවන බවට;

(ii) කොමසාරිස් ජනරාල්වරයාගේ මතය අනුව, එය මාර්ගයේ ධාවනය කිරීමට නුසුදුසු නම් හෝ එම මෝටර් වාහනයේ සැලැස්ම, නිර්මාණය හෝ එහි යම් තත්ත්වයක් හෝ යම් උපකරණයක් නිසා එය මේ පනතේ විධිවිධානවලට අනුකූල නොවන බවට;

(iii) එය ශ්‍රී ලංකාවට ආනයනය කිරීම සඳහා කොමසාරිස් ජනරාල්වරයාගේ පූර්ව ලිඛිත අනුමතය අවශ්‍ය වන බවට සහ එම අනුමතය ලබා නොගෙන එය ආනයනය කරනු ලැබ ඇති බවට ;

(iv) කොමසාරිස් ජනරාල්වරයාගේ පූර්ව ලිඛිත අවසරය නොමැතිව නිෂ්පාදන කර එකලස් කර, සකස් කර, අනුවර්තනය කර, විකරණය කර ඇති හෝ යම් ආකාරයකින් එහි නිර්මාණය වෙනස් කර ඇති බවට;

(v) එහි ලියාපදිංචි අයිතිකරු මිය ගොස් ඇති බවට හෝ සොයා ගත නොහැකි බවට හෝ එම වාහනය මෝටර් වාහනයක් වීම අවසන් වී ඇති බවට හෝ;

(ඇ) එම මෝටර් වාහනයේ ලියාපදිංචිය ලබා ගෙන ඇත්තේ යම් වැදගත් කරුණක් සම්බන්ධයෙන් ව්‍යාජ වූ ලේඛන පදනම් කොට ගෙන හෝ එසේ වැදගත් කරුණක් අසත්‍ය වූ කරුණු නියෝජනය කිරීමෙන් බවට හෝ එම වාහනයේ සටහන් කර ඇති එන්ජින් අංකය හෝ එහි අඹා ඇති චැසි අංකය ලියාපදිංචි කිරීමේ සහතිකයේ සඳහන් අදාළ අංකවලට වඩා වෙනස් බවට;

විශ්වාස කිරීමට කොමසාරිස් ජනරාල්වරයාට හේතු ඇත්නම් අයිතිකරුට කැමති නියෝජනයක් ඉදිරිපත් කිරීමේ අවස්ථාව ඔහුට ලබා දීමෙන් පසු (ලියාපදිංචි සහතිකයේ සඳහන් ඔහුගේ ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් දැන්වීමක් යැවීමෙන් පසු වාර්තාගත කළ යුතු හේතු අනුව මෝටර් වාහනයක ලියාපදිංචිය අවලංගු කරනු ලැබිය හැකි ය.

(3) යම් මෝටර් වාහනයකට අඛණ්ඩව අවුරුදු දෙකකට ආදායම් බලපත්‍රයක් නිකුත් කරනු ලැබ නැති බවට සහ එම කාලසීමාව සඳහා පාවිච්චි නොකිරීමේ සහතිකයක් නිකුත් කර නැති බවට, සාක්ෂි හෝ තොරතුරු කොමසාරිස් ජනරාල්වරයාට ලැබීමේ දී වලංගු ආදායම් බලපත්‍රයක් හෝ පාවිච්චි නොකිරීමේ සහතිකයක් එක් මසක් ඇතුළත, ඉදිරිපත් කරන ලෙසත්, ලියාපදිංචි කිරීමේ සහතිකය නැවත භාර දෙන ලෙසත්, එම වාහනයේ අයිතිකරුට කොමසාරිස් ජනරාල්වරයා විසින් නොපමාව නියම කරනු ලැබිය යුතු ය. මේ වගන්තියේ සඳහන් ආදායම් බලපත්‍රය හෝ පාවිච්චි නොකිරීමේ සහතිකය ඉදිරිපත් කිරීමට අයිතිකරු අපොහොසත් වුවහොත්, කොමසාරිස් ජනරාල්වරයා විසින් එම මෝටර් වාහනයේ ලියාපදිංචිය අවලංගු කරනු ලැබිය යුතු ය.

(4) යම් වාහනයක් පරීක්ෂා කරන ලෙස කොමසාරිස් ජනරාල් විසින් නියම කරනු ලැබිය හැකි අතර, එවැනි පරීක්ෂාවකින් පසු

සහ අයිතිකරු කැමති නියෝජනයක් කිරීමේ අවස්ථාවක් ඔහුට ලබා දීමෙන් පසු (ලියාපදිංචි කිරීමේ සහතිකයේ සඳහන් ලිපිනයට ඔහුට ලියාපදිංචි තැපෑලෙන් දැන්වීමක් යැවීමෙන් පසු ) වාහනය පාවිච්චි කළ නොහැකි තත්වයේ ඇති බවට හෝ එය ප්‍රසිද්ධ ස්ථානයකට පාවිච්චි කිරීමෙන් මහජනතාවට අනතුරක් විය හැකි බවටත්, එය අලුත්වැඩියා කළ නොහැකි බවටත් කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් වන්නේ නම්, එම වාහනය අවලංගු කර, ලියාපදිංචිය ද අවලංගු කරන ලෙස කොමසාරිස් ජනරාල්වරයා නියෝග කළ යුතු ය.

(5) අනතුරක් හෝ වෙනත් අවස්ථානුගත කරුණක ප්‍රතිඵලයක් වශයෙන් එම වාහනය මාර්ගයේ ධාවනය කළ නොහැකි බවට ප්‍රකාශයට පත් කරනු ලැබුවහොත්, කොමසාරිස් ජනරාල්වරයා විසින් එම මෝටර් වාහනයේ ලියාපදිංචිය අත් හිටවනු ලැබිය යුතු ය:

එසේ වුව ද, ඉන් පසුව ලියාපදිංචි අයිතිකරු විසින් නියමිත ගාස්තුව ද සමග නියමිත ආකෘති පත්‍රයෙහි ඉල්ලීමක් කරනු ලැබූ, එම වාහනය මාර්ගයේ ධාවනය කිරීමට සුදුසු තත්වයට පත් කර ඇති බවත් එය මේ පනතේ විධිවිධානවලට සහ මෙය යටතේ සාදන ලද නියෝගවලට අනුකූල වන බවත් කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් වන්නේ නම්, ඔහු විසින් එම අත්හිටුවීම ඉවත් කරනු ලැබිය හැකි ය.

(6) (2) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ මෝටර් වාහනයක ලියාපදිංචිය අවලංගු කරනු ලැබ ඇති අවස්ථාවක හෝ වාහනයේ හෝ වාහනයේ අයිතිකරුගේ අනන්‍යතාව පිළිබඳව ප්‍රශ්නයක් ඇති අවස්ථාවක දී—

(අ) වාහනයේ අයිතිකරු මේ පනතේ විධිවිධානවලට සහ එය යටතේ සාදන ලද නියෝගවලට අනුකූලව ක්‍රියා කර තිබේ නම් ; සහ

(ආ) කොමසාරිස් ජනරාල්වරයා විසින් තත් කාර්ය සඳහා බලය පවරනු ලැබූ නිලධරයකු විසින් වාහනය පරීක්ෂා කරනු ලැබ, අයිතිකරු මේ පනතේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කර ඇති බවට ලියාපදිංචි සහතිකයේ සටහනක් කරනු ලැබුවහොත්,

එම වාහනය මෙම කොටස යටතේ නැවත ලියාපදිංචි කිරීම සඳහා සලකා බැලිය හැකි ය.

(7) වාහනයක ලියාපදිංචිය අවලංගු කළ විට, ලියාපදිංචි අයිතිකරු විසින් එම වාහනය පාවිච්චි කිරීම නැවැත්විය යුතු අතර, එසේ අවලංගු කිරීම පිළිබඳව දැනුම් දීමේ දිනයේ සිට දින හතක් ඇතුළත වාහනයේ හඳුනා ගැනීමේ අංක තහඩුව කොමසාරිස් ජනරාල්වරයාට ආපසු භාර දිය යුතු ය.

(8) (අ) නියමිත කාර්ය පටිපාටියට අනුකූලව අවලංගු කරන ලද වාහන සම්බන්ධයෙන් ලේඛනයක් කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වාගෙන යා යුතු අතර, අවලංගු කරන ලද මෝටර් වාහන සම්බන්ධයෙන් තොරතුරු එහි ඇතුළත් කරනු ලැබිය යුතු ය. කාර්යාල වේලාවන් තුළ දී එම ලේඛනය මහජනතාව විසින් පරීක්ෂා කිරීම සඳහා ලබා දිය යුතු ය;

(ආ) අවලංගු කරන ලද වාහන පිළිබඳ ලේඛනයෙහි ඇති සටහන් ඇතුළත් කිරීම, සංශෝධනය කිරීම සහ ඉවත් කිරීම, මේ යටතේ සාදනු ලබන නියෝගවලට අනුකූලව පමණක් සිදු කළ යුතු ය.

(9) (7) වන සහ (8) වන උපවගන්තිවල කාර්ය සඳහා—

(අ) ගැටීමෙන්, ගින්නකින්, ජල ගැල්මකින්, අනතුරකින්, අනවසර ඇතුළුවීමකින් හෝ වෙනත් කරුණකින් හෝ අවස්ථානුගත කරුණකින් වාහනයට අලාභයක් සිදු වුවහොත් ; සහ

(ආ) අලාභයේ ප්‍රමාණය කොපමණ ද යත්, වාහනයේ අබලන් තත්ත්වයේ වටිනාකම සහ මාර්ගයේ හෝ මාර්ග ආශ්‍රිත ප්‍රදේශයක එය පාවිච්චි කිරීම සඳහා අළුත්වැඩියා කිරීමේ වියදම අලාභය සිදු කළ සිදු වීම හෝ අවස්ථානුගත කරුණට පෙර එම වාහනයේ වෙළඳපල වටිනාකමට වඩා වැඩි බවට එම වාහනයේ රක්ෂණකරු හෝ රක්ෂණකරුවකු නොමැති නම් වාහනයේ ලියාපදිංචි අයිතිකරු තීරණය කරන්නේ නම්,

පමණක් එම වාහනය අවලංගු කරනු ලැබිය යුතු ය.

(10) (අ) ඡේදයේ සඳහන් වාහනයක රක්ෂණකරුවකු —

(අ) වාහනයේ සම්පූර්ණ රක්ෂණ වටිනාකම සඳහා හිමිකම් පෑමකට එම රක්ෂණකරු විසින් අවසර ලබා දෙනු ලැබුවහොත් ; හෝ

(ආ) එම රක්ෂණකරු විසින් වාහනය තුන්වන පාර්ශවයකට බැහැර කරනු ලැබුවහොත්,

එම රක්ෂණකරු විසින් (9) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ තීරණයක් කරනු ලැබ ඇති ලෙස සලකනු ලැබේ.

(11) (9) (ආ) උපවගන්තියේ සඳහන් වාහනයක ලියාපදිංචි අයිතිකරු විසින් එම වාහනය සුන්බුන් මිලදී ගන්නා තැනැත්තකුට විකුණනු ලැබුවහොත් එම ලියාපදිංචි අයිතිකරු එම වගන්තිය යටතේ තීරණයක් කරනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(12) යම් දැනුම්දීමක් හෝ ඉල්ලීමක් සම්බන්ධයෙන් දෙන ලද යම් තොරතුරක් හෝ ඉදිරිපත් කරන ලද ලේඛනයක් හෝ එම ලේඛනයේ පිටපතක් යම් විමර්ශනයක්, නීතිය බලාත්මක කිරීම් සහ ආශ්‍රිත කාර්යයක් සඳහා හෙළි කරනු ලැබිය හැකි බව සහ භාවිතා කරනු ලැබිය හැකි බව, (අවස්ථාවෝචිත පරිදි, එම දැනුම් දීම හෝ ඉල්ලීම සිදු කරන අවස්ථාවේ දී එම වාහනය අවලංගු කිරීම පිළිබඳව කොමසාරිස් ජනරාල්වරයාට දැනුම් දෙන හෝ අවලංගු කරන ලද වාහන පිළිබඳ ලේඛනයේ ඇති සටහනක් සංශෝධනය කිරීමට හෝ ඉවත් කිරීමට ඉල්ලා සිටින යම් තැනැත්තෙකුට දැනුම් දෙන බවට කොමසාරිස් ජනරාල්වරයා සහතික විය යුතු ය.

(13) අවලංගු කරන ලද වාහන බැහැර කිරීම සම්බන්ධයෙන් සහ ඒ සම්බන්ධයෙන් තැබිය යුතු වාර්තා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(14) මේ වගන්තියේ යම් විධිවිධානයක් කඩ කරන යම් තැනැත්තෙක් වරදකට වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දස දහසකට නොඅඩු සහ රුපියල් විසි දහසකට නොවැඩි දඩයකට සහ එම වරද සඳහා දෙවන වර හෝ පසු අවස්ථාවක දී වරදකරු කරනු ලැබීමේ දී රුපියල් විසි දහසකට නොඅඩු සහ රුපියල් තිස් දහසකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය.".

**14.** ප්‍රධාන ප්‍රඥප්තියට අලුතින් 18ආ වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 18ආ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:— ප්‍රධාන ප්‍රඥප්තියට අලුතින් 18ආ වගන්තිය ඇතුළත් කිරීම.

"ලියාපදිංචි කිරීමේ සහතිකය වංචනික ලෙස පාවිච්චි කිරීම හෝ අවලක්ෂණ කිරීම ආදිය සිදු කිරීම සඳහා දණ්ඩනය.

18ආ. මෝටර් වාහනයක් ලියාපදිංචි කිරීමේ සහතිකය—

(අ) වංචනික ලෙස පාවිච්චි කරන හෝ එසේ පාවිච්චි කිරීම සඳහා වෙනත් යම් තැනැත්තකුට ඉඩ ලබා දෙන; හෝ

(ආ) අනුකරණය කරන, වෙනස් කරන, අවලක්ෂණ කරන, විරූපී කරන හෝ විනාශ කරන,

යම් තැනැත්තෙක් වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පහළොස් දහසකට නොඅඩු සහ රුපියල් විසිපන් දහසකට නොවැඩි දඩයකට ද එම වරද සඳහා දෙවන වරට හෝ පසු අවස්ථාවක දී වරදකරු කරනු ලැබීමේ දී රුපියල් තිස් දහසකට නොඅඩු සහ රුපියල් පනස් දහසකට නොවැඩි දඩයකට හෝ මාස තුනකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය. ".

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්ති එහි (3) වන සහ (4) වන උපවගන්ති ලෙස නැවත අංක යෙදීමෙන්;

(2) එම වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව එහි (2) වන උපවගන්තිය ලෙස බලාත්මක විය යුතු පහත දැක්වෙන උප වගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(2) විශේෂයෙන්ම සහ ඉහත කී විධිවිධානවල ව්‍යාප්තියට අගතියක් නොමැතිව අමාත්‍යවරයා විසින් පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය:—

(අ) වාහනවල සහ ට්‍රේලර්වල පළල, උස, රෝද අතර දුර, දිග සහ ඉදිරියට හෝ පසු පසට නෙරා ඇති ප්‍රමාණය සහ එම වාහනවල හෝ ට්‍රේලර්වල රැගෙන යා හැකි බර එම වාහනවල සහ ට්‍රේලර්වල රෝදවල විශ්කම්භය, එම වාහනවල සහ ට්‍රේලර්වල ටයර්වල ස්වභාවය සහ තත්ත්වය විධිමත් කිරීම සඳහා සහ මාර්ගවල අලාභ සිදු විය හැකි යම් ටයර් වර්ග තහනම් කිරීම;

(ආ) අනතුරු ඇඟවීමේ උපකරණවලින් පිටවන අධික ශබ්දය, එන්ජිමෙන්, සයිලන්සරයෙන් සහ මෝටර් වාහනයේ නිර්මාණය හෝ තත්ත්වය නැතහොත් එහි පටවා ඇති බර නිසා පිටවන ශබ්දය තහනම් කිරීම;

(ඇ) යම් පන්තියකට හෝ විස්තරයකට අයත් මෝටර් වාහනයක හෝ ට්‍රේලරයක බර පැටවීමට පෙර සහ බර පැටවීමෙන් පසු තිබිය හැකි උපරිම බර සහ එම වාහනයෙන් හෝ පාරට හෝ එහි යම් නිශ්චිත කොටසකට ප්‍රේෂණය විය හැකි උපරිම ඇක්සල් බර හෝ එම වාහනයේ පාරට වදින යම් කොටසකින් හෝ කොටස් වලින් පාරට ප්‍රේෂණය වන උපරිම බර සහ එම බර පරීක්ෂණය කිරීම නියම කරනු ලැබීමේ කොන්දේසි විධිමත් කිරීම;

(ඈ) වාහනවල හා ට්‍රේලර්වල ලකුණු කළ යුතු විස්තර නියම කිරීම;

(ඉ) වාහනවල හා ට්‍රේලර්වල ඇති දුනුකොල සහ තිරිංගවල සංඛ්‍යාව සහ ස්වභාවය නිශ්චිතව දැන්වීම සහ දුනුකොල, තිරිංග, සයිලන්සර්, දුම් පිටවීම, විදුලි පහන්, බර සහ සුක්කානම කාර්යක්ෂමව සහ නිසි ක්‍රියාකාරීත්වයෙන් පවත්වා ගෙන යන බවට සහතික වීම සහ යම් පාරක හෝ යම් පරිශ්‍රයක හෝ පරිශ්‍රවල පදිංචිකරුගේ කැමැත්ත ඇතිව එම දුනු, තිරිංග, සයිලන්සර්, දුම් පිටවීම, විදුලි පහන්, බර සහ සුක්කානම පරීක්ෂා කොට නිරීක්ෂණය කිරීම සඳහා එම නියෝගවල නිශ්චිතව බලය පවරා ඇති, නම් කරන ලද හෝ විස්තර කර ඇති යම් තැනැත්තකුට හෝ තැනැත්තන් පන්තියකට බලය පැවරීම;

(ඊ) වාහනයක් ළඟ එන බව සංඥා කිරීම හෝ වෙනත් වාහනයක් පිටුපසින් ළඟ එන බවට යම් මෝටර් වාහනයක රියදුරුට දැන ගැනීමට හැකි වීම පිණිස හෝ යම් මෝටර් වාහනයක වේගය හෝ දිසාව වෙනස් කිරීමේ අරමුණ දැනුම් දීම සඳහා සවි කර ඇති උපකරණ භාවිත කිරීම විධිමත් කිරීම හෝ තහනම් කිරීම සඳහා සහ ඒවා කාර්යක්ෂම ලෙස හෝ නිසි ක්‍රියාකාරීත්වයෙන් තබා ගන්නා බවට සහතික වීම;

(උ) වාහන සහ ට්‍රේලර්වල සවි කරනු ලබන විදුලි පහන් සහ ඒවායේ ස්වභාවය වාහනයේ ඒවා සවි කළ යුතු ස්ථානය සහ ඒවා දල්වා තැබිය යුතු කාලය හෝ වෙනත් කරුණු විධිමත් කිරීම;

(ඌ) වාහනවල සවිකළ යුතු ආරක්ෂිත උපකරණ නියම කිරීම;

(එ) වාහනයක් භාවිත කිරීම සම්බන්ධයෙන් දුම්, තෙල් සහිත ද්‍රව්‍ය, අලු, ජලය, හුමාලය, දෘෂ්‍ය වායු, විෂ සහිත දුම්, ගිනි දලු, දැලි අඟුරු ගෑස් හෝ දූවිලි පිටවීම පාලනය කිරීම;

(ඒ) මෝටර් වාහන වලින් තවත් මෝටර් වාහනයක් ඇදගෙන යෑම හෝ ඇදීම සහ ඒ සඳහා භාවිත කරන සම්බන්ධතා පාලනය කිරීම;

(ඔ) මෝටර් වාහනයක් භාවිත කිරීම සම්බන්ධයෙන්, මාර්ගය භාවිත කරන හෝ ඒ අවට සිටින අයට කරදරයක් හෝ අනතුරක් සිදු කිරීමට ඉඩ ඇති යම් උපකරණයක් භාවිත කිරීම හෝ යම් ක්‍රියාවක් සිදු කිරීම තහනම් කිරීම;

(ඕ) යම් මෝටර් වාහනයකට එක දිගට අමුණනු ලැබිය හැකි ට්‍රේලර් සංඛ්‍යාව, ඒවා ඇමිණීමේ ක්‍රමය සහ ඒවා පාලනය කර තබන ක්‍රමය සහ ඒවායේ තිබිය හැකි උපරිම බර පාලනය කිරීම;

(ක) මෝටර් වාහන හෝ ට්‍රේලර් පැදවීමේ දී හෝ ඒවායේ සහායකයන් ලෙස කටයුතු කිරීමේ දී, සේවයේ නියුක්ත කරවනු ලැබිය හැකි සේවක සංඛ්‍යාව නියම කිරීම සහ එම තැනැත්තන්ගේ කාර්ය සහ චර්යාව විධිමත් කිරීම;

(ග) යම් පන්තියකට හෝ විස්තරයකට අයත් මෝටර් වාහන සඳහා උපරිම වේගයක් නියම කිරීම සහ විශේෂ අවස්ථාවල දී එම නීතිවලින් නිදහස් කිරීමට විධිවිධාන සැලැස්වීම, සහ රේඩාර් උපකරණ සහ ලේසර් වේග උපකරණ සහ ඡායාරූප මඟින් සොයා ගැනීමේ උපකරණ භාවිත කරමින් වේගය දැන ගැනීමේ කාර්ය පටිපාටිය නියම කිරීම;

මෙම ඡේදයේ කාර්ය සඳහා මාර්ගයක හෝ මාර්ගයක කොටසක් සම්බන්ධයෙන් මෝටර් වාහනයක හෝ මෝටර් වාහන පන්තියක උපරිම වේගය ලෙස එකිනෙකට වෙනස් වේග සීමා නියම කරනු ලැබිය හැකි ය;

(ච) පොදුවේ හෝ නිශ්චිත ප්‍රදේශවල හෝ නිශ්චිත මාර්ගවල සහ සියලු අවස්ථාවන්හි දී හෝ නිශ්චිත කාලසීමාවන් තුළ දී, වාහනවල නලා ශබ්ද කිරීම හෝ වෙනත් අනතුරු ඇඟවීමේ උපකරණ භාවිතා කිරීම, නියාමනය කිරීම හෝ තහනම් කිරීම සහ විවිධ අවස්ථානුගත කරුණුවල දී විවිධ පන්ති හෝ විවිධ විස්තරවලට අයත් මෝටර් වාහන සම්බන්ධයෙන් හෝ එකම පන්තියකට හෝ විස්තරයකට අයත් මෝටර් වාහන සම්බන්ධයෙන් විවිධ රීති සාදනු ලැබිය හැකි ය;

(ජ) මෝටර් වාහනයකට පතිතවන ආලෝකයේ ප්‍රමාණය සහ ආලෝකය විනිවිදයාමේ ප්‍රබලතාව තීරණය කිරීම සඳහා වූ කාර්ය පටිපාටිය නියම කිරීම;

(ට) අපවිත්‍ර වායු පිටවීමේ ප්‍රමිතිය නිශ්චිතව දැක්වීම;

(ඩ) යම් නිශ්චිත වාහන වර්ග සඳහා උත්තේජන හැරවීමේ උපකරණ (Catalytic Converters) සවි කිරීම නියාමනය කිරීම;

(ණ) රසායන ද්‍රව්‍ය, ගෑස් හෝ වෙනත් අනතුරුදායක භාණ්ඩ ප්‍රවාහනය කිරීම නියාමනය කිරීම;

(ත) අධිවේගී මාර්ග හෝ යම් මාර්ගයක් භාවිත කිරීම යම් පන්තියකට හෝ පන්තිවලට හෝ වර්ගවලට අයත් මෝටර් වාහනවලට තහනම් කිරීම; සහ

(ද) මෝටර් වාහනවල ලියාපදිංචිය අවලංගු කිරීම සඳහා වූ කාර්ය පටිපාටිය සහ ඒ සඳහා අය කළ යුතු ගාස්තු නියම කිරීම.".

16. ප්‍රධාන ප්‍රඥප්තියට අලුතින් 19 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා ප්‍රධාන ප්‍රඥප්තියේ 19අ, 19ආ, 19ඇ වගන්ති ලෙස බලාත්මක විය යුතු ය:—

ප්‍රධාන ප්‍රඥප්තියට අලුතින් 19අ, 19ආ, 19ඇ වගන්ති ඇතුළත් කිරීම.

"කොමසාරිස් ජනරාල්වරයාගේ අවසරය ඇතිව මිස කිසිම තැනැත්තකු විසින් මෝටර් වාහනයක් සකස් කිරීම, නිෂ්පාදනය කිරීම ආදිය නොකළ යුතුබව.

19අ (1) කොමසාරිස් ජනරාල්වරයාගේ පූර්ව ලිඛිත අනුමතය ඇතිව මිස, කිසිම තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවේ මෝටර් වාහනයක් සකස් කිරීම, නිෂ්පාදනය කිරීම, එකලස් කිරීම, අලුතින් නිර්මාණය කිරීම, අනුවර්තනය කිරීම, විකරණය කිරීම හෝ එහි නිර්මාණය වෙනස් කිරීම නොකළ යුතු ය.

(2) නියමිත ආකෘති පත්‍රයෙහි වූ ඉල්ලීමක් ඉදිරිපත් කිරීමේ දී සහ නියමිත ගාස්තුව ගෙවීමේ දී අනුමතය ලබා දීමට හෝ ලිඛිත දැන්වීමක් මඟින් කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වනු ලබන නියම සහ කොන්දේසිවලට අනුකූලව ඉල්ලුම්කරු ක්‍රියා කිරීමට යටත්ව, අවස්ථාවෝචිත පරිදි මෝටර් වාහනයක් නිෂ්පාදනය කිරීමට, එකලස් කිරීමට, සකස් කිරීමට, අලුතින් නිර්මාණය කිරීමට, අනුවර්තනය කිරීමට, විකිරණය කිරීමට හෝ එහි නිර්මාණය වෙනස් කිරීමට කොමසාරිස් ජනරාල්වරයා විසින් එම ඉල්ලුම්කරුට අනුමතය ලබා දිය හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ වූ දැන්වීම මඟින් නිශ්චිතව දක්වනු ලබන නියම සහ කොන්දේසිවලට, අවස්ථාවෝචිත පරිදි, මෝටර් වාහනයක් නිෂ්පාදනය කිරීම, එකලස් කිරීමට, සකස් කිරීමට, අලුතින් නිර්මාණය කිරීමට, අනුවර්තනය කිරීමට, විකිරණය කිරීම හෝ එහි නිර්මාණය වෙනස් කිරීම සඳහා ඉල්ලුම්කරුට ඇති පහසුකම් එම දැන්වීමේ සඳහන් පිරිවිතරවලට අනුකූල විය යුතු බවට නියමයක් ද ඇතුළත් විය හැකි ය.

x

(4) (2) වන උපවගන්තිය යටතේ නිශ්චිතව දැක්වෙන යම් නියමයකට හෝ කොන්දේසියකට අනුකූලව ඉල්ලුම්කරු ක්‍රියාකර නොමැති බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමකට පත් වන අවස්ථාවක, ඔහු විසින් (1) වන උපවගන්තියේ සඳහන් ලිඛිත අනුමතය ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය. එම ප්‍රතික්ෂේප කිරීම ලිඛිත දැන්වීමක් මගින් ඉල්ලුම්කරුට දෙනු ලැබිය යුතු ය.

(5) මේ වගන්තිය යටතේ ලිඛිත අනුමතය ප්‍රදානය කිරීම කොමසාරිස් ජනරාල්වරයා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබීමෙන් අතෘප්තියට පත් යම් තැනැත්තෙක් එම ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ ලිඛිත දැන්වීම ලැබී දින දාහතරක් ඇතුළත 213 අ අ වගන්තිය යටතේ සංස්ථාපනය කරන ලද මෝටර් වාහන අභියාචන විනිශ්චය අධිකාරිය වෙත ලිඛිතව අභියාචනයක් ඉදිරිපත් කළ හැකි ය.

(6) මෝටර් වාහනයක් නිෂ්පාදනය කිරීම, එකලස් කිරීම, සකස් කිරීම, අලුතින් නිර්මාණය කිරීම, අනුවර්තනය කිරීම, විකිරණය කිරීම හෝ එහි නිර්මාණය වෙනස් කිරීම සඳහා දැනට පවත්නා පහසුකමකට කොමසාරිස් ජනරාල්වරයා විසින් ලිඛිත දැන්වීමක් මගින් නිශ්චිතව දක්වන එකතු කිරීම්, වැඩි දියුණු කිරීම් හෝ විකිරණය කිරීම් සිදු කරන ලෙස එම මෝටර් වාහනය නිෂ්පාදනය කරන්නාට, එකලස් කරන්නාට, සකස් කරන්නාට, අලුතින් නිර්මාණය කරන්නාට, අනුවර්තනය කරන්නාට, විකරණය කරන්නාට හෝ එහි නිර්මාණය වෙනස් කිරීමේ ව්‍යාපාරයේ නියැලී සිටින තැනැත්තාට කොමසාරිස් ජනරාල්වරයා විසින් ලිඛිත දැන්වීමක් මගින් නියම කරනු ලැබිය හැකි ය.

(7) මෝටර් වාහනයක් නිෂ්පාදකයකු, එකලස් කරන්නකු, සකස් කරන්නකු, අලුතින් නිර්මාණය කරන්නකු, අනුවර්තනය කරන්නකු, විකිරණය කරන්නකු හෝ එහි නිර්මාණය වෙනස් කිරීමේ ව්‍යාපාරයේ නියැලී සිටින්නකු—

(අ) (6) වන උපවගන්තිය යටතේ ඔහුට යවන ලද දැන්වීමක සඳහන් නියම කිරීම්වලට අනුකූලව ක්‍රියා කිරීම ඔහු විසින් පැහැර ඇති බවට; හෝ

(ආ) (i) මෝටර් වාහනයක් නිෂ්පාදනය කිරීමේ, එකලස් කිරීමේ, සකස් කිරීමේ, අලුතින් නිර්මාණය කිරීමේ, අනුවර්තනය කිරීමේ, විකරණය කිරීමේ හෝ එහි නිර්මාණය වෙනස් කිරීමේ ව්‍යාපාරය, නුසුදුසු හෝ සෑහීමකට පත් නොවන ආකාරයට සිදු කර ඇති බවට;

(ii) ලිඛිත අනුමතිය ප්‍රදානය කරනු ලැබුවේ යම් නියම සහ කොන්දේසිවලට යටත්ව ද, ඒ නියම සහ කොන්දේසිවලට අනුකූල වීම පැහැර ඇති බවට; හෝ

(iii) මේ පනත යටතේ වරදකට වරදකරු කරනු ලැබ ඇති බවට හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක විධිවිධාන උල්ලංඝනය කර ඇති බවට,

කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් වන අවස්ථාවක (2) වන උපවගන්තිය යටතේ ප්‍රදානය කරන ලද ලිඛිත අනුමතය කොමසාරිස් ජනරාල්වරයා විසින් අවලංගු කරනු ලැබිය හැකි ය.

(8) (7) වන උපවගන්තිය යටතේ යම් ලිඛිත අනුමතයක් අවලංගු කිරීමට පෙර, කොමසාරිස් ජනරාල්වරයා විසින් තමාගේ එම අදහස පිළිබඳව ලිඛිත දැන්වීමක් කරමින් එම අවලංගු කිරීම බලාත්මක කරන්නා වූ ද එම දැන්වීමේ දින සිට දින දාහතරකට වඩා අඩු නොවන්නා වූ ද දිනයක්, නිශ්චිතව දැක්විය යුතු අතර, එම ලිඛිත අනුමතය අවලංගු නොකළ යුත්තේ මන්ද යන්න පිළිබඳව කොමසාරිස් ජනරාල්වරයා වෙත නිදහසට කරුණු ඉදිරිපත් කරන ලෙස මෝටර් වාහනයේ නිෂ්පාදකවරයාගෙන්, සකස් කරන්නාගෙන්, එකළස් කරන්නාගෙන්, අලුතින් නිර්මාණය කරන්නාගෙන්, අනුවර්තනය කරන්නාගෙන්, විකරණය කරන්නාගෙන් හෝ එහි නිර්මාණය වෙනස් කරන තැනැත්තාගෙන් ඉල්ලා සිටිය යුතු ය.

(9) (7) වන උපවගන්තිය විධිවිධාන යටතේ යම් තැනැත්තකු වෙත ප්‍රදානය කරන ලද යම් ලිඛිත අනුමතයක් කොමසාරිස් ජනරාල්වරයා විසින් අවලංගු කරනු ලැබ ඇති අවස්ථාවක, ඔහු විසින් වහාම ලිඛිත දැන්වීමක් මගින් එම අවලංගු කිරීම පිළිබඳව ඒ තැනැත්තාට දැනුම් දිය යුතු ය.

(10) (7) වන උපවගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයාගේ තීරණයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් (9) වන උපවගන්තියේ සඳහන් දැන්වීමක් ලැබී දින දාහතරක් ඇතුළත එම අවලංගු කිරීමට එරෙහිව 213අ වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ මෝටර් වාහන අභියාචන විනිශ්චය මණ්ඩලය වෙත ලිඛිතව අභියාචනයක් ඉදිරිපත් කළ හැකි අතර, එම විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසානාත්මක විය යුතු ය.

(11) (9) වන උපවගන්තිය යටතේ අවලංගු කිරීමේ දැන්වීමක් ලැබී දින දාහතරක කාලයක් ගත වන තුරු අවලංගු කිරීමේ නියමයක් බලාත්මක නොවිය යුතු ය.

(12) ඒ කාලසීමාව ඇතුළත දී ඒ අවලංගු කිරීමෙන් අතෘප්තියට පත් තැනැත්තෙක් 213අ වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ මෝටර් වාහන අභියාචන විනිශ්චය මණ්ඩලයට අභියාචනයක් ඉදිරිපත් කළහොත්, එම විනිශ්චය මණ්ඩලය විසින් අවලංගු කිරීමේ නියමය ස්ථිර කරන තුරු හෝ අභියාචනය නිෂ්ප්‍රභා කරන තුරු ඉහත කී නියමය බලාත්මක නොවිය යුතු ය.

(13) (7) වන හෝ (11) වන උපවගන්තිය යටතේ අවලංගු කිරීමේ නියමයක් බලාත්මක වන අවස්ථාවක, මෝටර් වාහනයක නිෂ්පාදකයකු, එකලස් කරන්නකු, සකස් කරන්නකු, අලුතින් නිර්මාණය කරන්නකු, අනුවර්තනය කරන්නකු, විකරණය කරන්නකු හෝ එහි නිර්මාණය වෙනස් කරන තැනැත්තකු ඉහත කී නියමය බලාත්මක වන

දිනයේ සිට අවස්ථාවෝචිත පරිදි මෝටර් වාහනයක් නිෂ්පාදනය කිරීමේ, එකලස් කිරීමේ, සකස් කිරීමේ, අලුතින් නිර්මාණය කිරීමේ, අනුවර්තනය කිරීමේ විකරණය කිරීමේ හෝ එහි නිර්මාණය වෙනස් කිරීමේ ව්‍යාපාරය පවත්වාගෙන යාම නවත්වනු ලැබිය යුතු ය.

(14) මේ වගන්තිය යටතේ තම ව්‍යාපාරය පවත්වා ගෙන යාම සඳහා වූ ලිඛිත අනුමතිය අවලංගු කරනු ලැබ ඇති මෝටර් වාහනයක නිෂ්පාදකයකු, එකලස් කරන්නකු, සකස් කරන්නකු, අලුතින් නිර්මාණය කරන්නකු, අනුවර්තනය කරන්නකු, විකරණය කරන්නකු හෝ එහි නිර්මාණය වෙනස් කරන තැනැත්තකු විසින්-

(අ) එම ලිඛිත අනුමතය ලබා දීමේ ලිපිය ; සහ

(ආ) අවස්ථාවෝචිත පරිදි එම නිෂ්පාදකයාගේ, එකලස් කරන්නාගේ, සකස් කරන්නාගේ, අලුතින් නිර්මාණය කරන්නාගේ, අනුවර්තනය කරන්නාගේ, විකරණය කරන්නාගේ හෝ එහි නිර්මාණය වෙනස් කරන්නාගේ ලියාපදිංචි සහතිකය,

ඉහත කී අවලංගු කිරීමේ දින සිට දින හතක් ඇතුළත කොමසාරිස් ජනරාල්වරයා වෙත භාර දිය යුතු ය.

(15) මේ වගන්තිය යටතේ තම ව්‍යාපාරය සඳහා ලබා දී ඇති ලිඛිත අනුමතිය අවලංගු කරනු ලැබ ඇති නිෂ්පාදකයකු, එකලස් කරන්නකු, සකස් කරන්නකු, අලුතින් නිර්මාණය කරන්නකු, අනුවර්තනය කරන්නකු, විකරණය කරන්නකු හෝ වාහනයක නිර්මාණය වෙනස් කිරීමේ ව්‍යාපාරයේ නියැලී සිටින්නකු විසින් ඉහත කී අවලංගු කිරීමෙන් පසු,

(අ) (6) වන උපවගන්තිය යටතේ තමා වෙත එවන ලද දැන්වීමක නියමයන්ට අනුකූලව ක්‍රියා කර ඇති බව ; සහ

(ආ) කලින් ලිඛිත අනුමතිය ලබා දී තිබුණේ කුමන නියම සහ කොන්දේසිවලට යටත්ව ද තමා එම නියම සහ කොන්දේසිවලට අනුකූලව ක්‍රියා කර ඇති බව ; සහ

(ඇ) එම ව්‍යාපාරය නිසි පරිදි සහ සෑහීමකට පත්වන ආකාරයට පවත්වාගෙන යන බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමකට පත් කරවීමේ දී-

(i) තම ව්‍යාපාරය සඳහා ලිඛිත අනුමතය ප්‍රදානය කිරීම සඳහා ; සහ

(ii) අවස්ථාවෝචිත පරිදි නිෂ්පාදකයාගේ, එකලස් කරන්නාගේ, සකස් කරන්නාගේ, අලුතින් නිර්මාණය කරන්නාගේ, අනුවර්තනය කරන්නාගේ, විකරණය කරන්නාගේ හෝ නිර්මාණය වෙනස් කරන්නාගේ ලියාපදිංචි සහතිකය නිකුත් කිරීම සඳහා,

කොමසාරිස් ජනරාල්වරයා වෙත නැවත ඉල්ලුම් කළ හැකි ය.

(16) මේ වගන්තිය යටතේ ලිඛිත අනුමතයක් නැවත නිකුත් කිරීමට හෝ අවස්ථාවෝචිත පරිදි නිෂ්පාදකයකු වශයෙන්, එකලස් කරන්නකු වශයෙන්, සකස් කරන්නකු වශයෙන්, අලුතින් නිර්මාණය කරන්නකු වශයෙන්, අනුවර්තනය කරන්නකු වශයෙන්, විකරණය කරන්නකු වශයෙන් හෝ වාහනයක නිර්මාණය වෙනස් කරන්නකු ඒ තැනැත්තාට නිකුත් කරන ලද ලියාපදිංචි සහතිකය නැවත නිකුත් කිරීම හෝ අලුත් කිරීම, කොමසාරිස් ජනරාල්වරයා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබීමෙන් අතෘප්තියට පත් යම් තැනැත්තෙක් එම ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ ලිඛිත දැන්වීම තමා වෙත ලැබී දින දාහතරක් ඇතුළත අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ලිඛිතව අභියාචනය කරනු ලැබිය හැකි අතර, ඔහුගේ තීරණය අවසානාත්මක වේ.

(17) (1), (13) හෝ (14) වන උපවගන්තිවල විධිවිධාන උල්ලංඝනය කරන තැනැත්තෙක් වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පනස්දහසකට අඩු නොවන සහ රුපියල් ලක්ෂයකට වැඩි නොවන දඩයකට ද, එම මෝටර් වාහනය රාජසන්තක කිරීමට ද යටත් වන්නේ ය.

(18) අවස්ථාවෝචිත පරිදි, නිෂ්පාදකයකුගේ, එකලස් කරන්නකුගේ, සකස් කරන්නකුගේ, අලුතින් නිර්මාණය කරන්නකුගේ, අනුවර්තනය කරන්නකුගේ, විකරණය කරන්නකුගේ, නිර්මාණය වෙනස් කරන්නකුගේ ලියාපදිංචි සහතිකයට යෙදිය හැකි කොන්දේසි සහ එම සහතිකය දරන්නකුගේ චර්යාව ඇතුළු එම සහතිකය සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

අදාළ සමාගමේ අලුත්ම කොටස් යොදා මිස මෝටර් වාහන එකලස් කිරීම තහනම් කිරීම.

19ආ. (1) (අ) අදාළ සමාගමේ අලුත්ම කොටස් යොදා මිස ; සහ

(ආ) එම කොටස් නිපදවන්නාගේ පූර්ව ලිඛිත අවසරය ඇතිව මිස,

කිසිම තැනැත්තකු විසින් මෝටර් වාහනයක් එකලස් කිරීම නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව මිස, අන්‍යාකාරයකට මෝටර් වාහනයක් එකලස් කරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කිරීමේ දී රුපියල් පනස් දහසකට අඩු නොවන සහ රුපියල් ලක්ෂයකට වැඩි නොවන දඩයකට ඔහු යටත් විය යුතු ය.

ඇතැම් වාහන ආනයනය කිරීම තහනම් කිරීම.

19ඇ. (1) කිසිම තැනැත්තකු විසින්—

(අ) කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරන ලද මූලාකෘතියට අනුකූල නොවන කිසිම මෝටර් වාහනයක් ; සහ

(ආ) තත්කාර්ය සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද අවසර පත්‍රයක අධිකාරය යටතේ මිස ශ්‍රී ලංකාවට ආනයනය කිරීම නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන කඩ කරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කිරීමේ දී රුපියල් තුන්ලක්ෂයකට අඩු නොවන සහ රුපියල් පන්ලක්ෂයකට වැඩි නොවන දඩයකට ඔහු යටත් විය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියට අලුතින් 24අ වගන්තිය ඇතුළත් කිරීම.

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 24අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :—

21, 22, 23 සහ 24 යන වගන්ති උල්ලංඝනය කිරීම සඳහා වූ දණ්ඩනය.

24අ. (අ) මේ පනතේ 21, 22, 23 සහ 24 වන වගන්තිවල විධිවිධාන උල්ලංඝනය කරන ; හෝ

(ආ) (i) යම් හඳුනා ගැනීමේ අංක තහඩුවක් වංචනික ලෙස භාවිත කරන හෝ එසේ භාවිත කිරීමට වෙනත් යම් තැනැත්තකුට ඉඩ දෙන ; හෝ

(ii) යම් හඳුනා ගැනීමේ අංක තහඩුවක් අනුකරණය කරන, වෙනස් කරන, විකෘති කරන, මකන හෝ විනාශ කරන,

යම් තැනැත්තෙක් වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කිරීමේ දී රුපියල් පහළොස් දහසකට අඩු නොවන සහ රුපියල් විසිපන් දහසකට වැඩි නොවන දඩයකට සහ දෙවන හෝ පසු අවස්ථාවක දී වරදකරු කිරීමේ දී රුපියල් තිස් දහසකට අඩු නොවන සහ රුපියල් පනස් දහසකට වැඩි නොවන දඩයකට හෝ මාස තුනකට වැඩි නොවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"මෝටර් වාහන සඳහා ආදායම් බලපත්‍ර".

**29.** (1) (අ) 196 වන වගන්තිය යටතේ මෝටර් වාහනය සම්බන්ධයෙන් යෝග්‍යතා සහතිකයක් සහ විමෝචන සහතිකයක් ඉදිරිපත් කරනු ලබන්නේ නම් මිස, මෝටර් ලොරියක්, සැහැල්ලු මෝටර් ලොරියක්, බර මෝටර් ලොරියක්, සැහැල්ලු මෝටර් කෝච් රථයක්, බර මෝටර් කෝච් රථයක්, මෝටර් අවමංගල්‍ය රථයක්, මෝටර් ගිලන් රථයක් හෝ රෝගීන් රැගෙන යන රථයක් සඳහා ආදායම් බල පත්‍රයක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

(ආ) 196 වන වගන්තිය යටතේ මෝටර් වාහනයක් සම්බන්ධයෙන් විමෝචන සහතිකයක් ඉදිරිපත් කරනු ලබන්නේ නම් මිස, මෝටර් බයිසිකලයක්, සැහැල්ලු මෝටර් බයිසිකලයක්, මෝටර් රථයක්, ද්විත්ව කාර්ය වාහනයක්, මෝටර් ට්‍රයිසිකලයක්, මෝටර් ට්‍රයිසිකල් වෑන් රථයක්, ඉඩම් වාහනයක්, අත් ට්‍රැක්ටරයක් හෝ විශේෂ කාර්ය වාහනයක් සඳහා ආදායම් බලපත්‍රයක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින් -

(අ) අවශ්‍ය වන්නේ නම්, යෝග්‍යතා සහතිකය සහ විමෝචන සහතිකය ඒකාබද්ධ කිරීම සඳහා විධිවිධාන සලසමින් ;

(ආ) යෝග්‍යතා සහතිකය හෝ විමෝචන සහතිකය අවශ්‍ය විය හැකි අලුත් වාහන පන්ති හඳුනාගනිමින්,

නියෝග සාදනු ලැබිය හැකි ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"ආගන්තුකයකුගේ තාවකාලික බල පත්‍රය".

44 (1) (අ) ක්‍රීඩා විෂයභාර අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද මෝටර් ක්‍රීඩා උත්සවයකට සහභාගී වීම සඳහා ; හෝ

(ආ) ශ්‍රී ලංකාවට එන ගමනක දී එම වාහනයේ අයිතිකරු විසින් පාවිච්චි කිරීමේ කාර්ය සඳහා,

යම් මෝටර් වාහනයක් ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලැබ ඇති බවට, නිශ්චිත ආකෘතියෙහි වූ ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබූ විට සහ නියමිත ගාස්තුව සහ මෝටර් වාහනය ආනයනය කිරීමට අදාළ ලේඛන ඉදිරිපත් කළ විට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමකට පත් වුවහොත්, එම වාහනයේ අයිතිකරු වශයෙන් කිසිදු තැනැත්තෙකු ලියාපදිංචි කරනු නොලැබුවේ වුවද, ආනයනය කළ දින සිට මාස දොළහක් නොඉක්මවන කාල සීමාවක් සඳහා මෝටර් වාහනය සන්තකයේ තබා ගැනීමට සහ පාවිච්චි කිරීමට බලය දෙමින් නියමිත ආකෘති පත්‍රයෙහි වූ ආගන්තුකයකුගේ තාවකාලික බලපත්‍රයක් අයිතිකරුට නිකුත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය මගින් කොමසාරිස් ජනරාල්වරයා වෙත පවරන ලද බලතල, ශ්‍රී ලංකාවේ යම් වරායක් හරහා ආනයනය කරන ලද මෝටර් වාහනයක් සම්බන්ධයෙන් වන විට, වරාය පිහිටා ඇති පරිපාලන දිස්ත්‍රික්කයේ දිසාපතිවරයා විසින් හෝ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් හෝ එම වරායේ රේගු අධිකාරීවරයා විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ යම් නිලධරයකු වෙත ඉදිරිපත් කරන ලද සෑම ඉල්ලීමක්ම සහ යම් නිලධරයකු විසින් නිකුත් කරන ලද සෑම ආගන්තුකයකුගේ තාවකාලික බලපත්‍රයක පිටපතක්

එය නිකුත් කිරීමේ දින සිට දින දාහතරක් ඇතුළත කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) සෑම ආගන්තුකයකුගේ තාවකාලික බලපත්‍රයේ මෝටර් වාහනයේ වර්ගය, මොඩලය, චැසි අංකය, එන්ජින් අංකය සහ වර්ණය ද (5) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද හඳුනා ගැනීමේ තහඩුව පිළිබඳ විස්තර ද නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය.

(5) මේ වගන්තියේ කාර්ය සඳහා වෙන් කරන ලද හඳුනා ගැනීමේ අංකයක් හෝ අංක සහිත තහඩු දෙකක් කොමසාරිස් ජනරාල්වරයා විසින් එම අයිතිකරුට නිකුත් කරනු ලැබිය යුතු ය.

(6) එම අංක තහඩු නියමිත ආකාරයට ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු අතර, බලපත්‍රයේ කාලය අවසන් වීමේ දී ඒවා කොමසාරිස් ජනරාල්වරයා වෙත ආපසු භාර දිය යුතු ය.

(7) ආගන්තුකයකුගේ තාවකාලික බලපත්‍රයක අයිතිකරු විසින් තම වාහනය අපනයනය කිරීමට පෙර එහි තාවකාලික ලියාපදිංචිය අවලංගු කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 102 වන වගන්තිය සංශෝධනය කිරීම.

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 102 වන වගන්තිය එම වගන්තියේ (5) වන උපවගන්තියේ "වයස අවුරුදු දහ අට" යන වචන වෙනුවට "වයස අවුරුදු දහ හත" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 106 වන වගන්තිය සංශෝධනය කිරීම.

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ 106 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"යම් තීන්දු ප්‍රකාශයක් සම්බන්ධයෙන් රක්ෂණ කරුගේ වගකීම

"106 (1) 105 වන වගන්තියේ විධිවිධාන යටතේ යම් රක්ෂණකරුවකු විසින් යම් තීන්දු ප්‍රකාශයක් සම්බන්ධයෙන් :-

(අ) යම් නඩුවක් සඳහා ඇතුළත් වී ඇත්තා වූ පැමිණිලිකරු විසින් එකී රක්ෂණකරු වෙත

එම නඩුව පිළිබඳ දැන්වීමක් එකී නඩුව ආරම්භ වී දින හතකට පෙර හෝ දින හතක් ඇතුළත ලබා දී ඇත්නම් මිස ; හෝ

(ආ) එකී තීන්දු ප්‍රකාශය ක්‍රියාත්මක කිරීම විභාග වෙමින් පවත්නා අභියාචනය මත නැවතී ඇති තාක් කල් ;

කිසිම මුදලක් ගෙවනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ භාර දෙන ලද සෑම දැන්වීමකම :—

(අ) එකී නඩුව පවරා ඇති අධිකරණයේ නම නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු ය.

(ආ) නඩුවට වෙන් කර දී ඇති අංකය නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු ය.

(ඇ) නඩුවේ පාර්ශවයන්ගේ නම් නිශ්චිතව සඳහන් විය යුතු ය.

(ඈ) නඩුව පවරා ඇත්තේ යම් රක්ෂණ ඔප්පුවක් සම්බන්ධයෙන් ද එකී රක්ෂණ ඔප්පුවේ අංකය නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු ය.

(ඉ) නඩුවේ ස්වභාවය සඳහන් කරනු ලැබිය යුතු ය.

(ඊ) දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයකට පෙරාතුව පැමිණිල්ලට පිළිතුරු දෙන ලෙස රක්ෂණකරුට නියම කළ යුතු ය.

(3) නඩුවට ගොනු කරන ලද පැමිණිල්ලේ පිටපතක් සෑම දැන්වීමක් සමඟම ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) එම දැන්වීම ලබා දී ඇත්තේ යම් රක්ෂණකරුවකු වෙත ද එම රක්ෂණකරු එම නඩුවේ පාර්ශ්වකරුවකු විය යුතු අතර එම රක්ෂණකරුට එම නඩුවේ විත්තිය වෙනුවෙන් පෙනී සිටීමට හිමිකමක් තිබිය යුතු ය.

**22.** ප්‍රධාන ප්‍රඥප්තියේ 112 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එම වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 112අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :- ප්‍රධාන ප්‍රඥප්තියට 112අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"රක්ෂණ සහතිකය පැවරීම.

112අ. (1) මේ පරිච්ඡේදයේ විධිවිධාන ප්‍රකාරව රක්ෂණ සහතිකය නිකුත් කරනු ලැබ ඇත්තේ යම් තැනැත්තකු වෙත ද ඒ තැනැත්තා විසින් ඒ හා සම්බන්ධ රක්ෂණ ඔප්පුව ද සමඟ රක්ෂණය ලබා ගෙන ඇත්තේ යම් මෝටර් වාහනයක් සම්බන්ධයෙන් ද එම මෝටර් වාහනයේ අයිතිය වෙනත් තැනැත්තකු වෙත පවරා දෙනු ලබන අවස්ථාවක දී, රක්ෂණ සහතිකය සහ සහතිකයේ විස්තර කර ඇති ඔප්පුව එකී මෝටර් වාහනය පවරා දෙනු ලැබුවේ යම් තැනැත්තකු වෙත ද එම පවරා දීමේ දින සිට එම තැනැත්තාට පවරා දෙනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

**පැහැදිලි කිරීම** :- සැක දුරු කිරීමේ කාර්ය සඳහා, එම උද්දේශිත පැවරීමට එකී රක්ෂණ සහතිකයේ සහ රක්ෂණ ඔප්පුවේ අයිතිවාසිකම් සහ වගකීම් පැවරීම ඇතුළත් විය යුතු ය.

(2) පැවරුම්ලාභියා විසින් රක්ෂණකරු වෙත රක්ෂණ සහතිකයේ පැවරීම සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස්කම් සිදු කිරීම සඳහා නියමිත ආකෘති පත්‍රයෙන් පැවැරීමේ දින සිට දින හතලිස් හතරක් ඇතුළත ඉල්ලීමක් කරනු ලැබිය හැකි අතර රක්ෂණය පැවරීම සම්බන්ධයෙන් රක්ෂණ සහතිකයේ සහ ඔප්පුවේ අවශ්‍ය වෙනස්කම් රක්ෂණකරු විසින් සිදු කරනු ලැබිය යුතු ය.".

**23.** ප්‍රධාන ප්‍රඥප්තියේ 122 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :- ප්‍රධාන ප්‍රඥප්තියේ 122 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"මෝටර් වාහන සඳහා රියදුරු බලපත්‍ර වර්ග කිරීම.

122 (1) මේ පනතේ කාර්ය සඳහා මේ වගන්තියේ උපලේඛනයේ 1 වන 2 වන සහ 5 වන තීරුවල දැක්වෙන පන්තිවලට මෝටර් වාහන බෙදනු ලැබිය යුතු අතර, 1 වන 2 වන සහ 5 වන තීරුවල නිශ්චිතව

දැක්වෙන පන්ති සඳහා වූ බල පත්‍රයක් එම බලපත්‍රය දරන්නාට අයි.එස්.ඕ/ ටී.ඊ.සී/ එෆ්.ඩී.අයි.එස්/18013-1-2005 (ඉ) හි අර්ථ නිරූපණය කර ඇති පරිදි 1, 2, 3 සහ 5 තීරුවල නිශ්චිතව දැක්වෙන පන්තියක මෝටර් වාහනයක් පැදවීමට බලය පවරා ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුවද, අමාත්‍යවරයා විසින් විශේෂ අවස්ථාවලදී (1) වන උපවගන්තියේ නිශ්චිතව දැක්වෙන රියදුරු බලපත්‍රයක් වන උපවගන්තියේ නිශ්චිතව දැක්වෙන රියදුරු බලපත්‍රයක් නොවන්නා වූ රියදුරු බලපත්‍රයක් දරන තැනැත්තකු විසින් එකී නියෝගවල නිශ්චිතව දැක්වෙන වර්ගයක මෝටර් වාහනයක් පැදවීම සඳහා බලය දෙනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු බවට නියෝග සාදනු ලැබිය හැකි ය.

**උපලේඛනය**

| | | 1 වන තීරය | 2 වන තීරය | 3 වන තීරය | 4 වන තීරය | 5 වන තීරය |
|---|---|---|---|---|---|---|
| | | විස්තරය | අලුත් පන්ති | වෙනත් පන්ති සඳහා වලංගු භාවය | ඡායාරූප | වර්තමාන පන්තිය |
| 1 | (i) | මෝටර් සයිකල්. එන්ජින් ධාරිතාව සී සී 100 ඉක්මවන මෝටර් සයිකල්. | ඒ | ඒ 1, ජී 1 | | ඩී |
| | (ii) | සැහැල්ලු මෝටර් සයිකල්. එන්ජින් ධාරිතාව සී සී 100 නොඉක්මවන මෝටර් සයිකල්. | ඒ 1 | ජී 1, | | ඩී |
| 2 | | ආසන සංඛ්‍යාව රියදුරු අසුනද ඇතුලුව ආසන නවයකට වැඩි නොවන්නා වූ සියලු මෝටර් රථ/වාහනයේ දළ බර කිලෝග්‍රෑම් 3500 | බී | ජී 1, | | සී, සී 1 |

| | | 1 වන තීරය | 2 වන තීරය | 3 වන තීරය | 4 වන තීරය | 5 වන තීරය |
|---|---|---|---|---|---|---|
| | | විස්තරය | අලුත් පන්ති | වෙනත් පන්ති සඳහා වලංගු භාවය | ඡායාරූප | වර්තමාන පන්තිය |
| | | නොඉක්මවන්නා වූ සහ ආසන සංඛ්‍යාව රියදුරු අසුනද ඇතුළුව ආසන 9 කට වැඩි නොවන්නා වූ ද ද්විත්වකාර්ය වාහන; එම වාහනවලට, අවසර දෙන ලද උපරිම බර කිලෝග්‍රෑම් 750 වැඩි නොවන ට්‍රේලරයක් ද අමුණා තිබිය හැකි ය; මෙම පන්තියේ මෝටර් වාහනවලට වෙනස් හැකියාවන් ඇති පුද්ගලයන් විසින් පදවනු ලබන මෝටර් රථයක් ද ඇතුළත් විය හැකි ය. | | | | |
| 3. | | මෝටර් ට්‍රයිසිකලයක් /මෝටර් ට්‍රයිසිකල් වෑන් - තාර බර කිලෝග්‍රෑම් 500 නොඉක්මවන්නා වූ ද, වාහනයේ දළ බර කිලෝග්‍රෑම් 1000 නොඉක්මවන්නා වූ ද මෝටර් ට්‍රයිසිකලයක් හෝ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථයක්. | බී 1 | ජී 1 | | ඊ. එෆ් |
| 4. | (i) | මෝටර් ලොරි - වාහනයේ දළ බර කිලෝ ග්‍රෑම් 17000 ට වැඩි මෝටර් ලොරිය; ට්‍රේලරයේ තාර බර, කිලෝග්‍රෑම් 750 ට වැඩි නොවන ට්‍රේලරයක් ද අමුණා තිබිය හැකි ය. | සී | සී 1, ජී 1, ජී, බී 1, ජේ, ජී | | බී |
| | (ii) | සැහැල්ලු මෝටර් ලොරි වාහනයේ දළ බර කිලෝග්‍රෑම් 3500 ට අඩු නොවන සහ කිලෝග්‍රෑම් 17000 ට වැඩි නොවන මෝටර් ලොරි; මෙම | සී 1 | ජී 1, බී, බී 1 | | බී |

| | | 1 වන තීරය | 2 වන තීරය | 3 වන තීරය | 4 වන තීරය | 5 වන තීරය |
|---|---|---|---|---|---|---|
| | | විස්තරය | අලුත් පන්ති | වෙනත් පන්ති සඳහා වලංගු භාවය | ඡායාරූප | වර්තමාන පන්තිය |
| | | පන්තියට අයත් මෝටර් වාහනවලට තාර බර කිලෝග්‍රෑම් 750 නොඉක්මවන්නා වූ ට්‍රේලරයක් ද අමුණා තිබිය හැකි ය. | | | | |
| 5. | | දළ බර කිලෝග්‍රෑම් 3500 ඉක්මවන්නා වූ මෝටර් ලොරියක් හා තාර බර කිලෝග්‍රෑම් 750 ඉක්මවන්නා වූ ට්‍රේලරයක් හෝ ට්‍රේලර් අමුණා සකස් කරන ලද ඒකාබද්ධ රථයක් හෝ ඈඳූ රථයක්. | සී, ඊ | සී, සී 1, බී, බී 1, ජී, ජී 1, ජේ | | බී |
| 6. | (i) | මෝටර් කෝච් රථ රියදුරු අසුනට අමතරව ආසන 33 වැඩිය ඇති මෝටර් කෝච් රථ, මෙම පන්තියේ මෝටර් වාහන වලට පැටවිය හැකි උපරිම බර කිලෝග්‍රෑම් 750 ක් නොඉක්මවන ට්‍රේලරයක් ද අමුණා තිබිය හැකි ය. | ඩී | ඩී 1, සී, සී,1 බී, බී1, ජී, ජී 1, ජේ | | ඒ |
| | (ii) | සැහැල්ලු මෝටර් කෝච් රියදුරු අසුනට අමතරව ආසන 9 ට වඩා වැඩි වූ ද, ආසන 33 ට වඩා අඩු වූ ද, ආසන ඇතිව පුද්ගලයෙක් රැගෙන යාම සඳහා භාවිත කරනු ලබන මෝටර් වාහන : මෙම පන්තියේ මෝටර් වාහනවලට පැටවිය හැකි උපරිම බර කිලෝග්‍රෑම් 750 නොඉක්මවන්නා වූ ට්‍රේලරයක් ද අමුණා තිබිය හැකි ය. | ඩී 1 | සී 1, බී, බී1, ජී, ජී1, | | ඒ 1 |

| | 1 වන තීරය | 2 වන තීරය | 3 වන තීරය | 4 වන තීරය | 5 වන තීරය |
|---|---|---|---|---|---|
| | විස්තරය | අලුත් පන්ති | වෙනත් පන්ති සඳහා වලංගු භාවය | ඡායාරූප | වර්තමාන පන්තිය |
| 7. | බර මෝටර් කෝච් රියැදුරු අසුනට අමතරව ආසන 33 වැඩි ප්‍රමාණයක් ඇත්තා වූ ද, මෝටර් කෝච් රථයක් සහ පැටවිය හැකි උපරිම බර කිලෝග්‍රෑම්ස් 750 වැඩි වන්නා වූ ට්‍රේලරයක් හෝ මෝටර් කෝච් රථ දෙකක ඒකාබද්ධ කිරීමක්. | ඩීඊ | ඩී,ඩී 1, සීඊ, සී, සී1, බී, බී1, ජී, ජී1, ජේ | | ඩී |
| 8. | ඉඩම් වාහන ට්‍රේලරයක් සහිත හෝ රහිත කෘෂිකාර්මික ඉඩම් වාහන. | ජී | ජී 1 | | ජී, ජී 1 |
| 9. | අත් ට්‍රැක්ටර් ට්‍රේලරයක් සහිත රෝද දෙකේ ට්‍රැක්ටර්. | ජී 1 | | | |
| 10. | විශේෂ කාර්ය වාහන, ඉදි කිරීම, පැටවීම් ආදිය සඳහා භාවිත කරනු ලබන වාණිජ වාහන. පැටවීමේ බෑමේ හා ඉදිකිරීමේ උපකරණ සවිකරන ලද මෝටර් ලොරි, සැහැල්ලු මෝටර් ලොරි හා බර මෝටර් ලොරි මෙම පන්තියට අයත් නොවේ. | ජේ | ජී1 | | බී ජී |

ප්‍රධාන ප්‍රඥප්තියේ 122අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**24.** ප්‍රධාන ප්‍රඥප්තියේ 122 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 122අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :—

"රියදුරු බලපත්‍ර පන්ති.

122අ. (1) මේ පනතේ කාර්ය සඳහා අවස්ථාවෝචිත පරිදි රියැදුරු බලපත්‍ර හෝ අවසර පත්‍ර පහත දැක්වෙන පන්ති වලින් සමන්විත විය යුතු ය :—

(අ) 122 වන වගන්තියේ උපලේඛනයේ 1(i), 1(ii), 2, 3 සහ 8 යන අයිතමවල නිශ්චිතව සඳහන් පන්තිවලට අයත් මෝටර් වාහන සම්බන්ධයෙන් වන විට, රියදුරු බලපත්‍ර හෝ අවසර පත්‍ර පහත දැක්වෙන පන්ති වලින් සමන්විත විය යුතු ය :—

(i) පුහුණු වන්නන්ගේ අවසර පත්‍ර ; සහ

(ii) සැහැල්ලු වාහන සඳහා වූ සාමාන්‍ය බලපත්‍රය ;

(ආ) 122 වන වගන්තියේ උපලේඛනයේ 4(i), 4(ii), 5, 6(i), 6(ii), 7, 9 සහ 10 යන අයිතමවල නිශ්චිතව සඳහන් පන්තිවලට අයත් මෝටර් වාහන සම්බන්ධයෙන් වන විට, රියදුරු බලපත්‍ර හෝ අවසර පත්‍ර පහත දැක්වෙන පන්තිවලින් සමන්විත විය යුතු ය :—

(i) පුහුණු වන්නන්ගේ අවසර පත්‍ර ; සහ

(ii) බර වාහන සඳහා වූ සාමාන්‍ය බලපත්‍ර.

(2) 122 වන වගන්තියේ උපලේඛනයේ 4(i), 4(ii), 5, 6(i), 6(ii), 7, 9 සහ 10 යන අයිතමවල නිශ්චිතව සඳහන් එම උපලේඛනයේ 2, 3 හෝ 8 යන අයිතමවල නිශ්චිතව සඳහන් පන්ති (බර මෝටර් වාහන) සඳහා රියදුරු බලපත්‍රයක් ලබා ගැනීමට අපේක්ෂා කරන සෑම තැනැත්තකුටම පන්තිවලට අයත් මෝටර් වාහන සඳහා වූ සාමාන්‍ය බලපත්‍රයක් තිබිය යුතු ය.".

**25.** ප්‍රධාන ප්‍රඥප්තියේ 123 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 123 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ "වලංගු බලදායි රියදුරු බලපත්‍රයක්" යන වචන ඇති සෑම ස්ථානයක දී ම ඒ වෙනුවට "පරිවාස කාලයට යටත් සාමාන්‍ය රියදුරු බලපත්‍රයක්" යන වචන ආදේශ කිරීමෙන්;

(1) (2) උපවගන්තිය සහ ඊට ඇති අතුරු විධානය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්;

"(2) (අ) රියදුරු බලපත්‍රයක් නොමැති සහ වාහන පැදවීම ඉගෙන ගැනීමට හෝ මෝටර් වාහනයක පැදවීමට අවසර ලබා ගැනීමට අදහස් කරන යම් තැනැත්තෙක්—

(i) නියමිත ආකෘති පත්‍රයෙහි; සහ

(ii) නියමිත අයභාරය සහ නියමිත ලේඛන සමග,

පුහුණුවන්නකුගේ අවසර පත්‍රයක් සඳහා කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතු ය.

(ආ) පුහුණුවන්නකුගේ අවසර පත්‍රයක් ප්‍රදානය කිරීම සඳහා ඉල්ලුම්කරුට ප්‍රවීනත්වයක් ඇත් ද යන්න දැන ගැනීම සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් ලිඛිත පරීක්ෂණයක් පැවැත්විය යුතු අතර, එම පරීක්ෂණයෙන් ඉල්ලුම්කරු සමත් වුවහොත් සහ මේ උපවගන්තියේ (ඇ) ඡේදයේ නිශ්චිතව දැක්වෙන නියම කිරීම් සම්බන්ධයෙන් කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් වන්නේ නම්, ඔහු විසින් එම ඉල්ලුම්කරුට පුහුණුවන්නකුගේ අවසර පත්‍රයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(ඈ) පුහුණුවන්නකුගේ අවසර පත්‍රයක් සඳහා ඉල්ලුම් කරන ඉල්ලුම්කරුවකුට—

(i) සැහැල්ලු වාහන පැදවීම සඳහා වන පුහුණුවන්නකුගේ අවසර පත්‍රයක් සම්බන්ධයෙන් වන විට වයස අවුරුදු දහහතක් සම්පූර්ණ කර ඇති බව සහ බර වාහන පැදවීම සඳහා වන පුහුණුවන්නකුගේ අවසර පත්‍රයක් සම්බන්ධයෙන් වන විට වයස අවුරුදු විස්සක් සම්පූර්ණ කර ඇති බව ; සහ

(ii) ඉල්ලීම කරනු ලබන්නේ යම් වාහන පන්තියක් හෝ පන්ති සඳහා ද එම වාහන පන්තියට හෝ පන්තිවලට අයත් වාහන පැදවීම සඳහා එම තැනැත්තා ශාරීරික වශයෙන් යෝග්‍ය බවට,

කොමසාරිස් ජනරාල්වරයා සෑහීමකට පත් වන පරිදි ඔප්පු කළ යුතු ය.

(ඇ) (i) (ආ) ඡේදයේ සඳහන් ලිඛිත පරීක්ෂණයෙන් සමත්වූ සෑම තැනැත්තකුම "එල්" තහඩුවක් ලබා ගැනීම සඳහා නියමිත ගාස්තුව සමඟ නියමිත ආකෘති පත්‍රයක් කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉල්ලුම් කළ යුතු අතර, මේ වගන්තියේ පසුව දැක්වෙන විධිවිධානවලට අනුකූලව එම තහඩුව මෝටර් වාහනයේ සවිකර පවත්වාගෙන යා යුතු ය.

(ii) 99 වන වගන්තියේ විධිවිධාන අනුව රක්ෂණ ආවරණයක් ලබා ගත යුතු ය.

(ඉ) "එල්" තහඩුවක් නොදරන මෝටර් වාහනයක අයිතිකරුවකු හෝ එම වාහනය භාරව සිටින වෙනත් යම් තැනැත්තකුට පුහුණුවීමේ කාර්ය සඳහා "එල්" තහඩුව භාවිත කිරීම සඳහා එම "එල්" තහඩුව දරන තැනැත්තකු විසින් අවසර දීම හෝ අවසර දීමට සැලැස්වීම නොකළ යුතු ය:

එසේ වුව ද—

(i) පුහුණුවන්නකුගේ අවසර පත්‍රයක් දරන්නකු සහ ඔහුට උපදෙස් දෙන තැනැත්තා හැර වෙනත් කිසිම තැනැත්තකු එම මෝටර් වාහනයේ ගමන් නොකළ යුතු ය. එසේ පුහුණුවන්නාට උපදෙස් දෙන තැනැත්තා ලියාපදිංචි රියදුරු උපදේශකයකු නම්, එවිට 122 වන වගන්තියේ උපලේඛනයේ සඳහන් 2 වන අයිතමයේ පන්තියට අයත් මෝටර් වාහනයක රැගෙන යන උපරිම පුහුණුවන්නන්ගේ සංඛ්‍යාව තුන්දෙනකුට වැඩි නොවිය යුතු අතර, 122 වන වගන්තියේ උපලේඛනයේ 6(i), 6(ii) සහ 7 යන අයිතමවල සඳහන් පන්තිවලට අයත් වාහනවල රැගෙන යා හැකි උපරිම පුහුණු වන්නන්ගේ සංඛ්‍යාව හයදෙනකු නොඉක්ම විය යුතු ය ;

(ii) ඔහුට උපදෙස් දීමේ කාර්ය සඳහා එම පන්තියට අයත් මෝටර් වාහනයක් සඳහා වලංගු වන වලංගු රියදුරු බලපත්‍රයක් දරන සහ අවම වශයෙන් අවුරුදු විසි එකක් වන තැනැත්තකු ඔහු සමඟ ගමන් කළ යුතු වන අතර, ඔහු සමඟ පසෙකින් ඇති අසුනේ වාඩි වී සිටිය යුතු ය :

එසේ වුව ද, මෙහි අන්තර්ගත නියමයක් මෝටර් සයිකල් සහ ට්‍රැක්ටර් වලට අදාළ නොවිය යුතු ය ; සහ

(iii) වාහනයෙහි සවි කරනු ලැබූ එක් එක් හඳුනා ගැනීමේ තහඩුවට ඉහළින් එවැනි යම් හඳුනා ගැනීමේ තහඩුවකට අවහිර නොවන ආකාරයකින් හඳුනා ගැනීමේ තහඩුවෙහි අංකයේ කොටසක් වන යම් අක්ෂරයක් මෙන් යටත් පිරිසෙයින් දෙගුණයක පරිමාණයෙන් වූ රතු

තීන්තයෙන් පින්තාරු කරන ලද ඉංග්‍රීසි 'එල්' අක්ෂරය දරන සුදු පුවරුවක් හෝ තහඩුවක් හඳුනා ගැනීමේ තහඩුවට ඉහළින් සවි කර තිබිය යුතු ය.

(ඊ) පුහුණුවන්නකුගේ අවසර පත්‍රයක් දරන තැනැත්තකු එම අවසර පත්‍රය නිකුත් කළ දින සිට මාස තුනක් සම්පූර්ණ කළ පසු සහ එම පුහුණුවන්නාගේ අවසර පත්‍රය දරන තැනැත්තා 125 වන වගන්තියේ දක්වා ඇති නියමයක් සපුරාලන්නේ නම් පුහුණුවන්නාගේ අවසර පත්‍රය සාමාන්‍ය රියදුරු බලපත්‍රයක් බවට පරිවර්තනය කිරීම සඳහා නියමිත අයභාරය සමග නියමිත ආකෘති පත්‍රයකින් කොමසාරිස්-ජනරාල්වරයා වෙත ඉල්ලුම් කළ හැකි ය.

(උ) (i) පුහුණුවන්නකුගේ අවසර පත්‍රයක් නිකුත් කිරීම සඳහා වෙනත් යම් නියමයක් හෝ කොන්දේසි නියම කරමින් ; සහ

(ii) "එල්" තහඩුව නිකුත් කිරීම සඳහා කාර්ය පටිපාටි සහ එහි හැඩය, ප්‍රමාණය, වර්ණය සහ දර්ශනය කිරීමේ විස්තර නියම කරමින්,

නියෝග සාදනු ලැබිය හැකි ය.

(3) එම වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන උපවගන්ති එකතු කරනු ලබන අතර, ඒවා එම උපවගන්තියේ (3), (4), (5), (6) සහ (7) වන උපවගන්ති ලෙස බලාත්මක විය යුතු ය:—

"(3) (අ) සාමාන්‍ය රියදුරු බලපත්‍රයක් නිකුත් කිරීමේ දින සිට අවුරුදු එකක අවම පරිවාස කාලයකට සහ අවුරුදු දෙකක උපරිම පරිවාස කාලයකට යටත් විය යුතු ය.

(ආ) සාමාන්‍ය රියදුරු බලපත්‍රයක් දරන්නකු විසින් 133අ වගන්තිය යටතේ තම රියදුරු බලපත්‍රය අවලංගු කිරීමේ හෝ ඒ ප්‍රතිඵලය ඇති කරවන නියමිත රියදුරු අභිවෘද්ධි ලකුණු ප්‍රමාණයට හෝ ඊට වැඩි රියදුරු අභිවෘද්ධි ලකුණු ප්‍රමාණයක් ලබා ගෙන ඇති අවස්ථාවක, කොමසාරිස්-ජනරාල්වරයා විසින් පරිවාස කාලසීමාව තවත් එක් අවුරුද්දකින් දීර්ඝ කරනු ලැබිය යුතු ය.

(ඇ) (ආ) ඡේදය යටතේ සාමාන්‍ය රියදුරු බලපත්‍රයක් දරන්නකු එක් අවුරුදු පරිවාස කාලය තුළදී 133අ වගන්තිය යටතේ රියදුරු බලපත්‍රයක් අත් හිටුවීමේ හෝ අවලංගු කිරීමේ ප්‍රතිඵලය ගෙන දෙන නියමිත රියදුරු අභිවෘද්ධි ලකුණු සංඛ්‍යාව ලබා ගෙන ඇති බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් වන්නේ නම් ඔහු විසින් එම පරිවාස කාලයට යටත් රියදුරු බලපත්‍රය අවලංගු කරනු ලැබිය යුතු ය.

(4) (අ) මේ පනතේ කාර්ය සඳහා සෑම රියදුරු බලපත්‍රයක්ම එය පරිවාස කාලයට යටත් සාමාන්‍ය රියදුරු බලපත්‍රයක් හෝ රියදුරු සාමාන්‍ය බලපත්‍රයක් වුව ද එම කරුණ නොතකා එම රියදුරු බලපත්‍රයේ සඳහන් පන්තියට හෝ පන්තිවලට අයත් මෝටර් වාහන පැදවීම සඳහා එය වලංගු රියදුරු බලපත්‍රයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(ආ) 122 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් සෑම බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක්ම නිකුත් කිරීම සම්බන්ධයෙන් කොමසාරිස්-ජනරාල්වරයා විසින් අය කර ගනු ලබන සියලුම අයභාර මේ පනතේ විධිවිධාන යටතේ වලංගු ලෙස අයකර ගෙන ඇති බවට සලකනු ලැබිය යුතු ය.

(5) (අ) (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තෙක් වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබීමේ දී රුපියල් තුන්දහසකට නොඅඩු සහ රුපියල් හයදහසකට නොවැඩි

දඩයකට සහ දෙවන හෝ පසු අවස්ථාවක දී වරදකරු කරනු ලැබීමේ දී රුපියල් හය දහසකට නොඅඩු සහ රුපියල් දසදහසකට නොවැඩි දඩයකට ඔහු යටත් වන්නේ ය.

(ආ) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ විධිවිධාන කඩ කරන යම් තැනැත්තෙක් වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කරනු ලැබීමේ දී, රුපියල් හාරදහසකට අඩු නොවන සහ රුපියල් අට දහසකට වැඩි නොවන දඩයකට ද දෙවන හෝ පසු අවස්ථාවක දී වරදකරු කරනු ලැබීමේ දී රුපියල් අට දහසකට අඩු නොවන සහ රුපියල් දොළොස් දහසකට වැඩි නොවන දඩයකට ද ඔහු යටත් විය යුතු ය.

(6) (අ) (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ විධිවිධාන කඩ කරන තැනැත්තකු වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, 224 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති දණ්ඩනයකට ඔහු යටත් විය යුතු ය.

(ආ) (2) වන වගන්තියේ (ඉ) ඡේදයේ විධිවිධාන කඩ කරන තැනැත්තකු වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, 224 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති දණ්ඩනයකට ඔහු යටත් විය යුතු ය.

(7) (3) වන උපවගන්තියේ (අ) ඡේදයේ විධිවිධාන කඩ කරන තැනැත්තෙක් වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කරනු ලැබීමේ දී 224 වන වගන්තියේ නිශ්චිතව දැක්වෙන දණ්ඩන නියමයට ඔහු යටත් විය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 124 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**26.** ප්‍රධාන ප්‍රඥප්තියේ 124 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"පුහුණුවන්නකුගේ අවසර පත්‍රයක් සහ සාමාන්‍ය රියදුරු බලපත්‍රයක් සඳහා ඉල්ලීම.

124. (1) පුහුණුවන්නකුගේ අවසර පත්‍රයක් සහ සාමාන්‍ය රියදුරු බලපත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලීමක්ම නියමිත ආකෘති පත්‍රයකින් කොමසාරිස්-ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, එම ඉල්ලුම් පත්‍රය සමග—

(අ) ඉල්ලීම ඉදිරිපත් කරනු ලබන්නේ යම් වාහන පන්තියක් හෝ පන්ති සම්බන්ධයෙන් ද, එම පන්තියට හෝ පන්තිවලට අයත් වාහනයක්

පැදවීම සඳහා ඉල්ලුම්කරු ශාරීරික වශයෙන් යෝග්‍ය බවට 1997 අංක 25 දරන ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතන පනත යටතේ පිහිටුවන ලද ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයෙන් හෝ (105 වන අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනත යටතේ ලියාපදිංචි වූ සහ ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය විසින් යථා පරිදි බලය ලබාදෙන ලද හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් යථා පරිදි බලය ලබාදෙන ලද වෛද්‍ය වෘත්තිකයකු විසින් නිකුත් කරන ලද වෛද්‍ය සහතිකයක් ;

(ආ) නියමිත අයභාරය ;

(ඇ) නියමිත ප්‍රමාණයේ වූ සහ ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කිරීමේ දිනට මාස හයකට පෙරාතුව නොවන දිනයක දී ගනු ලැබූ ඉල්ලුම්කරුගේ ඡායා රූපයක පිටපත් දෙකක් ;

(ඈ) ඉල්ලුම්කරු තමා විසින් රිය පැදවීම මගින් මහජනතාවට අනතුරක් සිදු විය හැකි අකාරයේ යම් රෝගයකින් හෝ මානසික හෝ ශාරීරික දුබලතාවයකින් පෙළෙන්නේද නැද්ද යන්න නියමිත ආකෘති පත්‍රයේ දක්වමින් කරනු ලබන ප්‍රකාශයක් ද,

ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) 122 වන වගන්තියේ උපලේඛනයේ 1(i), 1(ii), 2, 3 සහ 8 යන අයිතමවල නිශ්චිතව සඳහන් යම් පන්තියකට හෝ සෑම පන්තියකටම අයත් මෝටර් වාහන සඳහා වලංගු රියදුරු බලපත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලුම්කරුවෙකුට—

(අ) තමා වයස අවුරුදු 18ක් සම්පූර්ණ කළ බව ; සහ

(ආ) කොමසාරිස්-ජනරාල්වරයාගෙන් 'එල්' තහඩුව ලබා ගත් දිනයේ සිට අවම වශයෙන් මාස තුනක් පුහුණු වන රියදුරකු ලෙස කටයුතු කර ඇති බවට,

කොමසාරිස්-ජනරාල්වරයා සෑහීමකට පත් වන පරිදි ඔප්පු කළ යුතු ය.

(3) 122 වන වගන්තියේ උපලේඛනයේ 4(i), 4(ii), 5, 6(i), 6(ii), 7, 9 සහ 10 යන අයිතමවල නිශ්චිතව සඳහන් යම් වාහන පන්තියක් හෝ සෑම වාහන පන්තියකට අයත් මෝටර් වාහන පැදවීම සඳහා වලංගු රියදුරු බලපත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලුම්කරුවකුම—

(අ) තමා වයස අවුරුදු විසි එකක් සම්පූර්ණ කළ බව ;

(ආ) කොමසාරිස්-ජනරාල්වරයාගෙන් “එල්” තහඩු ලබාගත් දින සිට අවම වශයෙන් මාස තුනක කාලයක් සඳහා ඉල්ලීම කර ඇත්තේ යම් මෝටර් වාහන පන්තියක් සඳහා ද, ඒ පන්තියේ වාහනවල පුහුණු වන රියදුරකු ලෙස කටයුතු කර ඇති බවට ;

(ඇ) නියම කරනු ලැබිය හැකි පරිදි මෝටර් වාහනයේ යාන්ත්‍රනය පිළිබඳ ප්‍රමාණවත් ප්‍රායෝගික දැනුමක් ඉල්ලුම්කරුට ඇති බවට ;

(ඈ) නියම කරනු ලැබිය හැකි පරිදි අධ්‍යාපනික සහ වෙනත් සුදුසුකම් තමා සතු බවට ;

(ඉ) නියම කරනු ලැබිය හැකි කායික අවශ්‍යතා තමා සතුව ඇති බව ;

(ඊ) 122 වන වගන්තියේ උපලේඛනයේ 2 සහ 3 යන අයිතමවල නිශ්චිතව දක්වා ඇති පන්තියක හෝ පන්තිවල වාහනවලට වලංගු වන සාමාන්‍ය රියදුරු බලපත්‍රයක් ඔහු විසින් දරනු ලබන බවට,

කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් වන ආකාරයට ඔප්පු කළ යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියට 124ආ, 124ඇ, සහ 124ඈ අලුත් උපවගන්ති ඇතුළත් කිරීම.

**27.** ප්‍රධාන ප්‍රඥප්තියේ 124අ වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්ති ඇතුළත් කරනු ලබන අතර, ඒවා එම ප්‍රඥප්තියේ 124ආ, 124ඇ සහ 124ඈ වගන්ති වශයෙන් බලාත්මක විය යුතු ය :—

“මෝටර් වාහන අභියාචනා මණ්ඩලය.

124ආ. (1) (මින් මතු මෙම කොටසේ “මණ්ඩලය” යනුවෙන් සඳහන් කරනු ලබන) අවංකභාවය සහ

පිළිගැනීමක් ඇති, පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත මෝටර් වාහන අභියාචන මණ්ඩලයක් තිබිය යුතු ය:—

(අ) ප්‍රවාහන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නාමිකයකු ;

(ආ) ප්‍රවාහන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන විශ්‍රාමික මෝටර් වාහන පරීක්ෂකවරයකු ;

(ඇ) පොලිස්පතිවරයා විසින් පොලිස් දෙපාර්තමේන්තුවෙන් නම් කරනු ලබන එක් තැනැත්තකු.

(2) 123 වන වගන්තියේ (2) වන උපවගන්තිය සහ 124 වන වගන්තියට අනුකූලව ක්‍රියා කරන ලද රියදුරු බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කරන තැනැත්තකු කොමසාරිස් ජනරාල්වරයා විසින් ඔහුට රියදුරු බලපත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමේ තීරණයට එරෙහිව මණ්ඩලයට අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(3) අභියාචනය ඉදිරිපත් කරනු ලැබූ දිනයේ සිට දින තිහක් ඇතුළත දී මෝටර් වාහන අභියාචන මණ්ඩලය විසින් එම අභියාචනය මත ස්වකීය තීරණය පිළිබඳ ඉල්ලුම්කරුට සහ කොමසාරිස්-ජනරාල්වරයාට දැනුම් දිය යුතු අතර, කොමසාරිස්-ජනරාල්වරයා විසින් එම තීරණය බලාත්මක කළ යුතු ය.

වෛද්‍ය කමිටුව.

124ඇ. (1) අමාත්‍යවරයා විසින්—

(අ) මෝටර් ප්‍රවාහන කොමසාරිස්-ජනරාල්වරයා හෝ ඔහුගේ නාමිකයෙක් ;

(ආ) සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ-ජනරාල්වරයා හෝ ඔහුගේ නාමිකයෙක් ;

(ඇ) නිශ්චිත ක්ෂේත්‍රයේ විශේෂඥභාවයට පැමිණ සිටින, වෛද්‍ය ආඥාපනත යටතේ ලියාපදිංචි වී ඇති විශේෂඥ වෛද්‍ය නිලධරයකු ; සහ

(ඈ) ප්‍රවාහන විෂයය භාර අමාත්‍යාංශයේ නියෝජිතයකුගෙන්, සමන්විත වන වෛද්‍ය කමිටුවක් පත් කරනු ලැබිය යුතු ය ;

(2) වෛද්‍ය කමිටුවේ කාර්ය වනුයේ 124ඈ වගන්තිය යටතේ හෝ වෛද්‍ය වෘත්තිකයන් විසින් හෝ ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය විසින් සහතික නිකුත් කිරීම, ප්‍රතික්ෂේප කිරීමෙන් අතෘප්තියට පත් තැනැත්තන්ගෙන් ලැබෙන අභියාචන විභාග කිරීම වේ.

(3) ඉල්ලුම්කරුවකුගේ වෛද්‍ය තත්ත්වය සම්බන්ධයෙන් හෝ නිකුත් කරන ලද සහතිකයේ සඳහන් යම් වැදගත් කරුණු සම්බන්ධයෙන් වැරදි සහගත වන වෛද්‍ය සහතිකයක් සිතාමතාම නිකුත් කරන වෛද්‍යවරයකු වංචනික ලෙස වෛද්‍ය සහතිකයක් නිකුත් කිරීමේ වරදට වරදකරු වන අතර, එසේ වරදකරු කිරීමේ දී රුපියල් දසදහසකට නොඅඩු සහ රුපියල් විසිදහසකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු අතර, ශ්‍රී ලංකා වෛද්‍ය සභාවට එවැනි වෛද්‍යවරයකු සම්බන්ධයෙන් වාර්තා කරනු ලැබිය යුතු ය.

වෛද්‍ය කමිටුව වෙත ඉදිරිපත් කරන අභියාචනා.

124ඈ. (1) තමා වෙත වෛද්‍ය සහතිකයක් නිකුත් කිරීමට 124 වන වගන්තියේ සඳහන් වෛද්‍ය වෘත්තිකයකු විසින් කරන ලද ප්‍රතික්ෂේප කිරීමකින් හෝ ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයක් විසින් කරන ලද ප්‍රතික්ෂේප කිරීමකින් අතෘප්තියට පත් පුහුණුවන්නකුගේ අවසර පත්‍රයක් සහ සාමාන්‍ය රියදුරු බලපත්‍රයක් ඉල්ලුම් කළ ඉල්ලුම්කරුවකු විසින් එම ප්‍රතික්ෂේප කිරීමට එරෙහිව 124ඇ වගන්තිය යටතේ පත් කරන ලද වෛද්‍ය කමිටුවක් වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි ය.

(2) එම වෛද්‍ය කමිටුව (1) වන උපවගන්තියේ සඳහන් වෛද්‍ය වෘත්තිකයකු හැර වෙනත් ලියාපදිංචි වෛද්‍යවරයකු විසින් දින හතක් ඇතුළත එම

ඉල්ලුම්කරුව පරීක්ෂා කිරීමට කටයුතු සැලැස්විය යුතු අතර, රියදුරු බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා එම ඉල්ලුම්කරු සුදුසු බවට එම වෛද්‍ය වෘත්තිකයා සහතික කරන්නේ නම්, එම ඉල්ලුම්කරුට වෛද්‍ය සහතිකයක් නිකුත් කරනු ලැබ එම කරුණ ශ්‍රී ලංකා වෛද්‍ය සභාව වෙත වාර්තා කරනු ලැබිය යුතු ය.

**28.** ප්‍රධාන ප්‍රඥප්තියේ 125 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 125 වන වගන්තිය සංශෝධන කිරීම.

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියෙහි "ඒ සමඟ ඇති බලපත්‍රය" යන වචන වෙනුවට "ඒ සමඟ ඇති බලපත්‍රය සහ එම ආකෘති පත්‍රයේ කරන ලද යම් පිටසනක් ද එම රියදුරු බලපත්‍රය මත තබන ලද්දක් ලෙස සලකනු ලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එම වගන්තියේ (4) වන උපවගන්තියේ "නිකුත් කරනු නොලැබිය යුතු ය." යන වචන වෙනුවට "නිකුත් කරනු නොලැබිය යුතු ය : එසේ වුව ද, මහජන යහපතට අනර්ථකාරී වන බවට කොමසාරිස්-ජනරාල්වරයාට පෙනී යන අවස්ථාවක දී රියදුරු බලපත්‍රයක් නිකුත් කිරීම කොමසාරිස් ජනරාල්වරයා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය."යන වචන ආදේශ කිරීමෙන් ;

(3) එම වගන්තියේ (5) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න :—

"(5) (අ) වයස අවුරුදු දහඅටට එළඹ නොමැති කිසිම තැනැත්තකුට 122 වන වගන්තියේ (1) වන උපවගන්තියේ උපලේඛනයේ 1(i), 1(ii), 2, 3 සහ 8 යන අයිතමවල නිශ්චිතව දැක්වෙන පන්තියකට අයත් මෝටර් වාහන සම්බන්ධයෙන් ; සහ

(ආ) වයස අවුරුදු විසි එක සම්පූර්ණ කරන තුරු කිසිම තැනැත්තකුට 122 වන වගන්තියේ උපලේඛනයේ 4(i), 4(ii), 5, 6(i), 6(ii), 7, 9 සහ 10 යන අයිතමවල නිශ්චිතව දැක්වෙන පන්තියට අයත් මෝටර් වාහන සම්බන්ධයෙන්,

සාමාන්‍ය රියදුරු බලපත්‍රයක් නිකුත් කරනු නොලැබිය යුතු අතර, එවැනි යම් තැනැත්තකු සම්බන්ධයෙන් නිකුත් කරන ලද රියදුරු බලපත්‍රයක නීතියේ බලාත්මක භාවයක් හෝ බලපෑමක් නොතිබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 126 වන වගන්තිය සංශෝධන කිරීම.

**29.** ප්‍රධාන ප්‍රඥප්තියේ 126 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

(1) අමාත්‍යවරයා විසින් අන්‍යාකාරව නියම කරනු ලැබුවහොත් මිස, සහ 126අ වගන්තියේ (2) සහ (3) උපවගන්තිවල සහ 126ආ වන වගන්තියේ විධිවිධානවලට යටත්ව —

(අ) 122 වන වගන්තියේ උපලේඛනයේ 4(i), 4(ii), 5, 6(i), 6(ii), 7 සහ 9 යන අයිතමවල නිශ්චිතව සඳහන් යම් පන්තිවලට අයත් මෝටර් වාහන සම්බන්ධයෙන් නිකුත් කරන ලද සෑම පුහුණුවන්නකුගේ අවසර පත්‍රයක් සහ සාමාන්‍ය රියදුරු බලපත්‍රයක්ම අවුරුදු හතරක කාලයක් සඳහා වලංගු විය යුතු ය.

(ආ) 122 වන වගන්තියේ උපලේඛනයේ 1(i), 1(ii), 2, 3, 8 සහ 10 යන අයිතමවල නිශ්චිතව සඳහන් යම් පන්තියකට හෝ සෑම පන්තියකට අයත් මෝටර් වාහනයක් සම්බන්ධයෙන් නිකුත් කරන ලද සෑම පුහුණුවන්නකුගේ අවසර පත්‍රයක් සහ සාමාන්‍ය රියදුරු බලපත්‍රයක්ම අවුරුදු අටක කාලයක් සඳහා වලංගු විය යුතු ය.

(2) එම වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිවම එහි (4) වන සහ (5) වන උපවගන්ති ලෙස බලාත්මක විය යුතු පහත දැක්වෙන උපවගන්ති එකතු කිරීමෙන් :—

"(4) තමාගේ රියදුරු බලපත්‍රය අත්හිටුවනු ලැබූ හෝ අවලංගු කරනු ලැබූ කාලය ඇතුළත, නැතහොත් එම බලපත්‍රයේ වලංගු කාලය අවසන් වීමෙන් පසු මෝටර් වාහනයක් මහා මාර්ගයේ පදවන යම් තැනැත්තෙක්

”.



වරදකට වරදකරු වන අතර, වරදකරු කිරීමේ දී රුපියල් පන්දහසකට නොඅඩු සහ රුපියල් දසදහසකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

(5) 122 වන වගන්තිය යටතේ නිශ්චිත දැක්වෙන යම් වාහන පන්තියක් හෝ පන්ති සඳහා මේ පනත යටතේ නිකුත් කරන ලද රියදුරු බලපත්‍ර වලංගු කාල සීමාව නියම කරමින් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය”.

ප්‍රධාන ප්‍රඥප්තියට 126ආ හා 126ඇ වගන්තිය ඇතුළත් කිරීම.

**30.** ප්‍රධාන ප්‍රඥප්තියේ 126අ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති එම ප්‍රඥප්තියේ 126ආ සහ 126ඇ වගන්ති ලෙස බලාත්මක විය යුතු ය:—

“ රියැදුරු බලපත්‍ර අලුත් කිරීම.

126ආ. (1) 126 වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්තිවල සහ 126අ වගන්තියේ විධිවිධානවලට යටත්ව සෑම රියදුරු බලපත්‍රයක්ම, එය නිකුත් කරනු ලැබූ කාලය අවසන් වීමේදී, 122 වන වගන්තියේ උපලේඛනයේ 1(i), 1(ii), 2, 3, 8 සහ 10 යන අයිතමවල නිශ්චිතව සඳහන් පන්තියකට අයත් මෝටර් වාහනයන් සම්බන්ධයෙන් වන විට, එක් වරකට අවුරුදු අටක තවදුරටත් වූ කාලයක් සඳහා ද, 122 වන වගන්තියේ උපලේඛනයේ 4(i), 4(ii), 5, 6(i), 6(ii), 7, සහ 9 යන අයිතමවල නිශ්චිතව සඳහන් පන්තියක මෝටර් වාහනයක් සම්බන්ධයෙන් වන විට, එක් වරකට අවුරුදු හතරක තවදුරටත් වූ කාලයක් සඳහා ද අලුත් කරනු ලැබිය යුතු ය.

(2) රියදුරු බලපත්‍රයන් අලුත් කිරීම සඳහා සෑම ඉල්ලීමක්ම නියමිත ආකෘති පත්‍රයෙහි ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, ඒ සමග—

(අ) (i) 122 වන වගන්තියේ උපලේඛනයේ 1(i) 1(ii), 2, 3 සහ 8 යන අයිතමවල සඳහන් පන්තිවලට අයත් වාහනයක් සම්බන්ධයෙන් වන විට, ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරනු ලබන්නේ යම් වාහන පන්තියක් හෝ පන්ති සම්බන්ධයෙන් ද, ඒ

පන්තියට හෝ පන්තිවලට අයත් වාහන පැදවීම සඳහා ඉල්ලුම්කරු ශාරීරික වශයෙන් යෝග්‍ය බවට සහතික කරමින් (105 අධිකාරය වූ) වෛද්‍ය අඥාපනත යටතේ ලියාපදිංචි වූ ද, 1997 අංක 25 දරන ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතන පනත යටතේ පිහිටුවනු ලැබූ ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් බලය පවරනු ලැබුවා වූ ද වෛද්‍ය වෘත්තිකයකුගෙන් ලබා ගත් වෛද්‍ය සහතිකයක් ; සහ

(ii) 122 වන වගන්තියේ උපලේඛනයේ 4(i), 4(ii), 5, 6(i), 6(ii), 7, 9 සහ 10 යන අයිතමවල නිශ්චිතව සඳහන් වාහන පන්තියක් හෝ පන්ති සම්බන්ධයෙන් වන විට, ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරනු ලබන්නේ යම් වාහන පන්තියක් හෝ පන්ති සම්බන්ධයෙන් ද, ඒ පන්තියට හෝ පන්තිවලට අයත් වාහන පැදවීම සඳහා ඉල්ලුම්කරු ශාරීරික වශයෙන් යෝග්‍ය බවට (105 වන අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනත යටතේ ලියාපදිංචි වූ ද, ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය විසින් හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් බලය පවරන ලද වෛද්‍ය වෘත්තිකයකු විසින් නිකුත් කරන ලද වෛද්‍ය සහතිකයක් ;

(ආ) නියමිත අයභාරය ; සහ

(ඇ) නියමිත ප්‍රමාණයකින් යුක්ත වූ ද, ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කිරීමේ දිනයට පෙරාතුව වූ මාස හයක කාලයක් ඇතුළත ගනු ලැබුවා වූ ද, ඉල්ලුම්කරුගේ ඡායාරූප පිටපත් දෙකක් ද,

ඉදිරිපත් කළ යුතු ය.

(3) රියදුරු බලපත්‍රයක් අලුත් කිරීම සඳහා වූ සෑම ඉල්ලීමක්ම, තත්කාලයේ බලපවත්නා රියදුරු බලපත්‍රයේ කාලය අවසන් වීමට මාස තුනකට පෙර කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 128 වන වගන්තිය සංශෝධනය කිරීම.

**31.** ප්‍රධාන ප්‍රඥප්තියේ 128 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) යම් රියදුරු බලපත්‍රයක් සියලු වාහන පන්ති සඳහා වලංගු බවට ප්‍රකාශිතව සඳහන් කර තිබේ නම් මිස, 122 වන වගන්තියේ උපලේඛනයේ 3 වන තීරයේ නිශ්චිතව දැක්වෙන මෝටර් වාහන පන්තිය හෝ පන්ති සඳහා පමණක් වලංගු වන්නේ ය.";.

(2) එහි (2) වන හා (4) වන උපවගන්ති ඉවත් කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියට 128අ සහ 128ආ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

**32.** ප්‍රධාන ප්‍රඥප්තියේ 128 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එම වගන්ති එම ප්‍රඥප්තියේ 128අ සහ 128ආ වගන්ති ලෙස බලාත්මක විය යුතු ය:—

"හදිසි සේවා වාහන සහ පොදු සේවා වාහන.

128අ. (1) මෝටර් වාහනවල යම් පන්තියක් හෝ පන්ති සඳහා වලංගු රියැදුරු බලපත්‍රයක් දරන යම් තැනැත්තකුට, තම රියදුරු බලපත්‍රයේ කොමසාරිස්-ජනරාල්වරයා විසින් විශේෂ සටහනක් මගින් හදිසි සේවා වාහන හෝ පොදු සේවා වාහන පැදවීම සඳහා බලය පවරා ඇත්නම් මිස, එවැනි වලංගු රියැදුරු බලපත්‍රයක් දරන කිසිම තැනැත්තකු විසින් හදිසි සේවා වාහනයක් හෝ පොදු සේවා වාහනයක් නොපැදවිය යුතු ය.

(2) යම් මාර්ගයක හදිසි සේවා වාහනයක් හෝ පොදු සේවා වාහනයක් පැදවීමට අදහස් කරන යම් තැනැත්තකු විසින් නියමිත අයභාරය සමඟ නියමිත ආකෘති පත්‍රයකින් කොමසාරිස්-ජනරාල්වරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතු ය.

(3) අවස්ථාවෝචිත පරිදි, හදිසි සේවා වාහනයක් හෝ පොදු සේවා වාහනයක් පැදවීම සඳහා රියැදුරු බලපත්‍රයක් දරන්නකුට බලය පවරමින් රියැදුරු බලපත්‍රයක් මත පිටසනක් කිරීම සඳහා සුදුසුකම් ලැබීමට අවශ්‍යතා, සුදුසුකම් සහ පැවැත්විය යුතු පරීක්ෂණ නියම කරමින් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

විශේෂ කාර්ය වාහන.

128ආ. (1) විශේෂ කාර්ය වාහනයක් පැදවීමට අදහස් කරන යම් තැනැත්තකු නියමිත ගාස්තුව සමග නියමිත ආකෘති පත්‍රයකින් කොමසාරිස්-ජනරාල්වරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතු ය.

(2) තැනැත්තකු විශේෂ කාර්ය වාහනයක් පැදවීම සඳහා සුදුසුකම් ලබන්නේ ද යන්න නිශ්චය කිරීමේ කාර්යය සඳහා සපුරාලිය යුතු සුදුසුකම් සහ පැවැත්විය යුතු පරීක්ෂණය කවරේද යන්න නියම කරමින් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 132 වන වගන්තිය සංශෝධනය කිරීම.

**33.** ප්‍රධාන ප්‍රඥප්තියේ 132 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ “මාස තුනකට නොවැඩි” යන වචන වෙනුවට “මාස දොළහකට නොවැඩි” යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) එම වගන්තියේ (5) වන උපවගන්තියේ “නිකුත් කිරීමට නොවිය යුතු ය.” යන වචන වෙනුවට “නිකුත් කිරීමට විය යුතු ය.” යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියට අලුත් 132අ සහ 132ආ වගන්ති ඇතුළත් කිරීම.

**34.** ප්‍රධාන ප්‍රඥප්තියේ 132 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා එම ප්‍රඥප්තියේ 132අ සහ 132ආ වගන්ති ලෙස බලාත්මක විය යුතු ය :—

“ජාත්‍යන්තර රියැදුරු අවසර පත්‍රය.

132අ. (1) මේ පනතේ VII වන කොටස යටතේ නිකුත් කරන ලද රියදුරු බලපත්‍රයක් දරන්නකු වන ශ්‍රී ලංකාවේ සාමාන්‍යයෙන් පදිංචිව සිටින තැනැත්තකු විසින්, මෙහි මින් මතු විධිවිධාන සලසා ඇති ආකාරයට කරනු ලබන ඉල්ලීමක් මත, එක්දහස් නවසිය හැට අටේ නොවැම්බර් මස අට වන දින පවත්වන ලද රථවාහන ගමනාගමනය පිළිබඳ වියානා සම්මුතියට අත්සන් තබා ඇති ගිවිසුම් රාජ්‍ය හෝ දේශයන්හි එම තැනැත්තා සිටින විට දී වාහන පැදවීම සඳහා ඔහුට බලය පවරන ජාත්‍යන්තර රියදුරු අවසර පත්‍රයක් ඔහු විසින් ලබාගත හැකි ය.

(2) එවැනි රියදුරු අවසර පත්‍රයක් සඳහා වූ ඉල්ලීමක් නියමිත ආකෘති පත්‍රයෙහි විය යුතු අතර, ඒ සමග නියමිත අයභාරය ද ඉදිරිපත් කළ යුතු ය. එවැනි ඉල්ලීමක් නියමිත සංගමය වෙත (ශ්‍රී ලංකාවේ

නම් ලංකා ඔටෝ මොබයිල් සංගමය වෙත) ඉදිරිපත් කළ යුතු අතර, එම සංගමය විසින් එම ඉල්ලීම කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(3) ජාත්‍යන්තර රියදුරු අවසර පත්‍රයක් නිකුත් කිරීමට පෙර, කොමසාරිස්-ජනරාල්වරයා විසින් තත්කාර්ය සඳහා පත් කරනු ලබන බලයලත් නිලධරයකු විසින් ජාත්‍යන්තර රියදුරු අවසර පත්‍රයක් සඳහා ඉල්ලුම් කරන සෑම තැනැත්තෙක්ම පරීක්ෂා කරනු ලැබිය යුතු ය.

(4) එවැනි ජාත්‍යන්තර රියදුරු අවසර පත්‍රයක් නිකුත් කිරීමේ දින සිට අවුරුදු එකක කාලයක් සඳහා වලංගුව පැවතිය යුතු ය.

(5) මේ පනතේ කාර්ය සඳහා "නියමිත සංගමය" යන්නෙන්, ලංකා ඔටෝ මොබයිල් සංගමය හෝ අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක නිශ්චිතව දැක්විය හැකි ස්විට්සර්ලන්තයේ අලියොන්ස් ඉන්ටනැෂනල් ඩී ටුවරිසම් ඉන් ජිනීවා ආයතනයට අනුබද්ධිත වෙනත් යම් සංගමයක් අදහස් වේ.

ජාත්‍යන්තර රියැදුරු අවසර පත්‍රය හෝ සහතිකය ශ්‍රී ලංකාවේ දී පිළිගැනීම.

132ආ. එක්දහස් නවසිය හැට අටේ නොවැම්බර් මස අටවන දින පවත්වන ලද වියනා සම්මුතියේ ගිවිසුම් රාජ්‍යවලින් එකක් හෝ එම ගිවිසුමට එකඟ වී ඇති රාජ්‍ය හෝ දේශවලින් එකක් විසින් නිකුත් කරන ලද වලංගු ජාත්‍යන්තර රියදුරු අවසර පත්‍රයක සන්තකය දරන සහ ශ්‍රී ලංකාවේ සද්භාවී ආගන්තුකයකු වන යම් තැනැත්තෙක් මේ පනතේ විධිවිධාන යටතේ නිකුත් කරන ලද රියදුරු බලපත්‍රයක සහතිකය දරන්නකු ලෙස සලකනු ලැබිය යුතු අතර, එම රියදුරු අවසර පත්‍රයේ නිශ්චිතව දැක්වෙන පන්තියට හෝ පන්තිවලට අයත් වාහන පැදවීම සඳහා ඔහුට බලය පවරා ඇති ලෙස සලකනු ලැබිය යුතු ය :

එසේ වුව ද,—

(අ) අවසර පත්‍රය වලංගු වන්නේ 1968 වියනා සම්මුතියේ 41 වන ව්‍යවස්ථාවේ අර්ථානුකූලවය ;

(ආ) එම රියදුරු අවසර පත්‍රය දරන්නා විසින් ශ්‍රී ලංකාවෙහි රිය පදවන විට එම අවසර පත්‍රය රැගෙන යා යුතු අතර, පරීක්ෂා කිරීම සඳහා පොලිස් නිලධරයකු හෝ මෝටර් වාහන පරීක්ෂකවරයකු විසින් ඉල්ලා සිටිනු ලැබුවහොත් එම අවසර පත්‍රය ඉදිරිපත් කරනු ලැබිය යුතු ය ; සහ

(ඇ) 1968 වියානා සම්මුතියේ 41 වන ව්‍යවස්ථාවේ දක්වා ඇති කොන්දේසි අවසර පත්‍රය දරන්නා විසින් සෑම ආකාරයකින්ම සපුරාලිය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 133අ වගන්තිය සංශෝධනය කිරීම.

**35.** ප්‍රධාන ප්‍රඥප්තියේ 133අ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

(1) පුහුණුවන්නකුගේ අවසර පත්‍රයක් සහ සාමාන්‍ය රියදුරු බලපත්‍රයක් දරන්නකු මේ වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් නියම කරන ලද වරදකට වරදකරු කරනු ලැබ, ඒ දරන්නාගේ පුහුණුවන්නකුගේ අවසර පත්‍රය හෝ සාමාන්‍ය රියදුරු බලපත්‍රය අවලංගු කිරීම හෝ අත්හිටුවීම අධිකරණය විසින් කරනු නොලැබූ අවස්ථාවක දී, ඒ දරන්නා වරදකරු කරනු ලැබුවේ යම් වරදකට ද ඒ වරද සම්බන්ධයෙන් නියමිත රියැදුරු අභිවෘද්ධි ලකුණු ප්‍රමාණය, අධිකරණය විසින්—

(අ) ඒ බලපත්‍රය දරන්නාගේ පුහුණුවන්නකුගේ අවසර පත්‍රය හෝ සාමාන්‍ය රියදුරු බලපත්‍රය ඇති අවස්ථාවක ඒ බලපත්‍රයෙහි සටහන් කළ හැකි ය. නැතහොත් එසේ සටහන් කිරීමට සලසනු ලැබිය හැකි ය ; නැතහොත්

(ආ) ඒ දරන්නාගේ පුහුණුවන්නකුගේ අවසර පත්‍රය හෝ සාමාන්‍ය රියදුරු බලපත්‍රය ලබා ගත නොහැකි නම් ඒ දරන්නාගේ අවසර පත්‍රයෙහි හෝ බලපත්‍රයෙහි, එම අවසර පත්‍රය හෝ බලපත්‍රය දරන්නා වරදකරු කරනු ලැබුවේ යම් වරදක් සඳහා ද, එම වරද සම්බන්ධයෙන් නියමිත රියදුරු අභිවෘද්ධි ලකුණු යම් ප්‍රමාණයක්, සටහන් කිරීමට කොමසාරිස් ජනරාල්වරයාට නියම කළ හැකි ය :

එසේ වුව ද, මයික්‍රෝ චිපයක් නොමැතිව කාඩ්පතක් නිකුත් කර ඇති පුහුණුවන්නකුගේ අවසර පත්‍රයක් සහ සාමාන්‍ය රියදුරු බලපත්‍රයක් සම්බන්ධයෙන් වන විට, 125 වන වගන්තිය යටතේ නියම කර ඇති පිටසන් පත්‍රයෙහි එම සටහන තබනු ලැබිය යුතු අතර, එසේ තබනු ලැබූ සටහන මේ පනතේ කාර්යය සඳහා, එම රියදුරු බලපත්‍රය මත තබනු ලැබූ සටහනක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ අතුරු විධානයට ඉක්බිතිව ම (1අ) උපවගන්තිය ලෙස බලාත්මක විය යුතු පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

(1අ) පුහුණුවන්නකුගේ අවසර පත්‍රයක් සහ සාමාන්‍ය රියදුරු බලපත්‍රයක් දරන්නකු විසින් මේ වගන්තිය යටතේ නියම කර ඇති යම් වගන්තියක් උල්ලංඝනය කිරීමේ වගකීම පොලිස් නිලධරයකු විසින් කරනු ලැබූ සොයා ගැනීමකින් පසුව පිළිගනු ලැබ ඇති අවස්ථාවක, එම උල්ලංඝනය කිරීම පිළිබඳව නඩු පවරනු ලැබීම වෙනුවට ඒ වරද සම්බන්ධයෙන් නියමිත දඩය ගෙවනු ලබන අවස්ථාවක දී, සැරයන්වරයකු හෝ ඊට ඉහළ තනතුරක් දරන යම් පොලිස් නිලධරයකු විසින් උපවගන්තිය යටතේ නියමිත ආකෘති පත්‍රයේ එම දඩ මුදල සටහන් කර එසේ කරන ලද සටහනේ පිටපතක් වාර්තා කිරීමේ කාර්යය සඳහා කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, කොමසාරිස් ජනරාල්වරයා විසින් එම වාර්තාව ලැබුණු විට, මේ වගන්තිය යටතේ ඒ වරද සම්බන්ධයෙන් නියමිත රියදුරු අභිවෘද්ධි ලකුණු සංඛ්‍යාව, එම පුහුණුවන්නකුගේ අවසර පත්‍රයෙහි හෝ සාමාන්‍ය රියදුරු බලපත්‍රයේ සටහන් කරනු ලැබිය යුතු ය.

(3) එම වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(3) යම් අධිකරණයක් විසින් යම් රියදුරු බලපත්‍රයක් මත (1) වන උපවගන්තිය යටතේ රියදුරු අභිවෘද්ධි ලකුණු සටහන් කර ඇති හෝ සටහන් කිරීමට සලස්වනු ලැබ ඇති අවස්ථාවක දී, එම අධිකරණය විසින් රියදුරු බලපත්‍රයේ තබන ලද සටහනේ පිටපතක් කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

මේ වගන්තියේ කාර්යය සඳහා, මේ වගන්තිය යටතේ නියමිත සෑම වරදක් ම කිරීම සම්බන්ධයෙන් පොලිස්පතිවරයා විසින් කොමසාරිස් ජනරාල්වරයාට දැනුම් දිය යුතු ය.

(4) එම වගන්තියේ (4) වන උපවගන්තියට ඉක්බිතිව ම, (5) වන උපවගන්තිය වශයෙන් බලාත්මක විය යුතු පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(5) අමාත්‍යවරයා විසින්, වැරදි නියම කරමින් සහ එම වැරදි කිරීම මත රියදුරු බලපත්‍රයක් මත සටහන් කළ යුතු හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් ලබාදිය යුතු රියදුරු අභිවෘද්ධි ලකුණු සංඛ්‍යාව නියම කරමින් නියෝග සාදනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 135 වන වගන්තිය සංශෝධනය කිරීම.

**36.** ප්‍රධාන ප්‍රඥප්තියේ 135 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ අතුරු විධානයෙහි "එහි වලංගු භාවය දීර්ඝ කිරීම" යන වචන වෙනුවට "එහි වලංගු භාවය දීර්ඝ කිරීම, ප්‍රතියෝජනය කිරීම, අලුත් කිරීම හෝ අතිරේක පිටපත් යෙදීම" යන වචන ආදේශ කිරීමෙන් :—

(2) (1) වන උපවගන්තියේ අතුරු විධානයට ඉක්බිතිවම එහි (1අ), (1ආ), (1ඇ) සහ (1ඈ) උපවගන්ති වශයෙන් බලාත්මක විය යුතු පහත දැක්වෙන අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන් :—

(1අ) මෝටර් වාහනයක් පදවන විට පිටපත් පත්‍රය ඇතුළු වලංගු පුහුණුවන්නකුගේ අවසර පත්‍රය සහ

සාමාන්‍ය රියදුරු බලපත්‍රයක් රැගෙන යාම පැහැර හරින යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දෙදහස් පන්සියයකට නොඅඩු සහ රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය ;

(1ආ) මෝටර් වාහනයක රියදුරකුගේ සන්තකයෙහි වලංගු පුහුණුවන්නකුගේ අවසර පත්‍රයක් සහ සමාන්‍ය රියදුරු බලපත්‍රයක් නොමැති විට පොලිස් නිලධරයකු විසින් එම මෝටර් වාහනයේ රියදුරා වලංගු පුහුණුවන්නකුගේ අවසර පත්‍රයක් හෝ සාමාන්‍ය රියදුරු බලපත්‍රයක් ඉදිරිපත් කරන තුරු ඔහු රඳවා තබා ගනු ලැබිය හැකි ය. එම රියදුරාට වලංගු පුහුණුවන්නකුගේ අවසර පත්‍රයක් හෝ සාමාන්‍ය රියදුරු බලපත්‍රයක් නොමැති බවට සොයා ගනු ලැබුවහොත් එම මෝටර් වාහනයේ එම රියදුරා සහ අයිතිකරු යන දෙදෙනාම වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කරනු ලැබීමේ දී රුපියල් තුන් දහසකට නොඅඩු සහ රුපියල් හය දහසකට නොවැඩි දඩයකට හෝ මාස හයකට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට ඔවුන් යටත් විය යුතු ය :

එසේ වුව ද, එම මෝටර් වාහනයේ අයිතිකරුගේ අනුදැනුමකින් තොරව එම මෝටර් වාහනය රැගෙන ගොස් ඇති බව අධිකරණය සෑහීමකට පත් වන පරිදි එම අයිතිකරු විසින් ඔප්පු කරනු ලැබුවහොත් ඔහු වරදකට වරදකරු ලෙස සලකනු නොලැබිය යුතු ය.

(1ඇ) (අ) පොලිස් නිලධරයකු විසින් ඉල්ලා සිටිනු ලැබීමේ දී පුහුණුවන්නකුගේ අවසර පත්‍රය සහ සාමාන්‍ය රියදුරු බලපත්‍රය මෝටර් වාහනයක රියදුරකු විසින් ඉදිරිපත් කිරීම සිතා මතාම පැහැර හරින අවස්ථාවක දී, එම පොලිස් නිලධරයා විසින් එම රියදුරා සහ වාහනය අත් අඩංගුවට ගෙන එම රියදුරා විමර්ශන කටයුතු සඳහා ළඟම ඇති පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කළ යුතු ය ;

(ආ) පොලිස් නිලධරයකු විසින් ඉල්ලා සිටිනු ලැබීමේ දී පුහුණුවන්නකුගේ අවසර පත්‍රය හෝ සාමාන්‍ය රියදුරු බලපත්‍රය හෝ පිටසන් පත්‍රය ඉදිරිපත් කිරීම සිතා මතාම පැහැර හරින යම් තැනැත්තෙක් වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පන් දහසකට අඩු නොවන සහ රුපියල් දසදහසකට වැඩි නොවන දඩයකට ඔහු යටත් විය යුතු ය :

එසේ වුවද, උද්දේශිත උල්ලංඝනය කිරීම සිදු වූ අවස්ථාවේ දී තමාගේ පුහුණුවන්නකුගේ අවසර පත්‍රය හෝ සාමාන්‍ය රියදුරු බලපත්‍රය හෝ පිටසන් පත්‍රය අතිරේක සටහනක් යොදා ගැනීම සඳහා හෝ එහි වලංගු භාවය දීර්ඝ කිරීම සඳහා හෝ ප්‍රතියෝජනය කිරීම සඳහා හෝ අලුත් කිරීම සඳහා කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කර ඇති බවට අධිකරණය සෑහීමට පත් වන පරිදි යම් තැනැත්තකු විසින් ඔප්පු කරනු ලබන්නේ නම් ඔහු මේ වගන්තිය යටතේ වරදකට වරදකරු ලෙස සලකනු නොලැබිය යුතු ය ;

(1ඈ) (අ) දුර්වර්ණ වී ඇති, අකුරු මැකී ඇති, කැඩී බිඳී ගිය හෝ අපැහැදිලි පුහුණුවන්නකුගේ අවසර පත්‍රය හෝ සාමාන්‍ය රියදුරු බලපත්‍රයක් හෝ පිටසන් පත්‍රයක් රැගෙන යමින් හෝ සන්තකයේ තබා ගෙන කිසිම තැනැත්තකු විසින් මෝටර් වාහනයක් නොපැදවිය යුතු ය ;

(ආ) (අ) ඡේදයේ විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තෙක් මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කරනු ලැබීමේ දී, 224 වන වගන්තියේ සඳහන් දණ්ඩනයට ඔහු යටත් විය යුතු ය.

(3) එම වගන්තියේ (5) වන උපවගන්තියේ "පිටසනක් මගින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි ය." යන වචන වෙනුවට "පිටසනක් මගින් නිශ්චිතව දැක්වීමට කටයුතු සලස්වනු ලැබිය හැකි ය." යන වචන ආදේශ කිරීමෙන්.

**37.** ප්‍රධාන ප්‍රඥප්තියේ 138 වන වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිවම (1අ) උපවගන්තිය වශයෙන් බලාත්මක විය යුතු පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 138 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1අ) (අ) මේ පනත යටතේ වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ මෝටර් වාහනයක් පැදවීමට අදාළවූ වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් තමාගේ පුහුණුවන්නකුගේ අවසර පත්‍රය සහ සාමාන්‍ය රියදුරු බලපත්‍රය පොලීසියේ හෝ යම් අධිකරණයක භාරයේ ඇති යම් තැනැත්තකු අලුත් පුහුණුවන්නකුගේ අවසර පත්‍රයක් හෝ සාමාන්‍ය රියදුරු බලපත්‍රයක් හෝ පුහුණුවන්නකුගේ අවසර පත්‍රයේ හෝ සාමාන්‍ය රියදුරු බලපත්‍රයේ අනු පිටපතක් සඳහා ඉල්ලුම් කරන්නේ නම්, එම තැනැත්තා මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, එසේ ලබාගන්නා බලපත්‍රයක් බලාත්මක නොවිය යුතු ය ;

(ආ) මේ වගන්තියේ (අ) ඡේදය යටතේ වරදකට වරදකරු වන යම් තැනැත්තෙක් වරදකරු කිරීමේ දී රුපියල් පන් දහසකට අඩු නොවන සහ රුපියල් දස දහසකට වැඩි නොවන දඩයකට යටත් විය යුතු අතර, දෙවන හෝ පසු අවස්ථාවක දී වරදකරු වීමේ දී රුපියල් දස දහසකට අඩු නොවන සහ රුපියල් විසි දහසකට වැඩි නොවන දඩයකට ද රියැදුරු බලපත්‍රය අවලංගු කිරීමට ද ඔහු යටත් වන්නේ ය.

(ඇ) යම් අවස්ථාවක දී කොමසාරිස්-ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද රියදුරු බලපත්‍ර එකකට වැඩි සංඛ්‍යාවක් හෝ නීත්‍යානුකූල අයිතියක් නොමැතිව වෙනත් තැනැත්තකුගේ රියදුරු බලපත්‍රයක් යම් තැනැත්තකු විසින් තම සන්තකයේ තබා ගන්නේ නම් ඔහු වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දස දහසකට අඩු නොවන සහ රුපියල් පහළොස් දහසකට වැඩි නොවන දඩයකට සහ එම රියදුරු බලපත්‍රය රාජ සන්තක කරනු ලැබීමට ඔහු යටත් වන්නේ ය.

**38.** ප්‍රධාන ප්‍රඥප්තියේ 138 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එහි 138 අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :— ප්‍රධාන ප්‍රඥප්තියට 138අ වගන්තිය ඇතුළත් කිරීම.

"පදිංචිය වෙනස් වීම කොමසාරිස්-ජනරාල්වරයාට දැනුම් දිය යුතු බව. 138අ. (1) රියැදුරු බලපත්‍රයක් දරන සෑම තැනැත්තකු විසින්ම තමාගේ පදිංචිය හෝ තැපැල් ලිපිනය වෙනස් වුවහොත් එම වෙනස් වීමේ දින සිට දින තිහක් ඇතුළත තමාගේ නව තැපැල් ලිපිනය පිළිබඳව ලියාපදිංචි තැපෑලෙන් හෝ පෞද්ගලිකව

ලිපියක් භාර දීමෙන් කොමසාරිස්-ජනරාල්වරයා වෙත දැනුම් දිය යුතු අතර, කොමසාරිස්-ජනරාල්වරයා විසින් එම වෙනස් වීම අදාළ පිටසන් පත්‍රයේ පිටසන් කර උචිත ලේඛනවල වාර්තා කළ යුතු ය.”.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන කඩ කරන යම් තැනැත්තෙක් මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කරනු ලැබීමේ දී 224 වන වගන්තියේ නිශ්චිතව දැක්වෙන දණ්ඩනයට ඔහු යටත් විය යුතු ය.”.

VIIඅ කොටසට ශීර්ෂයක් ඇතුළත් කිරීම.

**39.** ප්‍රධාන ප්‍රඥප්තියේ VIIඅ කොටසට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ශීර්ෂය මෙයින් ඇතුළත් කරනු ලැබේ :—

**“රියදුරු පාසල්වලට සහ උපදේශකයන්ට බලපත්‍ර ලබා දීම.”**

ප්‍රධාන ප්‍රඥප්තියේ 139අ වගන්තිය සංශෝධනය කිරීම.

**40.** ප්‍රධාන ප්‍රඥප්තියේ 139අ වගන්තිය, එහි (2) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

“(2) (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පන් දහසකට නොඅඩු දඩයකට සහ රුපියල් දස දහසකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම ද, දෙවන හෝ පසු අවස්ථාවක දී වරදකරු වීමේ දී රුපියල් පහළොස් දහසකට නොඅඩු සහ රුපියල් විසිපන් දහසකට නොවැඩි දඩයකට හෝ අවුරුදු එකකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම ඔහු යටත් විය යුතු ය.”

ප්‍රධාන ප්‍රඥප්තියේ 139ආ වගන්තිය සංශෝධනය කිරීම.

**41.** ප්‍රධාන ප්‍රඥප්තියේ 139ආ වගන්තිය, එහි (2) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

“(2) යම් තැනැත්තකු—

(අ) 139ආආ වගන්තිය යටතේ නිශ්චිතව දක්වා ඇති පන්තියකට අයත් උපදේශක බලපත්‍රයක් තමා වෙත

නිකුත් කරවා ගැනීම සඳහා සුදුස්සකු කරවන, එකී වගන්තිය යටතේ නිශ්චිතව දක්වා ඇති පන්තියකට අයත් වලංගු රියදුරු බලපත්‍රයක් දරනු ලබන්නේ නම් මිස ; සහ

(ආ) නියම කරනු ලැබිය හැකි යෝග්‍ය සුදුසුකම් සහ පළපුරුද්ද ඔහු සන්තකයේ ඇත්නම් මිස,

ඒ තැනැත්තා වෙත කිසිම පන්තියකට අයත් උපදේශක බලපත්‍රයක් නිකුත් කරනු නොලැබිය යුතු ය.”

ප්‍රධාන ප්‍රඥප්තියේ 139ආආ වගන්තිය ඇතුළත් කිරීම.

**42.** ප්‍රධාන ප්‍රඥප්තියේ 139ආ වගන්තියට ඉක්බිතිවම 139ආආ වශයෙන් බලාත්මක විය යුතු පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලැබේ:—

“උපදේශක බලපත්‍රය සහ සහකාර උපදේශක බලපත්‍රය.

139ආආ. (1) එනම්, ඒ පන්තිය, බී පන්තිය සහ සී පන්තිය නම් වූ පන්ති තුනකට මේ කොටස යටතේ නිකුත් කරන ලද උපදේශකයකුගේ බලපත්‍රයක් පන්ති තුනකට බෙදනු ලැබිය හැකි ය.

(2) සහකාර උපදේශකයකුගේ බලපත්‍රයක් සී පන්තියේ බලපත්‍රයක් විය යුතු ය.

(3) යම් උපදේශකයකු හෝ සහකාර උපදේශකයකු ඉල්ලුම් කිරීමට පෙරාතුවම අවම වශයෙන් අවුරුදු පහක කාලයක් සඳහා 122 වන වගන්තියේ උප ලේඛනයේ 1(i), 1(ii), 2 සහ 3 යන අයිතම වල නිශ්චිතව දැක්වෙන මෝටර් වාහන පන්තියක් හෝ පන්ති සඳහා වලංගු බවට ප්‍රකාශිත වලංගු සාමාන්‍ය බලපත්‍රයක් දරා ඇත්නම් එම උපදේශක හෝ සහකාර උපදේශක සී පන්තියේ බලපත්‍රයක් ලැබීමට සුදුස්සකු වන්නේ ය. එම උපදේශකයාගේ හෝ සහකාර උපදේශකයාගේ බලපත්‍රය මගින් 122 වගන්තියේ උපලේඛනයේ 1(i), 1(ii), 2, 3 සහ 8 යන අයිතමවල නිශ්චිතව සඳහන් මෝටර් වාහන පන්තියක් හෝ පන්තිවල පුහුණු වන්නන්ට උපදෙස් දීමට ඒ රියදුරු උපදේශකයාට හෝ සහකාර උපදේශකයාට බලය පැවරේ.

(4) යම් තැනැත්තකු ඉල්ලුම් කිරීමට පෙරාතුවම වූ අවම වශයෙන් අවුරුදු පහක කාලයක් සඳහා 122 වන වගන්තියේ උපලේඛනයේ 1(i) සහ 6 යන අයිතමවල නිශ්චිතව දැක්වෙන මෝටර් වාහන පන්තියක් හෝ පන්ති සඳහා වලංගු බවට ප්‍රකාශිත වලංගු රියදුරු බලපත්‍රයක් දරන්නකුව සිටියේ නම්, එම තැනැත්තා බී පන්තියේ උපදේශක බලපත්‍රයක් ලැබීමට සුදුස්සකු වන්නේ ය. එවැනි උපදේශක බලපත්‍රයක් මගින් එම තැනැත්තාට, 122 වන වගන්තියේ උපලේඛනයේ 1(i), 1(ii), 2, 3, 4(i), 4(ii), 6(i), 6(ii), 8, සහ 10 යන අයිතමවල නිශ්චිතව දැක්වෙන මෝටර් වාහන පන්තියක් හෝ පන්තිවල පුහුණු වන්නන්ට උපදෙස් දීම සඳහා බලය පවරනු ලැබේ.

(5) යම් තැනැත්තකු ඉල්ලුම් කිරීමට පෙරාතුවම අවම වශයෙන් අවුරුදු පහක කාලයක් සඳහා 122 වන වගන්තියේ උපලේඛනයේ 1(i), 5 සහ 7 යන අයිතමවල නිශ්චිතව දැක්වෙන මෝටර් වාහන පන්තියක හෝ පන්ති සඳහා වලංගු බවට ප්‍රකාශිත වලංගු සාමාන්‍ය බලපත්‍රයක් දරන්නකුව සිටියේ නම් සහ ඔහුට හදිසි සේවා වාහන සහ පොදු සේවා වාහන පිටසන් ඇත්නම්, එම තැනැත්තා ඒ පන්තියේ උපදේශක බලපත්‍රයක් ලැබීමට සුදුස්සකු වන්නේ ය. එවැනි උපදේශක බලපත්‍රයක් මගින් එම තැනැත්තාට, 122 වන වගන්තියේ උපලේඛනයේ 1(i), 1(ii), 2, 3, 4(i), 4(ii), 5, 6(i), 6(ii), 7, 8, 9, සහ 10 යන අයිතමවල නිශ්චිතව දැක්වෙන මෝටර් වාහන පන්තියක් හෝ පන්තිවල මෝටර් වාහන පුහුණු වන්නන්ට උපදෙස් ලබාදීමට බලය පැවරේ.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 139ඉ වගන්තිය සංශෝධනය කිරීම.

**43.** ප්‍රධාන ප්‍රඥප්තියේ 139ඉ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ—

(අ) (ආ) ඡේදයේ “හෝ” යන වචනය අත් හැරීමෙන් ;

(ආ) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයේ “ඒ යටතේ සාදන ලද නියෝග” යන වචන වෙනුවට “ඒ යටතේ සාදනු ලැබූ නියෝග ; හෝ” යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ඈ) එහි (ඇ) ඡේදයට ඉක්බිතිවම එහි (ඈ) ඡේදය වශයෙන් බලපැවැත්විය යුතු පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් :—

"(ඈ) නිශ්චිත රියදුරු අභිවෘද්ධි ලකුණු සංඛ්‍යාවට වඩා වැඩියෙන් ලකුණු රැස් කරගෙන ලබා ගෙන ඇත්නම්,

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ "අමාත්‍යාංශයේ ලේකම්වරයා" යන වචන වෙනුවට "අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ (6) වන උපවගන්තියේ "අමාත්‍යාංශයේ ලේකම්වරයා" යන වචන වෙනුවට "අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(4) ඒ වගන්තියේ (8) වන උපවගන්තියේ "වහාම එම බලපත්‍රය කොමසාරිස්වරයා වෙත භාර දෙනු ලැබිය යුතු ය." යන වචන වෙනුවට "එම බලපත්‍රය අවලංගු කිරීමේ දින සිට දින හතක් ඇතුළත කොමසාරිස් ජනරාල්වරයා වෙත භාර දිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්.

**44.** ප්‍රධාන ප්‍රඥප්තියේ 139ඊ වගන්තියේ (3) වන උපවගන්තියේ "රුපියල් පන්සියයකට නොඅඩු" යන වචන වෙනුවට "රුපියල් හත් දහස් පන්සියයකට නොඅඩු සහ රුපියල් පහළොස් දහසකට නොවැඩි දඩයකට" යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 139ඊ වගන්තිය සංශෝධනය කිරීම.

**45.** ප්‍රධාන ප්‍රඥප්තියේ 139ග වගන්තියේ "රියදුරු උපදේශක" යන අර්ථ නිරූපණය ඉවත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 139ග වගන්තිය සංශෝධනය කිරීම.

**46.** ප්‍රධාන ප්‍රඥප්තියේ 145 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 145 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

මෝටර් වාහනවල තත්වය.

145. (1) යම් මෝටර් වාහනයක් සෑම අංශයකින්ම—

(අ) එම මෝටර් වාහනය ඇතුළත සිටින යම් තැනැත්තකුට හෝ මාර්ගය භාවිතා කරන

යම් තැනැත්තකුට අනතුරක්, අපහසුවක්, කරදරයක් හෝ හානියක් සිදු නොකරන හෝ සිදු කිරීමට ඉඩ නැති තත්වයකින් ඇත්තේ නම් මිස ;

(ආ) මාර්ගයේ ඇති යම් වාහනයකට අනතුරක් සිදු නොකරන හෝ සිදු කිරීමට ඉඩ නැති තත්වයකින් ඇත්තේ නම් මිස ; හෝ

(ඇ) මාර්ගයේ හෝ ඊට යාබදව ඇති යම් දේපළකට අනතුරක් සිදු නොකරන හෝ සිදු කිරීමට ඉඩ නැති තත්වයකින් ඇත්තේ නම් මිස,

එම මෝටර් වාහනය මාර්ගයක භාවිත නොකළ යුතු ය.

(2) මෝටර් වාහනයක රියදුරා (1) වන උපවගන්තියේ යම් විධිවිධානයක් කඩ කරන අවස්ථාවක, එම රියදුරා සහ ලියාපදිංචි අයිතිකරු වරදකට වරදකරු වන අතර එසේ වරදකරු කිරීමේ දී රුපියල් දස දහසකට නොඅඩු සහ රුපියල් විසි දහසකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය.

(3) මෝටර් වාහනයක රියදුරකු (1) වන උප වගන්තියේ විධිවිධාන කඩ කර එමගින් යම් තැනැත්තකුට තුවාල සිදු කරන අවස්ථාවක එම රියදුරා සහ ලියාපදිංචි අයිතිකරු වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කිරීමේ දී රුපියල් දස දහසකට නොඅඩු සහ රුපියල් විසිපන් දහසකට නොවැඩි දඩයකට හෝ මාස දෙකකට වැඩි නොවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම සහ මාස හයක කාලයක් සඳහා ඔහුගේ රියදුරු බලපත්‍රය අත්හිටුවීමට ද ඔහු යටත් වන්නේ ය.

(4) මෝටර් වාහනයක රියදුරකු විසින් (1) වන උප වගන්තියේ විධිවිධාන කඩ කර එමගින් යම් තැනැත්තකුට බරපතල තුවාල සිදු කරන අවස්ථාවක, එම රියදුරා සහ ලියාපදිංචි අයිතිකරු වරදකට

වරදකරු වන අතර එසේ වරදකරු කිරීමේ දී රුපියල් විසිපන් දහසකට අඩු නොවන සහ රුපියල් තිස්පන් දහසකට වැඩි නොවන දඩයකට හෝ මාස හයකට වැඩි නොවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකට සහ මාස හයක කාලයක් සඳහා ඔහුගේ රියදුරු බලපත්‍රය අත්හිටුවීමට ද ඔහු යටත් වන්නේ ය.

(5) මෝටර් වාහනයක රියදුරකු විසින් (1) වන උපවගන්තියේ යම් විධිවිධානයක් කඩ කර එමගින් යම් තැනැත්තකුගේ මරණය සිදු කරන අවස්ථාවක එම රියදුරා සහ ලියාපදිංචි අයිතිකරු වරදකට වරදකරු වන අතර එසේ වරදකරු කිරීමේ දී රුපියල් පනස් දහසකට අඩු නොවන සහ රුපියල් හැත්තෑපන් දහසකට වැඩි නොවන දඩයකට හෝ අවුරුදු එකකට වැඩි නොවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම ද සහ මාස දොළහක කාලයක් සඳහා ඔහුගේ රියදුරු බලපත්‍රය අත්හිටුවීමට ද ඔහු යටත් වන්නේ ය.

**47.** ප්‍රධාන ප්‍රඥප්තියේ 155 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 155 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ "කාර්යක්ෂම උපකරණයක්" යන වචන වෙනුවට "කාර්යක්ෂම අනතුරු ඇඟවීමේ උපකරණයක්" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එම වගන්තියේ (2), (3) සහ (4) වන උපවගන්ති එහි (4), (5) සහ (6) වන උපවගන්ති ලෙස නැවත අංක යෙදීමෙන් ;

(3) එහි (1) වන උපවගන්තියට ඉක්බිතිව ම එහි (2) සහ (3) වන උපවගන්ති වශයෙන් බලාත්මක විය යුතු පහත දැක්වෙන උපවගන්ති ඇතුළත් කිරීමෙන් :—

"(2) (අ) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද මෝටර් වාහනයක රියදුරකු විසින් එම වාහනයේ අනතුරු ඇඟවීමේ උපකරණය භාවිත කිරීම හෝ භාවිත කිරීමට සැලැස්වීම හෝ අවසර දීම :—

(i) අනතුරක් වැළැක්වීමට මාර්ග අනතුරු ඇඟවීමක් ලෙස අවශ්‍ය වන අවස්ථාවක දී හැර ; හෝ

(ii) වෙනත් වාහනයක් පසු කර යෑමේ තම අදහස ඇඟවීමක් වශයෙන් හැර,

නොකළ යුතු ය:—

එසේ වුව ද, රාත්‍රී කාලයක දී එම රියදුරු එම කාර්ය සඳහා ප්‍රධාන ලාම්පු දැල්විය හැකි අතර අනතුරු ඇඟවීමේ උපකරණය ද භාවිත කළ හැකි ය.

(3) විවිධ නාද රටා නිකුත් කරන බහු නාද රටා නලාවක් සවි කර ඇති හෝ අමිහිරි, කර්කශ, ඝෝෂාකාරී හෝ බිය උපදවන සුළු ශබ්දයක් නිකුත් කරන ශබ්ද උපදවන උපකරණයක් සවි කර ඇති මෝටර් වාහනයක් කිසිම තැනැත්තකු විසින් භාවිත නොකළ යුතු ය :

එසේ වුව ද,—

(අ) ගිනි නිවන හමුදාව විසින් භාවිත කරනු ලබන වාහනයක ;

(ආ) පොලීසිය හෝ සන්නද්ධ හමුදාවල සාමාජිකයන් විසින් භාවිත කරනු ලබන වාහනයක ; හෝ

(ඇ) හදිසි ඇමතුමකට ප්‍රතිචාරයක් දක්වමින් ගමන් කරන ගිලන් රථයක,

එවැනි බහු නාද රටා සහිත නලාවක් හෝ වෙනත් ශබ්ද උපදවන උපකරණයක් සවි කිරීම හෝ භාවිත කිරීම කරනු ලැබිය හැකි ය.

(4) එහි නැවත අංක යෙදූ (4) වන උපවගන්තියේ "නාගරික ප්‍රදේශයක සීමා ඇතුළත මහාමාර්ගයේ" යන වචන වෙනුවට "මාර්ගයේ" යන වචනය ආදේශ කිරීමෙන් ;

(5) ඒ වගන්තියේ නැවත අංක යෙදූ (5) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්—

"(5) පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය—

(අ) මේ වගන්තියේ කාර්ය සඳහා දවසේ යම් නිශ්චිත කාලසීමාවක් තුළ යම් ප්‍රදේශයක හෝ එහි කොටසක් තුළ සියලුම අනතුරු ඇඟවීමේ උපකරණ හෝ යම් නිශ්චිත උපකරණ භාවිතය තහනම් කිරීම හෝ සීමා කිරීම ;

(ආ) වාහනයක එන්ජිමෙන් හෝ සයිලන්සරයෙන් හෝ නලාවෙන් පිටවන උපරිම ශබ්ද ප්‍රමාණය නියම කිරීම ;

(ඇ) යම් වාහන පන්තියකට හෝ පන්තිවලට සවිකර ඇති අනතුරු ඇඟවීමේ උපකරණ හෝ පසුපසට ගමන් කිරීමේ දී අනතුරු අඟවන උපකරණ හෝ ශබ්දය හෝ ආලෝකය වර්ධනය කිරීමේ උපකරණ සම්බන්ධයෙන් යම් වාහන පන්තියකට හෝ පන්තිවලට අවසර දෙනු ලබන උපරිම ශබ්ද සීමාව නියම කිරීම.

ශබ්දය වැඩිකරන උපකරණවලට අවසර දිය හැකි උපරිම ශබ්ද ප්‍රමාණය නියම කිරීම.

(6) එම වගන්තියේ නැවත අංක යෙදූ (6) වන උපවගන්තියේ "(3) වන උපවගන්තියේ" යන වචන වෙනුවට "(5) වන උපවගන්තියේ" යන වචන ආදේශ කිරීමෙන්,

(7) එම වගන්තියේ නැවත අංක යෙදූ (6) වන උපවගන්තියට ඉක්බිතිව ම (7) වන උපවගන්තිය ලෙස බලාත්මක විය යුතු පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන්,

"(7) මේ වගන්තියේ විධිවිධාන කඩ කරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කරනු ලැබීමේ දී රුපියල් තුන්දහසකට නොඅඩු සහ රුපියල් පන්දහසකට නොවැඩි දඩයකට සහ එම උපකරණ රාජසන්තක කිරීම සඳහා ද යටත් වන්නේ ය.

ප්‍රධාන ප්‍රඥප්තියට අලුතින් 155අ වගන්තිය ඇතුළත් කිරීම.

**48.** ප්‍රධාන ප්‍රඥප්තියේ 155 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එහි 155අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :-

විමෝචනය.

155අ. (1) (අ) සෞඛ්‍යමය වශයෙන් උපද්‍රවයක් සිදු විය හැකි හෝ යම් තැනැත්තකුට කරදරයක් හෝ හානියක් සිදු කිරීමට ඉඩ ඇති ;

(ආ) මාර්ග භාවිතාකරන වෙනත් අයකුගේ දෘෂ්ටියට බාධා කිරීමට ඉඩ ඇති ; හෝ

(ඇ) යම් මාර්ගයකට හෝ වෙනත් පොදු ස්ථානයකට හෝ දේපළකට අලාභයක් සිදු කිරිමට ඉඩ ඇති,

දුම්, හුමාලය, වැලිකැට, ගිනි පුපුරු, අළු, දැලි අඟුරු, ග්‍රීස් හෝ තෙල් සහිත ද්‍රව්‍ය පිට කරන යම් මෝටර් වාහනයක් පදවන හෝ භාවිත කරන යම් තැනැත්තෙක්, වරදකට වරදකරුවකු වන අතර එසේ

වරදකරු කිරීමේ දී රුපියල් දෙදහසකට නොඅඩු සහ රුපියල් පන්දහසකට නොවැඩි දඩයකට සහ දෙවන හෝ පසු අවස්ථාවක වරදකරු වීමේ දී රුපියල් පන්දහසකට නොඅඩු සහ රුපියල් දසදහසකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය.

(2) මාර්ගයක හෝ වෙනත් ප්‍රසිද්ධ ස්ථානයක ඇති මෝටර් වාහනයක් සම්බන්ධයෙන් (1) වන උප වගන්තිය යටතේ වූ වරදක් සිදු කරමින් පවතින බවට විශ්වාස කිරීමට හේතු ඇති මෝටර් වාහන පරීක්ෂකවරයකු හෝ පොලිස්පතිවරයා විසින් බලය පවරන ලද පොලිස් නිලධරයකු විසින්,

(අ) එම වාහනය නවතා පරීක්ෂා කළ හැකි අතර, නියමිත උපකරණයක් භාවිතා කරමින් එම වාහනයෙන් පිට වන දුම් හෝ දෘශ්‍ය වායු මැනීම හෝ මැනීමට කටයුතු සැලැස්වීම කරනු ලැබිය හැකි ය ; හෝ

(ආ) වාහනයේ අයිතිකරු වෙත පෞද්ගලිකව හෝ තැපෑලෙන් ද ලිඛිත දැන්වීමක් භාර දෙමින් -

(i) නියමිත උපරණයක් භාවිත කරමින් දුම් හෝ දෘශ්‍ය වායු පිටවීම්, මැනීමේ කාර්ය සඳහා; හෝ

(ii) වාහනය පාවිච්චි කිරීමෙන් මේ වගන්තිය යටතේ වූ වරදක් සිදු විය හැකි තත්ත්වයේ එම වාහනය පවතින්නේ ද යන්න දැන ගැනීම සඳහා වාහනය පාවිච්චි කිරීමේ කාර්ය සඳහා,

එම වාහනය වාහන පරීක්ෂා කරන ස්ථානයකට හෝ පොලිස් ස්ථානයකට එම දැන්වීමේ සඳහන් දිනයක දී සහ වේලාවක දී ඉදිරිපත් කරන ලෙස එම වාහනයේ අයිතිකරුට නියම කරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ දැන්වීමක් භාර දෙනු ලැබූ වාහනයක අයිතිකරුවකු, එම දැන්වීමේ සඳහන් දිනයක දී, වේලාවක දී සහ ස්ථානයක දී එම වාහනය ඉදිරිපත් කිරීමට සාධාරණ හේතුවක් නොමැතිව අපොහොසත් වන අවස්ථාවක,

එම අයිතිකරු වරදකට වරදකරු වන අතර එසේ වරදකරු කිරීමේ දී රුපියල් පන්දහසකට නොඅඩු සහ රුපියල් දසදහසකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

(4) (අ) වාහන සම්බන්ධයෙන් අදාළ වන වීමෝචන ප්‍රමිතිය අමාත්‍යවරයා විසින් නියෝග මගින් නියම කරනු ලැබිය හැකි ය ;

(ආ) විවිධ පන්තිවලට අයත් මෝටර් වාහන සම්බන්ධයෙන් විවිධ ප්‍රමිති එම නියෝග මගින් ලබා දිය හැකි ය.

(5) මේ වගන්තියේ කාර්ය සඳහා "පරීක්ෂකවරයකු" යන්නෙන්, මේ පනත යටතේ පත් කරන ලද හෝ පත් කරන ලදැයි සැලකෙන මෝටර් වාහන පරීක්ෂකවරයකු හෝ තත්කාර්ය සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ පොලිස්පතිවරයා විසින් බලය පවරන තැනැත්තකු අදහස් වේ.

ප්‍රධාන ප්‍රඥප්තියට අලුතින් 157අ වගන්තිය ඇතුළත් කිරීම.

**49.** ප්‍රධාන ප්‍රඥප්තියේ 157 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය එම ප්‍රඥප්තියේ 157අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :-

ආසන පටි භාවිතා කිරීම.

157අ. (1) අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන වර්ගයකට අයත් ආසන පටියක් භාවිත කරන්නේ නම් මිස, කිසිම තැනැත්තකු විසින් නියමිත පන්තියකට හෝ විස්තරයකට අයත් වාහනයක නියමිත අසුනක ගමන් නොකළ යුතු ය.

(2) (අ) නියම කිරීම අදාළ වන ආසන වර්ග ;

(ආ) වාහනවල පන්තිය හෝ විස්තරය ; සහ

(ඇ) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා ආසනපටි යම් වර්ග හෝ විස්තර,

නියම කරමින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(3) කිසිම තැනැත්තකු විසින් අමාත්‍යවරයා විසින් නියම කරන ලද ආසන පටි වර්ගයක් හැර, වෙනත් ආසන පටියක් විකිණීම හෝ විකිණීමට තැත් කිරීම හෝ තම සන්තකයේ තබා ගැනීම නොකළ යුතු ය.

(4) (1) වන හෝ (3) වන උපවගන්තියේ විධිවිධාන කඩ කරන හෝ මේ වගන්තිය යටතේ සාදන ලද නියෝගයක් කඩ කරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, වරදකරු කිරීමකදී 224 වන වගන්තියේ සඳහන් දඬුවමකට යටත් විය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 160 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**50.** ප්‍රධාන ප්‍රඥප්තියේ 160 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්ති ආදේශ කරනු ලැබේ.

ශබ්දය.

"160. (1) ධාවනයේ පවතින හෝ නවතා තබා ඇති කිසිම වාහනයක රියදුරකු වාහනයට සවි කර ඇති හෝ එහි රැගෙන යන ශබ්ද විකාශන යන්ත්‍ර භාවිත කිරීම හෝ භාවිත කිරීමට වෙනත් තැනැත්තෙකුට අවසර දීම හෝ නොකළ යුතු අතර, එම වාහනයේ සිටින තැනැත්තකු ඒවා භාවිතා නොකළ යුතු ය.

එසේ වුව ද, යම් ශබ්දවිකාශන යන්ත්‍රයකින් පිටවන ශබ්දයේ පරිමාව යම් වාහනයක් ඇතුළත පමණක් සීමා වී ඇත්නම් සහ වාහනය තුළ සිටින මගීන්ට පමණක් එම ශබ්දය ඇසෙන්නේ නම්, මෝටර් වාහනයක් තුළ එවැනි ශබ්දවිකාශන උපකරණයක් භාවිත කරනු ලැබිය හැකි ය.

(2) අභ්‍යන්තර දහන එන්ජිමක් සහිත සියලුම මෝටර් වාහනවල එන්ජිමෙන් පිටවන සියලු වායු යනාදිය පිට කරන සහ අනවශ්‍ය ශබ්දය ඇති කිරීම වළක්වන කාර්යක්ෂම ශබ්දය අඩු කිරීමේ උපකරණයක් සවි කර තිබිය යුතු ය.

(3) ශබ්ද ප්‍රමාණය දැන ගැනීමේ කාර්ය සඳහා අනතුරු ඇඟවීමේ උපකරණ නාද කරවන ලෙස පරීක්ෂකවරයකු හෝ තත්කාර්ය සඳහා පොලිස්පතිවරයා විසින් බලය පවරන ලද පොලිස් නිලධරයකු විසින් රියදුරෙකුට නියම කරනු ලැබිය හැකි ය.

(4) (අ) එන්ජිමේ වායු පිට වන උපකරණයකින් පිටවන උපරිම ශබ්ද මට්ටම ; සහ

(ආ) යම් වාහන පන්තියකට හෝ පන්තිවලට සවි කර ඇති නලාව අනතුරු ඇඟවීමේ දී උපකරණය හෝ පසු පසට යාමේ දී අනතුරු අඟවන උපකරණය සහ ශබ්ද විකාශන උපකරණ සම්බන්ධයෙන් විවිධ වාහන පන්තිවලට අවසර දිය හැකි උපරිම ශබ්ද මට්ටම

නියම කරමින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(5) මේ වගන්තියේ විධිවිධාන කඩ කරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර වරදකරු කරනු ලැබීමේ දී රුපියල් තුන්දහසකට නොඅඩු සහ රුපියල් පන්දහසකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

(6) මේ වගන්තියේ කාර්ය සඳහා "පරීක්ෂකවරයකු" යන්නෙන්, මේ පනත යටතේ පත් කරන ලද හෝ පත් කරන ලදැයි සලකනු ලබන මෝටර් වාහන පරීක්ෂකවරයකු අදහස් වන අතර, ඊට පොලිස්පතිවරයා විසින් තත්කාර්ය සඳහා බලය දෙන ලද තැනැත්තකු ද අදහස් වේ."

ප්‍රධාන ප්‍රඥප්තියේ 161 වන වගන්තිය සංශෝධනය කිරීම.

51. ප්‍රධාන ප්‍රඥප්තියේ 161 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ

(අ) (අ) ඡේදයේ (IV) උපඡේදයට ඉක්බිතිවම එම ඡේදයේ (V) උපඡේදය වශයෙන් බලාත්මක විය යුතු පහත දැක්වෙන උපඡේදය ඇතුළත් කිරීමෙන් :–

"(V) ළඟම ඇති පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා වෙත වහාම එම අනතුර වාර්තා කිරීම පැහැර හරින රියදුරකු වරදකට වරදකරු වන අතර, වරදකරු කිරීමේ දී රුපියල් තුන් දහසකට නොඅඩු සහ රුපියල් පන් දහසකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය.";

(ආ) එම උපවගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිවම එහි (ඈ) ඡේදය වශයෙන් බලාත්මක විය යුතු පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් :

"(ඇ) (i) එම අනතුරට අදාළ තොරතුරු ; සහ

(ii) හිමිකම්පාන තැනැත්තා විසින් තමාට දැනුම් දුන් පරිදි එම අනතුරට අදාළ පාර්ශවයන්ගේ නම් සහ ලිපින,

අනතුරට අදාළව සංඛ්‍යා ලේඛන වාර්තා සකස් කිරීමේ කාර්යය සඳහා එම අනතුරු සම්බන්ධයෙන් රක්ෂණය කරනු ලබන්නේ යම් රක්ෂණකරුවකු වෙත ද එම රක්ෂණකරු විසින් එම අනතුරු පිළිබඳව ළඟම ඇති පොලිස් ස්ථානාධිපතිවරයා වෙත වාර්තා කළ යුතු ය."

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ "හෝ ඇපය" යන වචන ඉවත් කිරීමෙන්,

(3) එහි (2) වන උපවගන්තියට ඉක්බිතිවම එහි (3) වන උපවගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :

"(3) (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තෙක් වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කිරීමේ දී රුපියල් පන්දහසකට නොඅඩු සහ රුපියල් දස දහසකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය."

*ප්‍රධාන ප්‍රඥප්තියේ 194 වන වගන්තිය සංශෝධනය කිරීම.*

**52.** ප්‍රධාන ප්‍රඥප්තියේ 194 වන වගන්තියේ (5) උපවගන්තියේ "රුපියල් එක් දහසක් නොඉක්මවන" යන වචනවල සිට එම වගන්තියේ අවසානය දක්වා ඇති වචන ඉවත් කොට ඒ වෙනුවට "රුපියල් තුන් දහසකට නොඅඩු සහ රුපියල් පන්දහසකට නොවැඩි දඩයකට සහ දෙවන හෝ පසු අවස්ථාවක වරදකරු කිරීමේ දී රුපියල් පන්දහසකට නොඅඩු සහ රුපියල් දසදහසකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය."

*ප්‍රධාන ප්‍රඥප්තියේ 195 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.*

**53.** ප්‍රධාන ප්‍රඥප්තියේ 195 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :-

*අනුමත ගරාජ් පරීක්ෂා කිරීමේ සහ සෝදිසි කිරීමේ මධ්‍යස්ථාන සහ සහතික කිරීමේ නිලධරයන්*

195. (1) ගරාජයක හෝ පරීක්ෂා කිරීමේ සහ සෝදිසි කිරීමේ මධ්‍යස්ථානයක ලියාපදිංචි අයිතිකරු විසින් නියමිත ආකෘති පත්‍රයේ වූ තත්කාර්ය සඳහා කරනු ලබන ඉල්ලීමක් මත සහ නියමිත අය භාරය හා සේවා ගාස්තුව ගෙවීමේ දී කොමසාරිස් ජනරාල්වරයා විසින් නියමයක් කරමින් -

(අ) ඒ නියමයේ නිශ්චිතව දැක්වෙන ගරාජය 29 වන වගන්තියේ කාර්ය සඳහා වාර්ෂිකව වාහන පරීක්ෂා කිරිමේ සහ සහතික කිරිමේ කාර්ය සඳහා අනුමත ගරාජයක් හෝ පරීක්ෂා කිරීමේ හා සෝදිසි කිරීමේ මධ්‍යස්ථානයක් බවට ප්‍රකාශයක් කළ යුතු ය ; සහ

(ආ) එම ලියාපදිංචි අයිතිකරු සහ එම ගරාජයේ සේවයේ නියුත්ක සහ එම නියමයේ නිශ්චිතව දැක්වෙන වෙනත් තැනැත්තකු හෝ තැනැත්තන් එම ගරාජයේ දී මෝටර් වාහන පරීක්ෂා කිරීමේ සහ සහතික කිරිමේ කාර්ය සඳහා එක් එක් තැනැත්තා අනුමත සහතික කිරිමේ නිලධරයකු විය යුතු බවට එම නියමය මගින් ප්‍රකාශ කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් නියමයක් කරනු ලබන අවස්ථාවක, ඔහු විසින් යම් අනුමත සහතික කිරිමේ නිලධරයකු වෙත බලය පැවරීමේ ලිපියක් නිකුත් කළ යුතු අතර, එම ලිපිය නිකුත් කරනු ලබන්නේ කොන්දේසිවලට යටත්ව ද, එම කොන්දේසි එම ලිපියේ සඳහන් විය යුතු ය.

(3) නියමය කරනු ලැබුවේ යම් අනුමත ගරාජයක් හෝ යම් අනුමත පරීක්ෂා කිරීමේ හෝ සෝදිසි කිරීමේ මධ්‍යස්ථානයක් සම්බන්ධයෙන් ද, එම ගරාජයේ අනුමත සහතික කිරීමේ නිලධරයා වෙත නිකුත් කරන ලද බලය පැවරීමේ ලිපියෙන් නිශ්චිතව දැක්වෙන යම් කොන්දේසියක් උල්ලංඝනය කර ඇත්නම් (1) වන උපවගන්තිය යටතේ කරනු ලද නියමයක් කොමසාරිස්-ජනරාල්වරයා ප්‍රත්‍යාදිෂ්ඨ කිරිම හෝ වෙනස් කිරීම කළ හැකි ය.

(4) එක් එක් අනුමත ගරාජය සහ පරීක්ෂා කිරීමේ හෝ සෝදිසි කිරීමේ මධ්‍යස්ථානය සම්බන්ධයෙන් එක් දිනක් ඇතුළත් එම ගරාජයේදී හෝ පරීක්ෂා කිරීමේ හෝ සෝදිසි කිරීමේ මධ්‍යස්ථානයේ දී පරීක්ෂා කොට සහතික කළ හැකි උපරිම වාහන සංඛ්‍යාව කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව දැක්විය හැකි ය.

(5) (1) වන උපවගන්තියේ සඳහන්වන ඉල්ලීමක් කොමසාරිස් ජනරාල්වරයා විසින් ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක ඔහු විසින් ඒ ප්‍රතික්ෂේප කිරීමට හේතු ලිඛිතව සඳහන් කළ යුතු ය.

(6) අමාත්‍යවරයා විසින් ;

(අ) අනුමත ගරාජයක හෝ අනුමත පරීක්ෂා කිරීමේ හෝ සෝදිසි කිරීමේ මධ්‍යස්ථානයක තබාගත යුතු උපකරණ සහ පහසුකම් ;

(ආ) අනුමත සහතික කිරීමේ නිලධරයකු සතු විය යුතු සුදුසුකම් ;

(ඇ) විවිධ පන්තිවලට හෝ විස්තරවලට අයත්වන මෝටර් වාහන අනිවාර්යයෙන් පරීක්ෂා කළ යුතු කාල පරාසය ;

(ඈ) අනුමත ගරාජයක් හෝ අනුමත පරීක්ෂා කිරීමේ හෝ සෝදිසි කිරීමේ මධ්‍යස්ථානයක් විසින් තැන්පත් කළ යුතු මුදල නියම කරමින් නියෝග සාදනු ලැබිය හැකි ය.

**54.** ප්‍රධාන ප්‍රඥප්තියේ 196 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :-

ප්‍රධාන ප්‍රඥප්තියේ 196 වන වගන්තිය සංශෝධනය කිරීම.

විමෝචන සහතික හෝ යෝග්‍යතා සහතික නිකුත් කිරීම.

196. (1) මෝටර් වාහනයක් 29 වන වගන්තියේ සඳහන් විමෝචන සහතික හෝ යෝග්‍යතා සහතික ලබා ගැනීමේ කාර්ය සඳහා පරීක්ෂකවරයකු හෝ 195 වන වගන්තියේ සඳහන් අනුමත සහතික කිරීමේ නිලධරයකු ඉදිරියේ ඉදිරිපත් කරනු ලැබූ විට සහ නියමිත ගාස්තුව ගෙවීම මත එම පරීක්ෂකවරයා හෝ අනුමත සහතික කිරීමේ නිලධරයා විසින් එම වාහනය පරීක්ෂා කොට ඒ සහතික මේ පනත යටතේ නිකුත් කළ හැකිද නැද්ද යන්න සහතික කළ යුතු ය.

(2) මෝටර් වාහනයක් සම්බන්ධයෙන් නිකුත් කරන ලද විමෝචන සහ යෝග්‍යතා සහතිකයක් නිකුත් කිරීමේ දින සිට අවුරුදු එකක කාලයක් සඳහා හෝ

එම සහතිකයේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි මාස තුනකට අඩු නොවන කෙටි කාලයක් සඳහා එය වලංගුව බලපැවැත්විය යුතු ය.

(3) පරීක්ෂකවරයකු හෝ අනුමත සහතික කිරීමේ නිලධරයකු විසින් මෝටර් වාහනයක් භාවිතය සඳහා යෝග්‍ය නොවන බවට සහතික කරනු ලබන අවස්ථාවක, ඔහු විසින් ඒ සඳහා හේතු සඳහන් කළ යුතු ය.

(4) මේ වගන්තියේ ඉහතින් ම වූ විධිවිධාන යටතේ පරීක්ෂා කිරීමෙන් පසු භාවිතය සඳහා යෝග්‍ය නොවන බවට සහතික කරනු ලැබූ මෝටර් වාහනයකට ලියාපදිංචි අයිතිකරු විසින් එම සහතිකය නිකුත් කිරීමට එරෙහිව කොමසාරිස් ජනරාල්වරයා වෙත අභියාචනය කළ හැකි අතර, එම අභියාචනය සම්බන්ධයෙන් කොමසාරිස් ජනරාල්වරයා විසින් දෙනු ලබන තීරණය අවසානාත්මක විය යුතු ය.

(5) මේ වගන්තිය යටතේ මෝටර් වාහනයක් සම්බන්ධයෙන් නිකුත් කරන ලද විමෝචන හෝ යෝග්‍යතා සහතිකයක් –

(අ) සෑම වේලාවකම එම වාහනයේ රැගෙන යා යුතු ය.

(ආ) පොලිස් නිලධරයකු, ග්‍රාම නිලධරයකු හෝ පරීක්ෂකවරයකු හෝ මේ පනත යටතේ පත් කරන ලද බලයලත් නිලධරයකු හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් ලිඛිතව බලය පවරන ලද යම් තැනැත්තකු විසින් පරීක්ෂා කිරීම සඳහා ඉල්ලා සිටිනු ලැබූ විට එම සහතිකය ඔහුට ලබා දිය යුතු ය;

එසේ වුව ද, අවශ්‍ය අවස්ථාවක දී අධිකරණයක්, කොමසාරිස්-ජනරාල්වරයා හෝ බලපත්‍ර ලබා දීමේ බලධරයා වෙත එම සහතිකය ඉදිරිපත් කළ යුතු ය.

(6) අනුමත ගරාජයක හෝ අනුමත පරීක්ෂා කිරීමේ හෝ සෝදිසි කිරීමේ මධ්‍යස්ථානයක ලියාපදිංචි අයිතිකරු විසින් එක් එක් මාසය ඇතුළත නිකුත් කරන ලද විමෝචන හා යෝග්‍යතා සහතික පිළිබඳ මාසික සාරාංශයක් නියමිත ආකෘති පත්‍රයෙහි ඊට පසුව එළඹෙන මාසයේ දහවන දිනට පෙර, කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(7) (අ) (6) වන උපවගන්තියේ සඳහන් මාසික සාරාංශය එක් එක් මාසයේ දහවන දිනයට පෙර යැවීම අනුමත ගරාජයක හෝ අනුමත පරීක්ෂා කිරීමේ හෝ සෝදිසි කිරීමේ මධ්‍යස්ථානයක ලියාපදිංචි අයිතිකරු විසින් පැහැර හරින්නේ නම්, කොමසාරිස් ජනරාල්වරයා විසින් පළමු අවස්ථාවේ දී එම ලියාපදිංචි අයිතිකරු වෙත අවවාදාත්මක ලිපියක් නිකුත් කරමින් (6) වන වගන්තිය යටතේ නිශ්චිතව දැක්වෙන කාලය ඇතුළත එම ගරාජය සම්බන්ධයෙන් 195 වන වගන්තිය යටතේ කරන ලද නියමය ප්‍රත්‍යාදිෂ්ඨ කළ හැකි බවට දැනුම් දිය යුතු ය.

(ආ) එම අනුමත ගරාජයේ හෝ අනුමත පරීක්ෂා කිරීමේ හෝ සෝදිසි කිරීමේ මධ්‍යස්ථානයක ලියාපදිංචි අයිතිකරු මාසික සාරාංශ යැවීම අඛණ්ඩව මාස තුනක් ඇතුළත පැහැර හරිනු ලැබුවහොත්, එම අනුමත ගරාජය අනුමත පරීක්ෂා කිරීමේ හෝ සෝදිසි කිරීමේ මධ්‍යස්ථානය සම්බන්ධයෙන් 195 වන වගන්තිය යටතේ කර ඇති නියමය කොමසාරිස් ජනරාල්වරයා විසින් ප්‍රත්‍යාදිෂ්ඨ කරනු ලැබිය යුතු ය.

(ඇ) (6) වන උපවගන්තියේ විධිවිධාන කඩ කරන යම් තැනැත්තෙක් වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පන්දහසකට නොඅඩු සහ රුපියල් දස දහසකට නොවැඩි දඩයකට යටත් විය යුතු අතර, දෙවන හෝ පසු

අවස්ථාවක දී වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දස දහසකට නොඅඩු සහ රුපියල් පහළොස් දහසකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය.

(8) විමෝචන සහතික හෝ යෝග්‍යතා සහතික නිකුත් කිරීමේ කාර්ය සඳහා මෝටර් වාහන පරීක්ෂා කිරීම සඳහා වූ කාර්ය පටිපාටිය සඳහා විධිවිධාන සලස්වමින් නියෝග සාදනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 196ආ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**55.** ප්‍රධාන ප්‍රඥප්තියේ 196අ වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය, මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 196ආ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:—

"වංචනික ලෙස විමෝචන සහතික හෝ යෝග්‍යතා සහතික නිකුත් කිරීම.

196ආ. (1) යම් තැනැත්තකු විසින් වංචනික ලෙස විමෝචන සහතිකයක් හෝ යෝග්‍යතා සහතිකයක් නිකුත් කරනු ලබන අවස්ථාවක දී හෝ අනුමත සහතික කිරීමේ නිලධරයකු වෙත නිකුත් කරන ලද බලය පැවරීමේ ලිපියක නිශ්චිතව දැක්වෙන කොන්දේසිවලින් යම් කොන්දේසියක් හෝ ඊට වැඩි කොන්දේසි ගණනක් උල්ලංඝනය කිරීමක් සිදු වී ඇති අවස්ථාවක කොමසාරිස්-ජනරාල්වරයා හෝ වෙනත් යම් බලධරයකු විසින් —

(අ) එම අනුමත ගරාජය විසින් ඉදිරිපත් කර ඇති සම්පූර්ණ තැන්පතු මුදල් ලබා ගත යුතු ය;

(ආ) එම ගරාජය සහ එම ගරාජයේ අනුමත සහතික කිරීමේ නිලධරයාට ලබා දී ඇති බලය ප්‍රත්‍යාදිෂ්ඨ කළ යුතු ය;

(ඇ) වංචනික විමෝචන සහතිකය හෝ යෝග්‍යතා සහතිකයේ පදනම මත ලබා ගත් යම් අවසර පත්‍රයක්, බලපත්‍රයක් හෝ සහතිකයක් අවලංගු කරනු ලැබිය යුතු ය.

(2) වංචනික විමෝචන සහතිකයක් හෝ යෝග්‍යතා සහතිකයක් නිකුත් කරන හෝ එම අනුමත සහතික කිරීමේ නිලධරයා වෙත නිකුත් කරන ලද

බලය පැවරීමේ ලිපියේ ඇති යම් කොන්දේසියක් උල්ලංඝනය කරන යම් අනුමත සහතික නිලධරයකු වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කිරීමේ දී රුපියල් විසිදහසකට අඩු නොවන සහ රුපියල් විසිපන් දහසකට වැඩි නොවන දඩයකට ඔහු යටත් විය යුතු ය.”.

**56.** ප්‍රධාන ප්‍රඥප්තියේ 198 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 198 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ “ලොරිය නැතහොත් මෝටර් ට්‍රයිසිකල් වෑන්” යන වචන යෙදෙන සෑම ස්ථානයකටම “යම් මෝටර් වාහනයක්” යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එම වගන්තියේ (10) වන උපවගන්තිය වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

“(10) (9) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරනු ලබන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ දී පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු පළමුවතාවට වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පන්දහසකට අඩු නොවන සහ රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට ද, දෙවන හෝ තදනන්තර වරදක් සම්බන්ධයෙන් වන විට රුපියල් දස දහසකට අඩු නොවන සහ රුපියල් විසිදහසක් නොඉක්මවන දඩයකට හෝ මාස තුනක් නොඉක්මවන දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමේ දණ්ඩනයකට හෝ එම දඩමුදල සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම ඔහු යටත් විය යුතු ය.”.

**57.** ප්‍රධාන ප්‍රඥප්තියේ 199 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 199 වන වගන්තිය ඉවත් කිරීම.

**58.** ප්‍රධාන ප්‍රඥප්තියේ 200 වන වගන්තිය, එම වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිවම එම වගන්තියේ (3) වන උපවගන්තිය ලෙස බලාත්මක විය යුතු පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 200 වන වගන්තිය සංශෝධනය කිරීම.

“(3) (1) වන උපවගන්තිය යටතේ වරදක් සිදු කරන යම් තැනැත්තකු වරදකරු කිරීමේ දී රුපියල් තුන්දහසකට

අඩු නොවන සහ රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 201 වන වගන්තිය ඉවත් කිරීම.

**59.** ප්‍රධාන ප්‍රඥප්තියේ 201 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 213අඅ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**60.** ප්‍රධාන ප්‍රඥප්තියේ 213 අ වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 213 අ අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:—

"මෝටර් වාහන අභියාචන විනිශ්චය අධිකාරිය.

213 අ අ (1) (මෙහි මින් මතු "විනිශ්චය අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන) මෝටර් වාහන අභියාචන අධිකාරියක් තිබිය යුතු අතර, එම විනිශ්චය අධිකාරිය තම ක්ෂේත්‍රවල විශ්වසනීයත්වය සහ ප්‍රවීනත්වය ඇති තැනැත්තන් වන පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය:—

(අ) 1992 අංක 48 දරන ශ්‍රී ලංකා වාහන ඉංජිනේරු ආයතන (සංස්ථාගත කිරීමේ) පනත යටතේ පිහිටුවනු ලැබූ මෝටර් වාහන ඉංජිනේරු ආයතනයේ සාමාජිකයකු වූ ද, විද්‍යා හා තාක්ෂණ විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරන්නා වූ ද එක් තැනැත්තෙක් ;

(ආ) අධිකරණ විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන නීති ක්ෂේත්‍රයේ පිළිගැනීමක් ඇති එක් තැනැත්තෙක් ; සහ

(ඇ) ප්‍රවාහන විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ප්‍රවාහන අමාත්‍යාංශයේ එක් තැනැත්තෙක්.

(2) අමාත්‍යවරයා විසින් එක් සාමාජිකයකු විනිශ්චය අධිකාරියේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුතු ය.

(3) විනිශ්චය අධිකාරියේ සෑම සාමාජිකයෙක් ම මිය යාමෙන් හෝ අමාත්‍යවරයා අමතන ලිපියක් මඟින් ඉල්ලා අස්වීමෙන් ධුරය අත්හලහොත් මිස, හෝ (4) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, එවැනි

සෑම සාමාජිකයෙක් ම අමාත්‍යවරයාගේ පත්වීම් ලිපියේ නිශ්චිතව දක්වනු ලබන පරිදි අවුරුදු තුනකට නොවැඩි කාලයක් සඳහා ධුරය දැරිය යුතු ය. කාලය ඉකුත් වීමෙන් ධුරය අත්හරින යම් සාමාජිකයකු නැවත පත් කිරීම සඳහා සුදුස්සකු වන්නේ ය.

(4) ඉදිරිපත් කරනු ලබන හේතු අනුව විනිශ්චය අධිකාරියේ යම් සාමාජිකයෙක් හේතු ඉදිරිපත් කොට අමාත්‍යවරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(5) යම් සාමාජියකු ධුරයෙන් ඉවත් වන අවස්ථාවක දී එම සාමාජිකයා වෙනුවට අනුප්‍රාප්ත වීම සඳහා අමාත්‍යවරයා විසින් වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු අතර, එසේ පත් කරනු ලබන සාමාජිකයා පූර්වගාමියාගේ ඉතිරි ධුර කාලය සඳහා ධුර දැරිය යුතු ය.

(6) විනිශ්චය අධිකාරියේ සභාපතිවරයා අවශ්‍ය යයි සලකනු ලබන කවර අවස්ථාවක දී හෝ ඔහුට එම විනිශ්චය අධිකාරියේ රැස්වීම් කැඳවිය හැකි ය:

එසේ වුව ද, එම විනිශ්චය අධිකාරියේ සාමාජිකයන් දෙදෙනකු විසින් ලිඛිතව ඉල්ලීමක් කරනු ලබන කවර හෝ අවස්ථාවක දී එම විනිශ්චය අධිකාරියේ රැස්වීමක් එම සභාපතිවරයා විසින් කැඳවනු ලැබිය යුතු ය.

(7) විනිශ්චය අධිකාරියේ යම් රැස්වීමක් සඳහා වූ ගණපූරණය සාමාජිකයන් දෙදෙනෙකු විය යුතු ය.

(8) විනිශ්චය අධිකාරියේ කටයුතු පවත්වාගෙන යාම සඳහා සහ එම විනිශ්චය අධිකාරියේ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය නියම කරමින් නියෝග සාදනු ලැබිය හැකි ය. එම නියෝග සහ, (6) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව විනිශ්චය අධිකාරිය විසින් ස්වකීය කාර්ය පටිපාටිය පාලනය කරනු ලැබිය හැකි ය.

(9) විනිශ්චය අධිකාරියේ යම් සාමාජිකයකු පත්කිරීමේ ලා යම් දෝෂයක් නිසා හෝ එහි යම් පුරප්පාඩුවක් තිබීමේ හේතුව නිසාම යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් බලරහිත නොවිය යුතු ය.

(10) මෝටර් වාහනයක් නිෂ්පාදනය කිරීම, එකලස් කිරීම, සකස් කිරීම, නිර්මාණය කිරීම, අනුවර්තනය කිරීම, විකරණය කිරීම හෝ එහි නිර්මාණය වෙනස් කිරීම සඳහා—

(අ) 19අ වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ ලිඛිත අනුමතයක් ප්‍රදානය කිරීම කොමසාරිස්-ජනරාල්වරයා විසින් ප්‍රතික්ෂේප කිරීමෙන් ; සහ

(ආ) කොමසාරිස්-ජනරාල්වරයා විසින් ප්‍රදානය කරන ලද යම් ලිඛිත අනුමතියක් 19අ වගන්තියේ (7) වන උපවගන්තිය යටතේ අවලංගු කිරීමකින්,

අතෘප්තියට පත් තැනැත්තන්ගෙන් ලැබෙන අභියාචන විභාග කිරීම විනිශ්චය අධිකාරියේ කර්තව්‍ය විය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 213 ඇ, 213ඈ සහ 213ඉ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

**61.** ප්‍රධාන ප්‍රඥප්තියේ 213 ආ වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා එහි 213 ඇ, 213 ඈ සහ 213 ඉ වගන්ති ලෙස බලාත්මක විය යුතු ය :—

"දඩ මුදල්වලින් භාගයක් පොලිස් ත්‍යාග අරමුදලට බැර කළ යුතු බව.

213ඇ. 213 ඈ වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් මුදල් හැර, මේ පනතේ විධිවිධාන යටතේ අය කරගනු ලබන සියලුම දඩ මුදල්වලින් භාගයක් අධිකරණවලින් පනවන ලද දඩ මුදල් හැර, රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු අතර, ඉතිරි භාගය (53 වන අධිකාරිය වූ ) පොලිස් ආඥාපනතේ 73 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ පොලිස් ත්‍යාග අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

මෝටර් වාහන ත්‍යාග සහ දිරිදීමනා අරමුදල.

213ඈ. (1) මේ පනතේ කාර්ය සඳහා (මෙහි මින් මතු "ත්‍යාග සහ දිරිදීමනා අරමුදල " යනුවෙන් සඳහන් කරනු ලබන) මෝටර් වාහන ත්‍යාග අරමුදල නම් වූ අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) (අ) 213 ඉ වගන්තිය යටතේ හෝ රේගු අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ ගෙවීමට නියම කරනු ලබන සියලු මුදල් ත්‍යාග අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

(ආ) අධිකරණය විසින් පනවනු ලැබූ දඩ මුදල් හාර, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් පවරනු ලබන අධිකරණ නඩු යටතේ අය කරගනු ලබන දඩ මුදල්වලින් භාගයක් ත්‍යාග අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(ඇ) මේ පනත යටතේ අයකර ගනු ලබන ගාස්තු, බදු සහ අයභාර වලින් සියයට එකක් ත්‍යාග අරමුදලට බැර කරනු ලබිය යුතු ය.

(3) පහත සඳහන් මුදල් ත්‍යාග අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය:—

(අ) මේ යටතේ සාදනු ලබන නියෝගවලට අනුකූලව වාහන නියාමනය කිරීමේ, පරීක්ෂා කිරීමේ, අධීක්ෂණය කිරීමේ, විමර්ශනය කිරීමේ, අල්ලා ගැනීමේ සහ පාලනය කිරීමේ නියැලී සිටින නිලධරයන්ට ත්‍යාග වශයෙන් ගෙවනු ලබන සියලු මුදල්;

(ආ) අරමුදල පරිපාලනය කිරීමේ දී දරනු ලබන සියලු වියදම් ; සහ

(ඇ) නියමිත ගෙවීම්.

(4) පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය:—

(අ) අරමුදල පාලනය කරනු ලබන ආකාරය නියම කරමින් ;

(ආ) නියම කළ යුතු බවට මේ පනත මගින් නියම කර ඇති සහ අරමුදල හා සම්බන්ධ කාරණා සම්බන්ධයෙන් ;

(ඇ) අරමුදල පිහිටුවීම සහ පරිපාලනය කිරීමට ආනුෂංගික හෝ ඒ හා සම්බන්ධ සියලු කාරණා සම්බන්ධයෙන්.

(5) අරමුදලේ ගිණුම් විගණකාධිපතිවරයා විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

වාහන විකරණය කිරීම සහ වෙනස් කිරීම සඳහා අධිභාර.

213ඉ. (1) යම් වාහනයක නිර්මාණය සහ අනන්‍යතාවයට බලපාන පරිදි එම වාහනය විකරණය කළ, සුළු වශයෙන් වෙනස් කළ හෝ වෙනස් කළ අවස්ථාවක හෝ එහි යාන්ත්‍රික කොටස්වලට යම් වෙනසක් සිදු කළ අවස්ථාවක, මේ යටතේ සාදන ලද නියෝගවල විධිවිධානවලට අනුකූලව අධිභාරයක් පැනවීමේ බලය කොමසාරිස් ජනරාල්වරයා සතුව ඇති අතර, එසේ පැනවීම අවසානාත්මක හා තීරණාත්මක විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන අධිභාර 213 ඈ වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ මෝටර් වාහන ත්‍යාග අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 215ආ වගන්තිය සංශෝධනය කිරීම.

**62.** ප්‍රධාන ප්‍රඥප්තියේ 215 ආ වගන්තියේ “වරදකරු කරනු ලැබූ විට මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට යටත් විය යුතු ය.” යන වචන වෙනුවට “වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්දහසකට නොඅඩු සහ රුපියල් දසදහසකට නොවැඩි දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට යටත් විය යුතු ය.” යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 218 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**63.** ප්‍රධාන ප්‍රඥප්තියේ 218 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

“රක්ෂණ සහතිකය හෝ යෝග්‍යතා සහතික හෝ විමෝචන සහතිකය නොමැතිව රිය පැදවීම සඳහා වූ දණ්ඩනය.

218. 99 වන වගන්තියේ විධිවිධාන හෝ 196 වන වගන්තියේ (5) වන හෝ (6) වන උපවගන්තිවල විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තෙක් වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පන් දහසකට නොඅඩු සහ රුපියල් විසිපන්දහසකට නොවැඩි දඩයකට නැතහොත් මාස

එකකට වැඩි නොවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම ඔහු යටත් වන්නේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 219 වන වගන්තිය සංශෝධනය කිරීම.

**64.** ප්‍රධාන ප්‍රඥප්තියේ 219 වන වගන්තියේ ඇති "රුපියල්" යන වචනයෙන් පටන්ගෙන එම වගන්තියේ අවසානය දක්වා ඇති වචන ඉවත් කොට ඒ වෙනුවට "රුපියල් විසිපන්දහසකට නොඅඩු සහ රුපියල් පනස්දහසකට නොවැඩි දඩයකට සහ මාස තුනකට වැඩි නොවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට සහ නිකුත් කරන ලද හෝ ලියාපදිංචි කරන ලද ලේඛන, එසේ නිකුත් කළ හෝ ලියාපදිංචි කළ දින සිට අවලංගු ලෙස සලකනු ලැබිය යුතු ය." යන වචන ආදේශ කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 220 වන වගන්තිය සංශෝධනය කිරීම.

**65.** ප්‍රධාන ප්‍රඥප්තියේ 220 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම වගන්තියේ (1අ) උපවගන්තිය ලෙස බලාත්මක විය යුතු පහත දැක්වෙන උපවගන්තිය, එම වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිවම ඇතුළත් කිරීමෙන්:—

"(1අ) රියදුරු බලපත්‍රයක් වංචනික ලෙස නිකුත් කරන යම් තැනැත්තෙක් වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කිරීමේ දී රුපියල් විසිපන්දහසකට නොඅඩු සහ රුපියල් පනස් දහසකට නොවැඩි දඩයකට හෝ දෙවන වර හෝ ඊට පසු අවස්ථාවක වරදකරු කිරීමේ දී රුපියල් පනස්දහසකට නොඅඩු සහ රුපියල් එක් ලක්ෂයකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය."

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ—

(අ) (අ) ඡේදයේ ඇති "හෝ ඇප සහතිකයක්" යන වචනය අත්හැරීමෙන් ;

(ආ) (ආ) ඡේදයේ ඇති "හෝ ඇප සහතිකයක්" යන වචන අත් හැරීමෙන් ;

(ඇ) (ඇ) ඡේදයේ ඇති " හෝ ඇප සහතිකයක්" යන වචන අත්හැරීමෙන් ;

(ඇ) "රුපියල් එක් දහසකට නොඅඩු දඩයකට" යන වචනවල සිට එම උපවගන්තියේ අවසානය දක්වා ඇති සියලු වචන ඉවත්කොට, ඒ වෙනුවට "රුපියල් පහළොස්දහසකට නොඅඩු සහ රුපියල් පනස්දහසකට නොවැඩි දඩයකට සහ මාස තුනකට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට සහ නිකුත් කරන ලද හෝ ලියාපදිංචි කරන ලද ලේඛන, එසේ නිකුත් කළ හෝ ලියාපදිංචි කළ දින සිට අවලංගු ලෙස සලකනු ලැබිය යුතු ය" යන වචන ආදේශ කිරීමෙන්.

(3) එම වගන්තියේ (3) වන උපවගන්තියේ—

(අ) "හෝ ඇප සහතිකයක්" යන වචන අත්හැරීමෙන්; සහ

(ආ) "රුපියල් එක් දහසකට නොඅඩු දඩයකට" යන වචනවල සිට එම උපවගන්තියේ අවසානය දක්වා ඇති සියලු වචන ඉවත් කොට, ඒ වෙනුවට "රුපියල් පහළොස් දහසකට නොඅඩු සහ රුපියල් විසිපන් දහසකට නොවැඩි දඩයකට සහ මාස දෙකකට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාර ගත කිරීම යන දෙකටම ඔහු යටත් විය යුතු ය" යන වචන ආදේශ කිරීමෙන් ;

ප්‍රධාන ප්‍රඥප්තියේ 223 වන වගන්තිය සංශෝධනය කිරීම.

**66.** ප්‍රධාන ප්‍රඥප්තියේ 223 වන වගන්තියේ ඇති "වරද සම්බන්ධයෙන් යම් තොරතුරක් ලබා දෙන" යන වචනවල සිට එම වගන්තියේ අවසානය දක්වා ඇති සියලු වචන ඉවත් කොට ඒ වෙනුවට "වරද සම්බන්ධයෙන් අසත්‍ය බවට තමා දන්නා හෝ විශ්වාස කරන යම් තොරතුරක් ලබා දෙන හෝ යම් ප්‍රකාශයක් කරන යම් තැනැත්තෙක්, එම වරද, දණ්ඩ නීති සංග්‍රහයේ 38(3) වගන්තියේ සහ 198 වන වගන්තියේ අර්ථානුකූලව වරදක් නොවන

අවස්ථාවක, එම තැනැත්තා මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කිරීමේ දී රුපියල් දස දහසකට අඩු නොවන සහ රුපියල් විසි දහසකට වැඩි නොවන දඩයකට හෝ මාස හයකට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 224 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**67.** ප්‍රධාන ප්‍රඥප්තියේ 224 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"පොදු දණ්ඩන.

224. මේ පනත ප්‍රකාශිතව විධිවිධාන සලස්වා නොමැති යම් වරදක් සඳහා වරදකරුවන යම් තැනැත්තකු, ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දහසකට නොඅඩු සහ රුපියල් දෙදහසක් නොඉක්මවන දඩයකට ද දෙවන වරට වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දෙදහසට නොඅඩු සහ රුපියල් තුන් දහසක් නොඉක්මවන දඩයකට ද තුන්වන හෝ තදනන්තර වරදකරු කරනු ලැබීමේ දී රුපියල් තුන්දහස් පන්සියයක් නොඉක්මවන දඩයකට සහ ඊට අමතරව තම රියදුරු බලපත්‍රය අවලංගුවීමකට ඔහු යටත් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 232ආ, 232ඇ, 232ඈ, 232ඉ සහ 232ඊ වගන්ති ඇතුළත් කිරීම.

**68.** ප්‍රධාන ප්‍රඥප්තියේ 232 අ වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා එම ප්‍රඥප්තියේ 232 ආ, 232ඇ සහ 232ඈ, 232 ඉ සහ 232ඊ වගන්ති ලෙස බලාත්මක විය යුතු ය :—

"වාහන තහනමට ගැනීම හා රාජසන්තක කිරීම.

232ආ. (1) තත් කාලයේ බලපවත්නා යම් නීතියක් යටතේ යම් වරදක් සිදු කිරීම සඳහා හෝ ඒ සම්බන්ධයෙන් 19අ වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින් යම් මෝටර් වාහනයක් සකස් කර ඇති බවට, නිෂ්පාදනය කර ඇති බවට හෝ එකලස් කර ඇති බවට, අලුතින් නිර්මාණය කර ඇති බවට හා අනුවර්තනය කර ඇති බවට, විකරණය

කර ඇති බවට හෝ එහි නිර්මාණය වෙනස් කර ඇති බවට විශ්වාස කිරීමට, මෝටර් වාහන පරීක්ෂකවරයකුට හෝ බලයලත් නිලධරයකුට හෝ පොලිස් නිලධරයකුට හේතු ඇත්නම්, එම නිලධරයා විසින් යම් පරීක්ෂණයක කාර්ය සඳහා අවශ්‍ය වන කාලයක් සඳහා එම මෝටර් වාහනය තහනමට ගෙන රඳවා තබා ගත හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් මෝටර් වාහනයක්, යම් බලයලත් නිරධරයකු විසින් තහනමට ගනු ලබන අවස්ථාවක, පරීක්ෂණය අවසන් වනතුරු එම මෝටර් වාහනය කොමසාරිස්-ජනරාල්වරයාගේ භාරකාරත්වය හා පාලනය යටතේ තැබිය යුතු ය.

(3) මෝටර් වාහන පරීක්ෂකයකු විසින් හෝ බලයලත් නිලධරයකු විසින් හෝ පොලිස් නිලධරයකු විසින් යථා පරිදි පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසු තහනමට ගනු ලැබූ යම් මෝටර් වාහනයක්—

(අ) 19අ වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින් සකස් කර ඇති බවට, නිෂ්පාදනය කර ඇති බවට, එකලස් කර ඇති බවට, අලුතින් නිර්මාණය කර ඇති බවට, අනුවර්තනය කර ඇති බවට, විකරණය කර ඇති බවට හෝ නිර්මාණය වෙනස් කර ඇති බවට ; සහ

(ආ) තත් කාලයේ බලපවත්නා යම් නීතියක් යටතේ යම් වරදක් සිදු කිරීමට හෝ ඒ සම්බන්ධයෙන්, එම වාහනය භාවිත කර ඇති බවට,

එම නිලධරයා සෑහීමකට පත් වන්නේ නම්, එම පරීක්ෂණය පවත්වන කාලය තුළ දී මතු වූ කාරණා පිළිබඳ වාර්තාවක් කොමසාරිස් ජනරාල්වරයාට ඉදිරිපත් කළ යුතු අතර, එම වාහනයේ රියදුරාට එරෙහිව 2අ වගන්තිය යටතේ සහ වෙනත් යම් නීතියක් යටතේ නිසි බලය ඇති අධිකරණයක නඩු පවරනු ලැබිය යුතු ය.

(4) මෝටර් වාහන කෙමසාරිස් ජනරාල්වරයා විසින් වාර්තාවේ සඳහන් කාරණාවල සත්‍යතාවය පිළිබඳ ඔහු සෑහීමට පත්වන්නේ නම්, ඒ වාහනය රාජසන්තක කිරීම සඳහා උපදෙස් දෙනු ලැබිය යුතු අතර, ඒ අනුව ඒ වාහනය රාජසන්තක විය යුතු ය.

(5) (4) වන උපවගන්තිය යටතේ රාජසන්තක කරන ලද යම් මෝටර් වාහනයක් රාජසන්තක කරනු ලැබූ විට, රජය වෙත සම්පූර්ණයෙන් පැවරෙනු ඇත. ඒ පැවරීම—

(අ) එම රාජසන්තක කිරීමේ නියමයට එරෙහිව අභියාචනාධිකරණය වෙත යම් අභියාචනයක් ඉදිරිපත් කළ හැකි කාලසීමාව අවසන් වීමෙන් පසු ; හෝ

(ආ) රාජසන්තක කිරීමේ ආඥාවට එරෙහිව අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇති අවස්ථාවක එම රාජසන්තක කිරීම ස්ථිර කරමින් හෝ අනුමත කරමින් එම අභියාචනය තීරණය කිරීමෙන් පසු,

බලාත්මක විය යුතු ය.

(6) එම ඉල්ලුම් පත්‍රයේ අනුප්තියට පත් තැනැත්තා පැමිණිලිකරු වශයෙන් ද අවස්ථාවෝචිත පරිදි මෝටර් වාහන පරීක්ෂකවරයා බලයලත් නිලධරයා හෝ පොලිස් නිලධරයා විත්තිකරු වශයෙන් විස්තර කළ යුතු ය. ඉල්ලුම් පත්‍රයෙහි—

(අ) අභියාචනාධිකරණයෙහි නම ද අභියාචනාධිකරණයට ඉල්ලීම ඉදිරිපත් කරන දිනය ද;

(ආ) මෝටර් වාහන පරීක්ෂකවරයාගේ, බලයලත් නිලධරයාගේ හෝ පොලිස් නිලධරයාගේ නම සහ ලිපිනය ද ; සහ

(ඇ) අධිකරණය විසින් තීරණය කළ යුතු කාරණය පිළිබඳ සරල හා පැහැදිලි ප්‍රකාශයක් ද එනම්, ඉල්ලුම් පත්‍රයට අදාළ විෂය කරුණක් වන්නා වූ ද, මෝටර් වාහනය තහනමට ගෙන රාජසන්තක කිරීම නීති විරෝධි බවට ද, කරුණු අඩංගු විය යුතු අතර—

(i) එසේ තහනමට ගෙන රාජසන්තක කිරීම නීති විරෝධි බවට,

(ii) එම වාහනය වහාම පැමිණිලිකරුට ආපසු භාරදිය යුතු බවට,

අධිකරණය තීරණය කළ යුතු බවට ප්‍රකාශයක් අතුළත් විය යුතු ය.

(7) යම් මෝටර් වාහනයක් තහනමට ගැනීම සහ රාජසන්නත කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද යම් ඉල්ලීමක් පිළිබඳ යම් අභියාචනාධිකරණයක පවතින යම් නඩු කටයුත්තක දී එම උපවගන්තිය යටතේ එසේ තහනමට ගැනීම සහ රාජසන්තක කිරීම නීති විරෝධී බව ඔප්පු කිරීමේ භාරය පැමිණිලිකරු වෙත පැවරිය යුතු ය.

(8) මේ වගන්තිය යටතේ රාජ සන්තක කරනු ලැබූ වාහන බැහැර කිරීමේ පටිපාටිය නිශ්චිතව සඳහන් කරමින් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

නුසුදුස්සකු වීමේ කාල සීමාව අඩු කිරීම.

232ඇ. (1) මේ පනත යටතේ යම් තැනැත්තකු වරදකට වරදකරු කරනු ලැබූ අවස්ථාවක සහ මාස දොලහකට වඩා අඩු නොවන කාලයක් සඳහා රිය පැදවීම සඳහා ඔහු නුසුදුස්සෙකු කරමින් අධිකරණය විසින් ආඥාවක් කරන අවස්ථාවක මේ වගන්තිය යටතේ වූ ආඥාවේ නිශ්චිතව දැක්වෙන දිනයක දී එම තැනැත්තා මේ වගන්තියේ කාර්ය සඳහා අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද සහ අධිකරණයක් විසින් නම් කරන ලද පාඨමාලාවක් සාර්ථකව සම්පූර්ණ කරන්නේ නම් අධිකරණය විසින් එම නුසුදුසුකම් ලැබීමේ සීමාව අඩු කරනු ලැබිය යුතු ය.

(2) අධිකරණය විසින් පනවන ලද නුසුදුසුකම් ලැබීමේ කාලසීමාවක් සම්බන්ධයෙන් මෙම වගන්තිය යටතේ කරන ලද යම් ආඥාවක් යටතේ එම කාලසීමාව අඩු කිරීම මාස තුනකට අඩු නොවන සහ අඩු නොකරන ලද කාලසීමාවෙන් එක කාර්තුවකට වැඩි නොවන කාලසීමාවක් වශයෙන් ආඥාවේ නිශ්චිතව දක්වනු ලබන කාලයක් විය යුතු අතර, ඒ අනුව පනවා ඇති කාලසීමාව මාස දොළහක් වන අවස්ථාවක අඩු කරන කාලසීමාව මාස නවයක් විය යුතු ය. තවද පනවා ඇති කාලසීමාව මාස හයක් වන අවස්ථාවක අඩු කරන කාලසීමාව මාස තුනක් විය යුතු ය.

(3) (අ) ආඥාවේ නිශ්චිතව සඳහන් පාඨමාලාවේ ස්ථානයක් වැරදිකරුට ලබා දිය හැකි බවට අධිකරණය සෑහීමකට පත් වන්නේ නම් මිස ;

(ආ) අධිකරණය විසින් ආඥාවේ බලපෑම වැරදිකරුට පැහැදිලි කර දී ඇත්නම් මිස සහ පාඨමාලාව සඳහා වන ගාස්තු ප්‍රමාණය සහ පාඨමාලාව ආරම්භ කිරීමට පෙර ඔහු විසින් මුදල් ගෙවිය යුතු බවට වූ අවශ්‍යතාවය පිළිබඳව අධිකරණය විසින් ඔහුට දැනුම් දී ඇත්නම් මිස ; සහ

(ඇ) ආඥාව කළ යුතු බවට වැරදිකරු එකඟ වී ඇත්නම් මිස,

අධිකරණය විසින් මේ වගන්තිය යටතේ වූ ආඥාවක් නොකළ යුතු ය.

(4) පාඨමාලාවක් අවසන් කළ යුතු අන්තිම දිනය වශයෙන් ආඥාවේ සඳහන් දිනය ආඥාව මගින් අඩු කරනු ලැබූ නුසුදුස්සකු වීමේ කාල සීමාවේ අවසාන දිනයට අවම වශයෙන් මාස දෙකකට පෙර දිනයක් විය යුතු ය.

(5) පාඨමාලාව සාර්ථකව අවසන් කිරීමෙන් පසු, පාඨමාලාව පැවැත් වූ නිලධරයා විසින් ආඥාව සිදු කළ අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත සහතිකයක් නිකුත් කළ යුතු ය. ඉහත සඳහන් සහතිකය, පනවන ලද නුසුදුස්සකු වන කාලසීමාව අවසන් වීමට පෙර එහෙත් ආඥාව මගින් අඩු කළ හැකි කාල සීමාව අවසන්වීමට පසුව අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත ලැබුණහොත් අඩු කරන ලද කාල සීමාව සහතිකය අධිකරණයට ලැබුණ දිනයේ දී අවසන් වූ ලෙස සලකන ආඥාව බලාත්මක විය යුතු ය.

(6) අධිකරණය විසින් අඩු කරනු ලැබූ නුසුදුස්සකු වීමේ කාලසීමාව අවසන් වීමට පෙර පාඨමාලාව සම්පූර්ණ කරනු නොලැබූ අවස්ථාවක අනුමත පාඨමාලාව සාර්ථකව අවසන් කරන තුරු නුසුදුස්සකු වශයෙන් සිටින ලෙස අධිකරණය විසින් වරදකරු වූ තැනැත්තාට නියෝග කළ යුතු ය.

නඩුවලින් ආරක්ෂා වීම.

232ඈ. (1) මේ පනත යටතේ යම් නිලධරයකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි උද්දේශිත යම් ක්‍රියාවක් සඳහා යම් නිලධරයකුට එරෙහිව සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ (1) වන උපවගන්තියේ සඳහන් යම් නිලධරයකු විසින් කරන ලද හෝ කරන ලදැයි උද්දේශිත යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරිපිට එම නිලධරයාට එරෙහිව පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී එම නිලධරයා විසින් දරන ලද යම් වියදමක්, එම ක්‍රියාව සද්භාවයෙන් කර ඇති බවට අධිකරණය තීරණය කරන්නේ නම්, රජය විසින් ගෙවනු ලැබිය යුතු ය.

රියදුරන් රඳවා ගැනීම.

232ඉ. (අ) තමාගේ නම සහ ලිපිනය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනු ලැබූ විට එය ප්‍රතික්ෂේප කරන හෝ පැහැර හරින හෝ අසත්‍ය බවට පොලිස් නිලධාරියා සාධාරණ ලෙස සැක කරන නමක් සහ ලිපිනයක් ලබා දෙන ;

(ආ) මරණයක් හෝ බරපතල තුවාල සිදු වීමක් සිදු වූ අනතුරකට සම්බන්ධ ;

(ඇ) මත්පැන් හෝ මත්ද්‍රව්‍ය පානය කර ඇති බවට පොලිස් නිලධරයා විසින් සාධාරණ ලෙස සැක කරන ;

(ඈ) පොලිස් නිලධරයාගේ මතය අනුව ව්‍යාජ හෝ කූට ලේඛන හෝ ව්‍යාජ හඳුනා ගැනීමේ අංක තහඩු තම සන්තකයේ ඇති ;

(ඉ) පොලිස් නිලධරයාගේ මතය අනුව, කූට ලෙස වෙනස් කරන ලද හෝ සුළු වශයෙන් වෙනස් කරන ලද චැසි අංක, එන්ජින් අංක ඇති මෝටර් වාහනයකට සන්තකය ඇති ;

(ඊ) සොරකම් කරන ලද වාහනයක් තම සන්තකයේ ඇති බවට පොලිස් නිලධරයා විසින් සාධාරණ ලෙස සැක කරන,

මෝටර් වාහනයක රියදුරකු, පරීක්ෂණයක හෝ විමර්ශනයක කාර්ය සඳහා සාධාරණ

ලෙස අවශ්‍ය කාල සීමාවක් පොලිස් නිලධරයකු විසින් පොලිස් ස්ථානයේ රඳවා තබා ගනු ලැබිය හැකි ය.

වාහන රඳවා තබා ගැනීම.

232ඊ. (1) යම් වාහනයක නිර්මාණය, උපකරණ හා භාවිතය සම්බන්ධයෙන් මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද නියෝගවලට අනුකූලව ක්‍රියා කර නැති බවට විශ්වාස කිරීමට හේතු ඇති, යම් පොලිස් නිලධරයකු හෝ මෝටර් වාහන පරීක්ෂක වරයකු විසින් එම වාහනය ළඟම ඇති පොලිස් ස්ථානය වෙත පදවාගෙන යන ලෙස එහි රියදුරුට නියම කරනු ලැබිය හැකි අතර, අවශ්‍ය වුවහොත්, පරීක්ෂණවල හෝ විමර්ශනවල කාර්ය සඳහා සාධාරණ ලෙස අවශ්‍ය විය හැකි කාලයක්ම එම වාහනය රඳවා තබා ගනු ලැබිය හැකි ය.

(2) (අ) මෝටර් වාහනයක යම් රියදුරකු 99 වන වගන්තිය යටතේ වලංගු රක්ෂණ ඔප්පුවක් ඉදිරිපත් කිරීමට අපොහොසත් නම් ;

(ආ) මෝටර් වාහනයක යම් රියදුරකු සන්තකයේ වලංගු රියදුරු බලපත්‍රයක් නැත්නම් ;

(ඇ) වෙළෙන්දෙකුගේ ලියාපදිංචි සහතිකයක්, අලුත්වැඩියා කරන්නකුගේ ලියාපදිංචි සහතිකයක් හෝ නිෂ්පාදකයකුගේ ලියාපදිංචි සහතිකයක් නොදරන වාහන වෙළෙන්දෙකුට, අලුත්වැඩියා කරන්නකුට හෝ නිෂ්පාදකයකුට එම වාහනය අයත් නම්,

පොලිස් නිලධරයකු විසින් කවර හෝ පොලිස් ස්ථානයක දී එම මෝටර් වාහනය රඳවා තබා ගත හැකි ය.

(3) (අ) යම් මෝටර් වාහනයක් ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කරන ලද ලේඛන ව්‍යාජ හෝ කූට ලේඛන බවට ;

(ආ) වාහනයට, කූට ලෙස සකස් කරන ලද, වෙනස් කරන ලද හෝ සුළු වශයෙන් වෙනස් කරන ලද චැසි හෝ එන්ජින් අංක ඇති බවට ;

(ඇ) වාහනය කාර්මික වශයෙන් දෝෂ සහිත බවට ;

(ඈ) වාහනය සොරකම් කරන ලද එකක් බවට හෝ එය සොරකම් කරන ලද එකක් බවට පොලිස් නිලධරයා සාධාරණ ලෙස සැක කරන්නේ නම්;

(ඉ) වාහනයට ව්‍යාජ හෝ කූට ලෙස සකස් කරන ලද හඳුනා ගැනීමේ අංක තහඩු සවිකර ඇති බවට ;

මෝටර් වාහන පරීක්ෂකවරයකුට හෝ පොලිස් නිලධරයකුට විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇත්නම් එම මෝටර් වාහන පරීක්ෂකවරයා හෝ පොලිස් නිලධරයා විසින් කවර හෝ පොලිස් ස්ථානයක දී හෝ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කවර හෝ පරිශ්‍රයක එම වාහනය රඳවා තබා ගනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියට 239ඈ සහ 239ඉ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

**69.** 239ඇ වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා එහි 239ඈ සහ 239ඉ වගන්ති ලෙස බලාත්මක විය යුතු ය :—

"වැරදි සංඥෙය වැරදි විය යුතු බව.

239ඈ. 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන් වුවද මේ පනත යටතේ වූ සෑම වරදක්ම අපරාධ නඩු විධාන සංග්‍රහයේ අර්ථානුකූලව හා එහි කාර්ය සඳහා සංඥෙය වරදක් විය යුතු ය.

මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් වැරදි විභාග කළ යුතු බව.

239ඉ. මේ පනත යටතේ වූ සියලුම වැරදි සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් නඩු විභාග කළ යුතු ය.".

**70.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

71. ප්‍රධාන ප්‍රඥප්තියේ 240 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කෙරේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 240 වන වගන්තිය සංශෝධන කිරීම.

(1) "සත්වයා" යන යෙදුමේ අර්ථ නිරූපණයට පෙරාතුවම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්—

"අනතුර" යන්නෙන්—

(අ) මාර්ගයක, වීදියක හෝ පොදු ප්‍රවාහනයට විවෘත වූ වෙනත් යම් ස්ථානයක සිදුවන හෝ ඇතිවන ;

(ආ) පුද්ගලයන් එක් අයකු හෝ ඊට වැඩි ප්‍රමාණයක් මියයන හෝ ඔවුන්ට තුවාල සිදුවන හෝ දේපළවලට අලාභහානි සිදුවන ;

(ඇ) අවම වශයෙන් ධාවනය වන එක් වාහනයක් හෝ සම්බන්ධ වී ඇති සහ වාහන අතර, වාහන සහ මගීන් අතර සහ වාහන සහ සතුන් අතර හෝ වාහන සහ ස්ථාවර වස්තූන් අතර ගැටීම් ඇති වී ඇති සහ එක් වාහනයක් පමණක් අදාළ වී ඇති වාහන,

අනතුරු ද අදහස් වේ.

"පනත" යන්නෙන්, (203 වැනි අධිකාරය වූ) මෝටර් රථ වාහන පනත අදහස් වේ ;

"සවි කිරීමේ උපකරණ" යන්නෙන්, වාහනයකට හෝ ආසනයකට සවිකිරීම සඳහා නිර්මාණය කර ඇති වාහන බඳපටියක අවසාන කොටස අදහස් වේ ;

"අනුමත සහතික කිරීමේ නිලධරයා" යන්නෙන්, 196 වන වගන්තිය යටතේ යෝග්‍යතා සහතිකයක් නිකුත් කිරීමේ කාර්යය සඳහා මෝටර් වාහනයක් පරීක්ෂා කරන 195 වන වගන්තියේ සඳහන් සහතික කිරීමේ නිලධරයකු අදහස් වේ ;

"අනුමත ගරාජය" යන්නෙන්, වාර්ෂික ආදායම් බලපත්‍ර නිකුත් කිරීමට පෙර මෝටර් වාහනයක යෝග්‍යතාවය පරීක්ෂා කිරීමේ සහ සහතික කිරීමේ කාර්යය සඳහා 195 වන වගන්තිය යටතේ කරනු ලබන නියමයක් මගින් අනුමත ගරාජයක් බවට කොමසාරිස් ජනරාල්වරයා හෝ පළාත් මෝටර් වාහන කොමසාරිස්වරයා විසින් ප්‍රකාශයට පත්කරනු ලබන ගරාජයක් අදහස් වේ ;

(2) "සත්වයා" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉකිබිතිව ම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් :—

"නීති විරෝධී ලෙස එකලස් කිරීම" යන්නෙන්—

(අ) සමාගමෙන් ලබාගත් අලුත් කොටස් වලින් හැර ;

(ආ) එම කොටස්වල නිෂ්පාදකයාගෙන් ලබාගත් පූර්ව ලිඛිත අවසරය නොමැතිව ; හෝ

(ඇ) කොමසාරිස් ජනරාල්වරයාගේ පූර්ව ලිඛිත අනුමතිය නොමැතිව,

මෝටර් වාහනයක් එකලස් කිරීම අදහස් වේ.

(3) "ඇඳන ලද වාහනය" යන්නෙහි අර්ථ නිරූපණය වෙනුවට පහත සඳහන් අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන් :—

"ඇඳන ලද වාහනය" යන්නෙන්, ප්‍රයිම් මූවරයක් සහ අර්ධ ට්‍රේලරයක් අමුණා සකස් කළ මෝටර් වාහනයක් අදහස් වේ ;

(4) "රාත්‍රී කාලයේ දී" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිවම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් :—

"වෙළඳ නාමය යෙදීම" යන්නෙන්, වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්වරයා වෙත හෝ වෙළඳ ලකුණු යොදන ලද අමතර කොටස් නිෂ්පාදනය කරනු ලැබූවා වූ ද, විදේශීය රටක සමාන බලධරයා වෙත ලියාපදිංචි වී ඇත්තා වූ ද, නිෂ්පාදකයකුගේ වෙළඳ නාමය යෙදීම අදහස් වන අතර, එම අමතර කොටස්වල මුල් නිෂ්පාදකයා සමග ගිවිසුමකට එළඹුන නිෂ්පාදකයකු විසින් වෙළඳ ලකුණු යොදන ලද කොටස් ද ඇතුළත් වේ ;

"ගාංචු සංරචිතය" යන්නෙන්, ගාංචු ඒකාබද්ධ කිරීම සඳහා එකිනෙකට සවි වන ලෙස නිර්මාණය කර ඇති ගාංචු සංයුතියක කොටස් දෙකෙන් එක් කොටසක් අදහස් වේ ;

"යෝග්‍යතා සහතිකය" යන්නෙන්, මේ පනතේ 196 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලබන සහතිකයක් අදහස් වෙන අතර, ඊට වාහනයේ යාන්ත්‍රික තත්ත්වය පිළිබඳ ප්‍රකාශයක් ද ඇතුළත් වේ ;

(5) "රක්ෂණ සහතිකය" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිවම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් :—

"ලියාපදිංචි කිරීමේ සහතිකය" යන්නෙන්, මේ පනතේ විධිවිධාන යටතේ යම් මෝටර් වාහනයක් යථා පරිදි ලියාපදිංචි කර ඇති බව පෙන්වීම සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද සහතිකයක් අදහස් වේ ;

(6) "කොමසාරිස්වරයා" යන යෙදුමේ අර්ථ නිරූපණය වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන් :—

"කොමසාරිස් ජනරාල්වරයා" යන්නෙන්, මේ පනතේ 204 වන වගන්තිය යටතේ පත් කරනු ලබන මෝටර් වාහන කොමසාරිස් ජනරාල්වරයා අදහස් වේ ;

(7) "කොමසාරිස් ජනරාල්වරයා" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිවම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් :—

"වෙළෙන්දා" යන්නෙන්, මෝටර් වාහන උකස් කිරීමේ, විකිණීමේ, ආනයනය කිරීමේ, බද්දට හෝ කුලී සින්නක්කර ලෙස ලබා දීමේ ව්‍යාපාරයේ යෙදී සිටින තැනැත්තකු අදහස් වන අතර, ඊට ආනයනකරුවකු ද ඇතුළත් වේ ;

"මියයාම" යන්නෙන්, යම් වාහන අනතුරක ප්‍රතිඵලයක් වශයෙන් එම ස්ථානයේ දී ම යම් තැනැත්තකු මිය යාම හෝ එම අනතුරේ ප්‍රතිඵලයක් වශයෙන් වාහන අනතුර සිදු වී දින තිහක් ඇතුළත මියයාම අදහස් වේ ;

(8) "රියදුරු උපදේශක" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන් :—

"රියදුරු උපදේශක හෝ සහකාර රියදුරු උපදේශක" යන්නෙන්, වලංගු රියදුරු උපදේශක බලපත්‍රයක සන්තකය දරන්නා වූ ද රියදුරු පාසලක සේවයේ නියුක්තව සිටින්නා වූ ද, කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරනු ලබන පරිදි ගාස්තුවක් හෝ ත්‍යාගයක් සඳහා මෝටර් වාහන පැදවීම සඳහා උපදෙස් ලබාදෙන්නා වූ ද, තැනැත්තකු අදහස් වේ ;

"රියදුරු බලපත්‍රය" යන්නෙන්, මේ පනතේ VII වන කොටස යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් අදහස් වේ ;

"රියදුරු පාසල" යන්නෙන්, මේ පනතේ විධිවිධාන යටතේ ලියාපදිංචි කරන ලද සහ ගාස්තුවක් හෝ ප්‍රතිලාභයක් සඳහා මෝටර් වාහන පැදවීම පිළිබඳ උපදෙස් ලබා දෙන ආයතනයක් අදහස් වේ ;

"ද්විත්ව කාර්ය වාහන" යන්නෙන්, එකම අවස්ථාවේ දී මඟීන් සහ භාණ්ඩ රැගෙන යාමේ කාර්යය සඳහා නිර්මාණය කරන ලද සහ සාදන ලද මෝටර් වාහනයක් අදහස් වන අතර, (රියදුරු ඇතුළු) රැගෙන යන මඟීන් සංඛ්‍යාව නව දෙනෙකුට වඩා වැඩි නොවිය යුතු අතර, වාහනයේ දළ බර කිලෝ ග්‍රෑම්ස් තුන්දහස් පන්සීයයකට වඩා වැඩි නොවිය යුතු ය ;

"හදිසි අවස්ථා වාහනය" යන්නෙන්—

(අ) හදිසි අවස්ථාවකට ප්‍රතිචාර දක්වන ගිනි නිවන හමුදාව හෝ පොලීසිය විසින් භාවිත කරනු ලබන වාහනයක් හෝ ගිලන් රථයක් ; සහ

(i) ගිනි නිවන හමුදාව සම්බන්ධයෙන් වන විට රතු එළියක් භාවිත කිරීමෙන් හඳුනා ගනු ලබන වාහනයක් ;

(ii) පොලීසිය විසින් භාවිත කරනු ලබන වාහනයක් සම්බන්ධයෙන් වන විට රතු සහ නිල් එළියක් භාවිත කිරීමෙන් හඳුනා ගනු ලබන වාහනයක් ;

(iii) ගිලන් රථයක් සම්බන්ධයෙන් වන විට රතු එළියක් භාවිත කිරීමෙන් හඳුනා ගනු ලබන වාහනයක් සහ ;

(ආ) මෝටර් රථ කොමසාරිස්වරයාගේ අනුමතිය ඇතිව, නිවී නිවී දැල්වෙන, නිල් එළියක් හෝ කහ එළියක් භාවිත කරමින් හදිසි අවස්ථාවකට ප්‍රතිචාර දක්වන වෙනත් යම් වාහනයක් අදහස් වේ ;

"විමෝචන සහතිකය" යන්නෙන්, වාහනයකින් පිටවන දුමක්, දෘශ්‍ය වායුවක්, දුමාරයක්, ගිනි පුපුරු අලු දැලි, ග්‍රීස් හෝ තෙල් සහිත ද්‍රව්‍ය විමෝචනය වීමේ බලපෑම අවසර ලත් සීමාව ඇතුළත යන්න පිළිබඳ ප්‍රකාශයක් අදහස් වේ ;

(9) "පරීක්ෂක" යන යෙදුමේ අර්ථ නිරූපණය සඳහා පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන් :—

"පරීක්ෂක" යන්නෙන්, මේ පනත යටතේ පත් කරන ලද හෝ පත් කරනු ලදැයි අදහස් කරනු ලබන මෝටර් වාහන පරීක්ෂකවරයකු අදහස් වන අතර, ඊට ප්‍රධාන පරීක්ෂකවරයකු සහ නියෝජ්‍ය ප්‍රධාන පරීක්ෂකවරයකු ඇතුළත් වේ ;

(10) "පරීක්ෂක" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව පහත දැක්වෙන අර්ථ නිරූපණ ඇතුළත් කිරීමෙන් :—

"නීති විරෝධී ලෙස සකස් කරන ලද" යන්නෙන්, කොමසාරිස් ජනරාල්වරයාගේ පූර්ව ලිඛිත අවසරය නොමැතිව යම් මෝටර් වාහනයක, මුලාකෘතියට වෙනසක් සිදු කරමින් එම වාහනයේ වැසියට හෝ වැසියේ කොටසකට නැතහොත් බඳට හෝ බඳ කොටසකට සිදු කරන ලද සකස් කිරීමක් අදහස් වේ ;

"මාරාන්තික රිය අනතුර" යන්නෙන්, යම් තනි ගමනාගමන වාහනයක් හෝ ගමනාගමන වාහන කීපයක් ඇතුළත් වන යම් රිය අනතුරකින් එකී රිය අනතුර සිදු වී දින තිහක් ඇතුළත එක් තැනැත්තකු හෝ තැනැත්තන් කිහිප දෙනෙකු මිය ගියා වූ රිය අනතුරක් අදහස් වේ ;

"භාණ්ඩ" යන්නට, සජීවී තැනැත්තකු හැර වාහනයක් විසින් රැගෙන යන (වාහනයක සාමාන්‍යයෙන් පාවිච්චි කරන උපකරණයක් හැර) පශු සම්පත් සහ වෙනත් යම් දෙයක් අදහස් වන අතර, එයට මෝටර් රථයක් හෝ මෝටර් රථයකට සවි කරන ලද ට්‍රේලරයක ගෙන යනු ලබන ගමන් බඩු හෝ පුද්ගලික භාණ්ඩ නැතහොත් වාහනයේ ගමන් කරන මගියකුගේ පුද්ගලික ගමන් බඩු ඇතුළත් නොවේ;

(11) "ග්‍රාම සේවා නිලධාරි" යන අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ නිරූපණ ආදේශ කරන්න :—

"බරපතල තුවාලය" යන්නෙන්, (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ 311 වන වගන්තියේ සඳහන් කර ඇති තුවාල වර්ග එකක් හෝ කීපයක් අදහස් වේ ;

"දළ වාහන බර" යන්නෙන්, වාහනයේ සමස්ත බර ප්‍රමාණය සහ ලියාපදිංචි කිරීමේ අධිකාරිය විසින් එකී වාහනය සඳහා අවසර දිය හැකි ආකාරයට සහතික කළ සහ ලියාපදිංචි කළ බර ප්‍රමාණය අදහස් වේ ;

(12) "අත් ට්‍රැක්ටරය" යන යෙදුමේ අර්ථ කථනයට ඉක්බිතිවම පහත දැක්වෙන අර්ථ කථනය ඇතුළත් කිරීමෙන් :—

"බර මෝටර් කෝච් රථය" යන්නෙන්, රියදුරු අසුන ද ඇතුළත්ව ආසන තිස් තුනකට නොවැඩි අසුන් ගැනීමේ ඉඩ ප්‍රමාණයකින් යුත් මෝටර් කෝච් රථයක් සමග එහි ට්‍රේලරය අමුණා ඇති රථයක් අදහස් වන අතර එහි උපරිම අනුමත තාර බර කිලෝ ග්‍රෑම් හත්සිය පනහකට වැඩි විය යුතු ය ; නැතහොත් මෝටර් කෝච් රථ දෙකක් ඒකාබද්ධ කිරීම අදහස් වේ ;

"බර මෝටර් ලොරිය" යන්නෙන්, මෝටර් ලොරියක් හෝ ට්‍රේලරයක් හෝ ඇදන ලද වාහනයක් ඒකාබද්ධ කිරීම අදහස් වන අතර, එම ට්‍රේලරයේ අනුමත තාර බර කිලෝ ග්‍රෑම්ස් හත්සිය පහනකට වඩා වැඩි විය යුතු අතර, එම මෝටර් ලොරියේ සහ ට්‍රේලරයේ නැතහොත් ට්‍රේලරවල බර හෝ වාහනයේ දළ බර හෝ ට්‍රේලරවල දළ බර කිලෝ ග්‍රෑම් තුන්සිය පනහකට වඩා වැඩි විය යුතු ය.

(13) "මහා මාර්ගය" යන අර්ථ නිරූපණය ඉවත් කිරීමෙන් :—

(14) "බර මෝටර් ලොරිය" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිවම පහත දැක්වෙන අර්ථ නිරූපණ ඇතුළත් කිරීමෙන් :—

"පරීක්ෂණ සහතිකය" යන්නෙන්, මෝටර් වාහනය පරීක්ෂා කිරීමෙන් පසුව කොමසාරිස් ජනරාල්වරයා විසින් බලය දෙන ලද යම් නිලධරයකු විසින් වාහනයේ බඳ කොටස, එන්ජිම සහ චැසිය මේ පනතේ විධිවිධානවලට සහ එය යටතේ සාදන ලද නියෝගවලට එකඟ වන්නේ ද යන්න පිළිබඳව පරීක්ෂා කර සෑහීමට පත් වීමෙන් පසු, ඔහු විසින් ප්‍රදානය කරනු ලබන සහතිකයක් අදහස් වේ ;

"පරීක්ෂණ සහ සෝදිසි කිරීමේ මධ්‍යස්ථානය" යන්නෙන්, 195 වන වගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරන ලද යම් පරීක්ෂණ සහ සෝදිසි කිරීමේ මධ්‍යස්ථානයක් අදහස් වේ ;

"උපදේශක" යන්නට, සහකාර උපදේශකවරයකු, ඇතුළත් වන අතර ;

"උපදේශක බලපත්‍රය" යන්නට, සහකාර උපදේශක බලපත්‍රයක් ද ඇතුළත් වේ ;";

(15) "ඉඩම් වාහනය" යන යෙදුමේ අර්ථ නිරූපණය වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන් :—

"ඉඩම් වාහනය" යන්නෙන්, ට්‍රේලරය ඇතුළු දළ වාහන බර කිලෝ ග්‍රෑම්ස් තුන්දහස් පන්සීයයක්

නොඉක්මවන්නා වූ ද, සම්පූර්ණයෙන් හෝ ප්‍රධාන වශයෙන් කෘෂිකාර්මික කාර්යවලට අදාළව ඉඩම්වල භාවිත කිරීම සඳහා නැතහොත් ඉදිකිරීම් ද්‍රව්‍ය සහ කුණු කසළ රැගෙන යාම සඳහා නිෂ්පාදනය කරනු ලැබුවා වූ ද, සූර්ය බලයෙන් ක්‍රියා කරන හෝ යාන්ත්‍රිකව හෝ විදුලි බලයෙන් හෝ ද්‍රව පෙට්රෝලියම් ගෑස් ක්‍රියා කරනු ලබන වාහනයක් අදහස් වේ ;

(16) "ඉඩම් වාහනය" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිවම පහත දැක්වෙන අර්ථ නිරූපණ ඇතුළත් කිරීමෙන් :—

"බඳ පටිය" යන්නෙන්, බඳ ආරක්ෂා කිරීම සඳහා පමණක් නිර්මාණය කරන ලද ආසන පටියක් අදහස් වේ ;

"බඳ ආසන පටිය" යන්නෙන්, බඳ ප්‍රදේශය සඳහා නිර්මාණය කරන ලද බඳ පටියක සහ ඉණ හා ඉහළ පපු පෙදෙස ආරක්ෂාව සඳහා නිර්මාණය කරන ලද පටියක එකතුවක් අදහස් වේ.

(17) "බලපත්‍ර නිකුත් කිරීමේ බලධරයා" යන අර්ථ නිරූපණය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන් :—

"බලපත්‍ර නිකුත් කිරීමේ බලධරයා" යන්නෙන්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව යටතේ ආදායම් බලපත්‍ර නිකුත් කිරීම සඳහා බලය පවරා දී ඇති අධිකාරිය අදහස් වේ ;

(18) "බලපත්‍ර නිකුත් කිරීමේ බලධරයා" යන අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් :—

"සැහැල්ලු මෝටර් කෝච් රථය" යන්නෙන්, රියදුරුගේ ආසනයද ඇතුළත්ව පුද්ගලයන් දස දෙනෙකුට හෝ ඊට වැඩි සහ පුද්ගලයන් තිස් හතරකට අඩු සංඛ්‍යාවකට අසුන් ගැනීමේ ඉඩකඩ ඇති මෝටර් ගිලන් රථයක් හෝ මෝටර් අවමංගල්‍ය රථයක් නොවන්නා වූ ද, ඔවුන්ගේ බඩු භාහිරාදිය රැගෙන යාම සඳහා නිර්මාණය කරන ලද හෝ සාදන ලද මෝටර් වාහනයක් අදහස්

වන අතර, කිලෝ ග්‍රෑම් හත්සිය පනහකට වඩා වැඩි නොවන්නා වූ අවසර ලත් තාර බර ප්‍රමාණයකින් යුක්ත වන ට්‍රේලරයක් ද ඊට ඇතුළත් වේ ;

"සැහැල්ලු මෝටර් ලොරිය" යන්නෙන්, දළ වාහන බර කිලෝ ග්‍රෑම් තුන්දහස් පන්සීයයකට වැඩි වන්නා වූ ද, කිලෝ ග්‍රෑම් දාහත් දහසකට වැඩි නොවන්නා වූ ද, කිලෝ ග්‍රෑම් හත්සිය පනහකට වැඩි නොවන අවම අනුමත තාර බරක් ඇති ට්‍රේලරයක් සමග සම්බන්ධ කර තිබිය හැකි මෝටර් ලොරියක් අදහස් වන අතර එයට මෝටර් අවමංගල රථයක් සහ ගිලන් රථයක් ද ඇතුළත් වේ.

(19) "ලොරිය" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කිරීමෙන් ;

(20) "පළාත් පාලන ආයතනය" යන යෙදුමට ඉක්බිතිවම පහත දැක්වෙන අර්ථ නිරූපණ ඇතුළත් කිරීමෙන් :—

"නිෂ්පාදකයා" යන්නෙන්, අනුමත කර්මාන්ත ශාලාවක දී වැසිවලට සම්බන්ධ කිරීම සඳහා වාහන බොඩි නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයේ නියැලී සිටින තැනැත්තෙක් අදහස් වේ ;

"නීති විරෝධී ලෙස නිෂ්පාදනය කිරීම, නිර්මාණය කිරීම, අනුවර්තනය කිරීම, විකරණය කිරීම හෝ නිර්මාණය වෙනස් කිරීම" යන්නෙන්, 19අ වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයාගේ පූර්ව ලිඛිත අනුමතිය නොමැතිව මෝටර් වාහනයක් නිෂ්පාදනය කිරීම, නිර්මාණය කිරීම, අනුවර්තනය කිරීම, විකරණය කිරීම හෝ නිර්මාණය වෙනස් කිරීම අදහස් වේ ;

(21) "මොපෙඩය" යන යෙදුමේ අර්ථ නිරූපණය වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන් :—

"මොපෙඩය" යන්නෙන්, පැදවීම පිණිස පැඩල්ස් සවිකර ඇත්තා වූ ද, සහ සෙන්ටි මීටර් පනහකට වැඩි නොවන සිලින්ඩර ධාරිතාවක් ඇත්තා වූ ද, අන්තර් දහන එන්ජිමක් සහිත මෝටර් සයිකලයක් අදහස් වේ ;

(22) "මෝටර් කෝච්" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන් :—

"මෝටර් කෝච්" යන්නෙන්, මෝටර් ගිලන් රථයක් හෝ මෝටර් අවමංගල්‍ය රථයක් නොවන්නා වූ ද (රියදුරු ඇතුළු පුද්ගලයන් තිස්තුන් දෙනකුට වැඩි සංඛ්‍යාවක් සඳහා අසුන් ගැනීමේ ඉඩකඩ ඇති සහ ඔවුන්ගේ බඩු බාහිරාදිය රැගෙන යන මෝටර් වාහනයක් අදහස් වන අතර, එසේ සාදා ගන්නා ලද හෝ අනුවර්තනය කරන ලද කිලෝ ග්‍රෑම් හත්සිය පනහකට වඩා වැඩි නොවන්නා වූ ට්‍රේලරයක් ද ඊට ඇතුළත් වේ ;

"මෝටර් සයිකලය" යන්නෙන්, රෝද තුනකට වැඩි නොවන රෝද ගණනකින් යුත් ගමන් කිරීම සඳහා සකස් කර ඇති මෝටර් ට්‍රයිසිකලයක් හෝ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථයක් හැර මොපෙඩ් රථයක් ඇතුළු එයට සම්බන්ධ කර ඇති යම් රථයක තාර බරද සමග කිලෝ ග්‍රෑම් දෙසිය පනහක් නොඉක්මවන තාර බරකින් සමන්විත මෝටර් වාහනයක් අදහස් වේ ;";

(23) "මෝටර් අවමංගල්‍ය රථය" යන අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කරන්න :—

"මෝටර් ලොරිය" යන්නෙන්, කිලෝග්‍රෑම් දාහත්දාහට වැඩි නොවන දළ බර ප්‍රමාණයක භාණ්ඩ ගෙනයාම සඳහා සම්පූර්ණයෙන් ම හෝ ප්‍රධාන වශයෙන් ඉදිකරන ලද හෝ අනුවර්තනය කරන ලද සහ කිලෝ ග්‍රෑම් හත්සිය පනහක් නොඉක්මවන උපරිම අවසර ලත් තාර බරකින් යුත් එයට සම්බන්ධ කරන ලද, එසේ ඉදිකළ හෝ අනුවර්තනය කරන ලද ට්‍රේලරයක් ද සම්බන්ධ කළ හැකි වූ මෝටර් වාහනයක් අදහස් වේ ;

(24) "මෝටර් ට්‍රයිසිකලය" සහ "මෝටර් ට්‍රයිසිකල් වෑන් රථය" යන යෙදුම්වල අර්ථ නිරූපණ ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණ ආදේශ කිරීමෙන් :—

"මෝටර් ට්‍රයිසිකලය" යන්නෙන්, රෝද තුනක් මත ගමන් කිරීම සඳහා සැලසුම් කර ඇත්තා වූ ද, තාර බර කිලෝ ග්‍රෑම් පන්සීයයක් නොඉක්මවන්නා වූ ද, සම්පූර්ණ වශයෙන් හෝ ප්‍රධාන වශයෙන් මගීන් ගෙන යාම සඳහා නිර්මාණය කරන ලද මෝටර් වාහනයක් අදහස් වේ ;

"මෝටර් ට්‍රයිසිකල් වෑන් රථය" යන්නෙන්, රෝද තුනක් මත ගමන් කිරීම සඳහා සැලසුම් කර ඇත්තා වූ ද, තාර බර කිලෝ ග්‍රෑම් පන්සීයයක් නොඉක්මවන්නා වූ ද, වාහනයේ දළ බර කිලෝ ග්‍රෑම් දාහක් නොඉක්මවන්නා වූ ද, බඩු ගෙන යාම සඳහා සම්පූර්ණයෙන්ම හෝ ප්‍රධාන වශයෙන් සාදා හෝ සකස් කර ඇත්තා වූ ද, මෝටර් වාහනයක් අදහස් වේ ;";

(25) "මෝටර් වාහනය" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන් :—

"මෝටර් වාහනය" යන්නෙන්—

(අ) මාර්ගවල භාවිත කිරීම සඳහා අදහස් කරන ලද හෝ අන්වර්තික ට්‍රැක්ටරයක් හෝ ට්‍රේලරයක් ඇතුළු යන්ත්‍රානුසාරයෙන්, සහ /හෝ විදුලි බලයෙන් සහ /හෝ සූර්ය බලයෙන් හෝ ධාවනය කරනු ලබන වාහනයක් හෝ ද්‍රව පැට්රෝලියම් වායුව භාවිත කරමින් හෝ විකල්ප ඉන්ධනවලින් ධාවනය කරනු ලබන වාහනයක් අදහස් කරන නමුත් ඊට ගල් රෝලක් ඇතුළත් නොවේ ;

(ආ) මට්ටම් කිරීම, මඩ කැණීම, පස් ඉවත් කිරීම, කැළෑ වැවීම, හෝ ඒ හා සමාන කටයුත්තක් වැනි කෘෂිකාර්මික හෝ ඉදි කිරීමේ කාර්යයක් සම්බන්ධයෙන් ගොඩබිම පාවිච්චි කිරීම සඳහා අදහස් කරන ලද යන්ත්‍රානුසාරයෙන් සහ /හෝ විදුලි බලයෙන් සහ /හෝ සූර්ය බලයෙන් හෝ ද්‍රව පැට්රෝලියම් වායුව භාවිත කරමින් හෝ විකල්ප ඉන්ධන භාවිත කරමින් ධාවනය වන වාහනයක් අදහස් වේ. එහෙත් ගල් රෝලක් ඊට ඇතුළත් නොවේ ;

(26) "අයිතිකරු" යන අර්ථ නිරූපණය වෙනුවට පහත දැක්වෙන නව අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන් :—

"අයිතිකරු" යන්නෙන්, මෝටර් වාහනයක් සම්බන්ධයෙන් වන විට මෝටර් වාහනය ලියාපදිංචි වී ඇත්තේ යම් තැනැත්තකුගේ නමට ද, එම තැනැත්තා අදහස් වන අතර, එම තැනැත්තා බාල වයස්කාර තැනැත්තකු වන අවස්ථාවක දී, එම බාල වයස්කාර තැනැත්තාගේ භාරකරු අදහස් වන අතර, යම් මෝටර් වාහනයක් කුලී සින්නක්කර ගිවිසුමකට හෝ බදු ගිවිසුමකට හෝ උකස් කිරීමේ ගිවිසුමකට යටත් වී ඇති අවස්ථාවක එකී ගිවිසුම යටතේ එම වාහනය සන්තකයේ ඇති තැනැත්තා අදහස් වේ ;

(27) "මගියා" යන අර්ථ නිරූපණයට ඉක්බිතිවම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් :—

"අවසර පත්‍රය" යන්නෙන්, කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලබන අවසර පත්‍රයක් අදහස් වේ ;

(28) "පෞද්ගලික කෝච් රථය" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිවම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරිමෙන් :—

"ප්‍රසිද්ධ ස්ථානය" යන්නෙන්, මහ ජනතාවට ප්‍රවේශය ඇත්තා වූ ද, මහා මාර්ගයක් හෝ එසේ නොවන මාර්ගයක්, විථියක්, පාරක් හෝ වෙනත් ස්ථානයක් අදහස් වන අතර, ඊට බස් රථයකින් මහ ජනතාව නංවන හෝ බස්සවන බස් නැවතුම්පලක් හෝ යම් ස්ථානයක් ඊට ඇතුළත් වේ ;

"පොදු සේවා වාහනය" යන්නෙන්, ගාස්තුවක් හෝ ප්‍රතිලාභයක් සඳහා මගීන් රැගෙන යාම සඳහා භාවිත කරන හෝ අනුවර්තිත හෝ තබා ඇති යම් මෝටර් වාහනයක් අදහස් වේ ;";

(29) "ලේඛනය" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිවම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් :—

"මෝටර් වාහනයකට හෝ ට්‍රේලරයකට අදාළව "ලියාපදිංචි අයිතිකරු" යන්නෙන්, එම මෝටර් වාහනය හෝ ට්‍රේලරය ලියාපදිංචි කර ඇත්තේ යම් තැනැත්තකුගේ නමටද, ඒ තැනැත්තා අදහස් වේ ;";

(30) "ඉවත් කරන ලද ආඥාපනත" යන අර්ථ නිරූපණයට ඉක්බිතිවම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් :—

"මාර්ගය" යන්නෙන්, මහ ජනතාවට ප්‍රවේශය ඇති යම් ප්‍රසිද්ධ පාරක් හෝ වෙනත් පාරක් සම්පූර්ණයෙන්ම අදහස් වන අතර, ඊට ජාතික මහා මාර්ගයක්, අධිවේගී මාර්ගයක් සහ සීමිත ප්‍රවේශ මාර්ගයක් සහ එම පාර ගමන් කරන යම් පාලමක් හෝ බෝක්කුවක් අදහස් වේ ;

"සෑෂ් ගයිඩ්" යන්නෙන්, ලැප් සෑෂ් ආසන පටියේ ගාංචුව සවි කර ඇති යම් උපකරණයක් හෝ එවැනි පද්ධතියක් අදහස් වේ ;

"ආසන පටිය" යන්නෙන්, යම් වාහන අනතුරක දී හෝ ගැටීමක දී එහි ගමන් කරන මගීන් එම අනතුරින් වැළැක්වීම සඳහා නිර්මාණය කරන ලද පටි සවි කරන ආම්පන්න සවි කරන ගාංචු වෙනස් කිරීමේ උපකරණ සහ අවම වශයෙන් එක් උපකරණයක් ඇතුළත් පද්ධතියක් අදහස් වේ ;

"විශේෂ කාර්ය වාහනය" යන්නෙන්, කෘෂිකර්මය ඉදිකිරීම් හෝ භාණ්ඩ පැටවීම සහ බෑම යන කාර්ය සඳහා විශේෂයෙන් ඉදි කරන ලද යන්ත්‍රානුසාරයෙන් ක්‍රියා කරන වාහනයක් වේ;

"නවත්වන ස්ථානය" යන්නෙන්, මගීන්ට නැගීම හෝ බැසීම සඳහා යම් නීතියක් යටතේ දැක්වෙන බස් නවත්වන ස්ථානයක් අදහස් වේ ;

"පටිය" යන්නෙන්, නිවැරදි සහ සැප පහසු ලෙස පැළඳීම පහසු කිරීම සඳහා නිර්මාණය කරන ලද ආසන පටියක කොටසක් අදහස් වේ ;";

(31) "ට්‍රේලරය" යන්නෙහි අර්ථ නිරූපණයට ඉක්බිතිවම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් :—

"වාහනය" යන්නෙන්, යම් ආකාරයකින් ක්‍රියා කළ හැකි හෝ ඇදිය හැකි වුව ද, යම් ආකාරයකින් ක්‍රියා කිරීමට හෝ ඇදීමට නිර්මාණය කර ඇති ගමනාගමන ක්‍රමයක් අදහස් වන අතර, ඊට බයිසිකලයක් හෝ පැඩිල් සහිත වාහනයක් සහ ට්‍රේලරයක් සහ වාහනයක්, කරත්තයක්, කෝච් රථයක්, ට්‍රෑම් කාරයක් සහ යන්ත්‍රානුසාරයෙන් ක්‍රියාත්මක වන සහ /හෝ විදුලි බලයෙන් ක්‍රියාත්මක වන සහ /හෝ සූර්ය බලයෙන් ක්‍රියාක්මක වන හෝ ද්‍රව පැට්රෝලියම් වායුවෙන් ක්‍රියාක්මක වන හෝ විකල්ප ඉන්ධනවලින් ක්‍රියාත්මක වන වාහන සහ ගොඩබිම මත ප්‍රවාහන ක්‍රමයක් ලෙස භාවිත කරන හෝ භාවිත කිරීමේ හැකියාව ඇති යම් කෘත්‍රිම ගමනාගමන ක්‍රමයක් ඇතුළත් වන නමුත්, දුම්රියක් ඊට ඇතුළත් නොවේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 241 වන වගන්තිය සංශෝධනය කිරීම.

**72.** ප්‍රධාන ප්‍රඥප්තියේ 241 වන වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලබන අතර, එම උපවගන්ති එම වගන්තියේ (3), (4), (5), (6) සහ (7) වන උපවගන්ති ලෙස බලාත්මක විය යුතු ය :—

(3) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයේ දී අවස්ථාවෝචිත පරිදි, මෝටර් වාහනයක් නිෂ්පාදනය කිරීමේ, එකලස් කිරීමේ, සකස් කිරීමේ, අලුතින් නිර්මාණය කිරීමේ අනුවර්තනය කිරීමේ හෝ විකරණය කිරීමේ හෝ එහි නිර්මාණය වෙනස් කිරීමේ ව්‍යාපාරය පවත්වා ගෙන යන යම් තැනැත්තකු මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වී මාස තුනක් ඇතුළත කොමසාරිස්-ජනරාල්වරයා වෙත නියමිත ගාස්තුව සමග නියමිත ආකෘති පත්‍රයේ වූ ඉල්ලීමක් ඉදිරිපත් කරමින්, අවස්ථාවෝචිත පරිදි, මෝටර් වාහන නිෂ්පාදනය කිරීමේ, එකලස් කිරීමේ, සකස් කිරීමේ, අලුතින් නිර්මාණය කිරීමේ, අනුවර්තනය කිරීමේ, විකරණය කිරීමේ හෝ නිර්මාණය වෙනස් කිරීමේ ව්‍යාපාරය සඳහා කොමසාරිස්-ජනරාල්වරයාගේ ලිඛිත අනුමතිය ලබා ගත යුතු ය ;

(4) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වීමේ දිනයට පෙර, අවස්ථාවෝචිත පරිදි, මෝටර් වාහනයක් නිෂ්පාදනය කිරීමේ, එකලස් කිරීමේ, සකස් කිරීමේ, අලුතින් නිර්මාණය කිරීමේ, අනුවර්තනය කිරීමේ, විකරණය කිරීමේ හෝ නිර්මාණය වෙනස් කිරීමේ ව්‍යාපාරය පවත්වා ගෙන ගිය සහ එසේ නිෂ්පාදනය කරන ලද, එකලස් කරන ලද, සකස් කරන ලද, අලුතින් නිර්මාණය කරන ලද, විකරණය කරන ලද හෝ නිර්මාණය වෙනස් කරන ලද මෝටර් වාහනයක් ලියාපදිංචි කර නොමැති යම් තැනැත්තකු විසින් නියමිත ගාස්තුව සමග නියමිත ආකෘති පත්‍රයේ වූ ඉල්ලුම් පත්‍රයක් කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, මෝටර් වාහන නිෂ්පාදනය කිරීම, එකලස් කිරීම, සකස් කිරීම, අලුතින් නිර්මාණය කිරීම, අනුවර්තනය කිරීම, විකරණය කිරීම හෝ නිර්මාණය වෙනස් කිරීම සඳහා කොමසාරිස් ජනරාල්වරයාගේ ලිඛිත අනුමතිය ලබා ගත යුතු ය ;

(5) කොමසාරිස් ජනරාල්වරයා වෙත නියමිත ගාස්තුව සමග 3 වන හෝ 4 වන වගන්තිය යටතේ, නියමිත ආකෘති පත්‍රයේ වූ ඉල්ලුම් පත්‍රයක් ලැබුන විට ඔහු විසින්, අවස්ථාවෝචිත පරිදි, මෝටර් වාහනය නිෂ්පාදනය කිරීම, එකලස් කිරීම, සකස් කිරීම අලුතින් නිර්මාණය කිරීම, අනුවර්තනය කිරීම, විකරණය කිරීම, හෝ නිර්මාණය වෙනස් කිරීම සඳහා අනුමතිය ලබා දිය යුතු ය ;

(6) යම් ඉල්ලුම්කරුවකු මෝටර් වාහනයක් නිෂ්පාදනය කිරීමේ, එකලස් කිරීමේ, සකස් කිරීමේ, අලුතින් නිර්මාණය කිරීමේ, අනුවර්තනය කිරීමේ, විකරණය කිරීමේ හෝ නිර්මාණය වෙනස් කිරීමේ ව්‍යාපාරය —

(අ) නුසුදුසු හා සෑහීමට පත් නොවන ආකාරයකට ;

(ආ) එම වාහනයේ ආරක්ෂාව, මෝස්තරය හෝ නිර්මාණය පිළිබඳ ප්‍රමිතිය සම්බන්ධයෙන් හෝ එහි තත්ත්වය හෝ යම් උපකරණයක් සම්බන්ධයෙන් මේ පනතේ හෝ එය යටතේ සාදන ලද නියෝගයක විධිවිධානවලට අනුකූල නොවන ආකාරයට ; හෝ

(ඇ) මාර්ගයේ ආරක්ෂාවට හෝ අවට පරිසරයට අනතුරුදායක වන ආකාරයට,

පවත්වාගෙන යන බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන අවස්ථාවක ඔහු විසින් ලිඛිත දැන්වීමක් මගින් (1) වන උපවගන්තියේ සහ (2) වන උපවගන්තියේ සඳහන් ලිඛිත අනුමතිය ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබිය යුතු ය.

(7) මේ වගන්තිය යටතේ ලිඛිත අනුමතිය ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කරමින් කොමසාරිස් ජනරාල්වරයා විසින් ගනු ලබන තීරණයෙන් අතෘප්තියට පත් වන යම් තැනැත්තකුට එම ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම තමා වෙත ලැබී දින දාහතරක් ඇතුළත විනිශ්චය අධිකාරය වෙත ලිඛිතව අභියාචනයක් ඉදිරිපත් කළ හැකි අතර, එම අභියාචනයේ තීරණය අවසානාත්මක විය යුතු ය.”.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.